# වාරණ වාரணம்

"වාරණ/වාරණම්" ද්විභාෂිකව (සිංහල හා දමිළ) ශ්‍රී ලංකාවේ පළවන ප්‍රථම සොබාදහම පිළිබඳ සඟරාව
"வாரன/வாரணம்" இலங்கையில் முதன் முதலில் இரு மொழிகளில் (சிங்களம் மற்றும் தமிழ்) வெளியிடப்படும் இயற்கைசார் சஞ்சிகை
"Warana/Varanam" the First Bilingual (Sinhala and Tamil) Magazine on Nature to be publish in Sri Lanka

12 වෙළුම 2 සහ 3 වන කළාප මැයි සහ දෙසැම්බර් 2022
தொகுதி 12 எண் 2,3 வைகாசி ரூ மார்கழி 2022
Vol. 12 Issue 2 & 3 May & December 2022



ISSN 2235-9850
9 772235 985001

ශ්‍රී ලංකා වනසත්ව හා ස්වභාව ආරක්ෂක සංගමයේ ප්‍රකාශනයකි
இலங்கை வனவிலங்கு மற்றும் இயற்கைப் பாதுகாப்புச் சங்கத்தின் வெளியீடு
A Publication of the Wildlife & Nature Protection Society (WNPS) of Sri Lanka

www.wnpssl.org www.facebook.com/wnpssl twitter.com/wnpssl







# Responsible Banking
## in harmony with people and the planet

This publication is presented to you with the intention of revealing greater insights to Sri Lanka's rich biodiversity. Our earnest wish is that you may gain an even greater appreciation of the value of our biological resources and understand the role you could play in conserving and protecting this rich biodiversity.

ඉමහත් ජෛව විවිධත්වයකින් හෙබි රටක් වශයෙන් ශ්‍රී ලංකාවෙහි ජෛව සම්පත් පිළිබඳ අධ්‍යයනය කල හැකි කාරණා බොහෝය. දැනුමින් පිරිපුන් ලිපි නිකුතුවක් වන වාරණ සඟරාව ඔබ වෙත පිරිනැමීමේ අභිප්‍රායවන්නේ අපගේ මෙම ස්වභාදහමේ ඇති වැදගත්කම සහ එය රැක ගැනීමට අපට ගත හැකි පියවර කෙසේද යන්න තවත් විදසුත් ගෙනහැර පෑමටයි.

இலங்கையிலுள்ள செழுமையான பல்லுயிரினங்கள் தொடர்பான ஆழமான விடயங்களை வெளிக்கொணரவேண்டும் என்ற நோக்கத்துடன் இந்த சஞ்சிகை வெளியிடப்படுகின்றது. எமது உயிரியியல் வளங்களின் பெறுமதியை இன்னும் மகத்தான அளவில் போற்றி, செழுமைமிக்க இந்த பல்லுயிரினங்களை பேணுவதிலும், பாதுகாப்பதிலும் உங்களால் வகிக்கக்கூடிய பங்கினை தெளிவாக புரிந்துகொள்ள இது உதவவேண்டும் என்பதே எமது மனமார்ந்த ஆவலாகும்.

A Corporate Social Responsibility Initiative by Nations Trust Bank

Nations Trust Bank PLC - PQ118 Fitch Rating A(lka)
Nations Trust Bank is a licensed commercial bank supervised by the Central Bank of Sri Lanka

Nations TrustBank

# ශ්‍රී ලංකා වනසත්ව හා ස්වභාව ආරක්ෂක සංගමය

**(ස්ථාපනය 1894 මැයි 23 වන දින) 1968 අංක 29 දරණ පනතින් සංස්ථාපිතය**

**இலங்கை வனவிலங்கு மற்றும் இயற்கைப் பாதுகாப்புச் சங்கம்**
**(1968 ஆம் ஆண்டின் 29 வது இலக்க பாராளுமன்றச் சட்டத்தின் படி 1894 ஆம் ஆண்டு வைகாசி மாதம் 23 ஆம் திகதி ஸ்தாபிக்கப்பட்டது)**

# THE WILDLIFE AND NATURE PROTECTION SOCIETY OF SRI LANKA

(Established May 23,1894) Incorporated by Act of Parliament, No 29 of 1968

No. 86, Rajamalwatte Road, Battaramulla, Sri Lanka.
Tel: . +94 (0) 11 288 7390, 071 664 6664 | E: admin@wnpssl.org
www.wnpssl.org

## අරමුණ

- ස්වභාවික පරිසරයේ ඇති ශාක සහ සත්ව විශේෂ හා පරිසරයට අයත් සියලුම දේ වෙළෙඳ හෝ කුමන කටයුත්තක් සඳහා වත් එම පරිසරයෙන් වෙන් කිරීම වැළැක්වීම.
- පරිසරයට අයත් සංඝටක එනම් භූමිය, පස, ජලය, සත්ව හා ශාක, ජලජ පරිසරය ආදී සියලු දේ මතු පරපුර උදෙසා ආරක්ෂා කිරීම.
- ලංකාව තුළ ඇති අනෙකුත් පරිසර සංගම් හා පුද්ගලයින් සමග ක්‍රියකාරී එක්වීම සහ පරිසරය පිළිබඳ උනන්දු වන වෙනත් රටවල පරිසර සංවිධාන සමග කෙරෙන අධ්‍යාපනික හා පරීක්ෂණ ව්‍යාපෘති වලට සහයෝගය දැක්වීම.
- තවද නායකයන් සහ පරිසරය කෙරෙහි උනන්දුවන ක්‍රියකාරී පුද්ගලයන් සමග සම්බන්ධ වී වනෝද්‍යාන හා අභය භූමි ආදිය ස්ථාපිත කිරීම.
- පුද්ගලිකව පවත්වගෙන යන වන උද්‍යාන හෝ සත්ව උද්‍යාන ගැන සොයා බලා ඒවා පැවැත්මට අවශ්‍ය පියවර ගැනීම.
- වන සත්වයින් හා ස්වභාවික පරිසර ආරක්ශා කිරීමේ වැදගත්කම පිළිබඳ මහජනයා දැනුවත් කිරීම.
- තවද ඉහත කරුණු වලට අමතරව එම ඉලක්ක සපුරා ගැනීමේදී මතුවිය හැකි සියලු ගැටළු වලට අවශ්‍ය පියවර ගැනීම.

## நோக்கங்கள்

- தாவரங்கம் மற்றும் வன விலங்கு இனங்களை வர்த்தக நோக்கத்திற்காகப் பயன்படுத்துவதன் தீங்குகள் மற்றும் சேதங்களை தடுத்தல். இலங்கையில் வன விலங்குகளின் இயற்கை நிலைமை முழுமையாக மாற்றமடையாத வண்ணம் இயலுமானவரை பாதுகாத்தல்.
- நிலத்தோற்றம், மாண், நீர், தாவரம், விலங்குகள், சமுத்திர வாழ்விடங்கள் மற்றும் இயற்கையினை எதிர்கால சந்ததியினருக்காகப் பாதுகாத்தல் போன்ற எல்லா வழிகளிலும் இயற்கையினை பேணுவதற்கு ஒத்துழைப்பு வழங்குதல்.
- தனிநபர்கள் மற்றும் இலங்கையின் நிறுவனங்கள் மற்றும் ஏனைய நாடுகளுடன் இயற்கை பாதுகாப்பு தொடர்பான விடயங்களில் வினைத்திறனான ஒத்துழைப்பை வழங்குதல் மற்றும் வன விலங்க் தொடர்பான கற்கைகள் மற்றும் ஆய்வுகளுக்கு ஒத்துழைப்பினை வழங்குதல்.
- வன விலங்க் மற்றும் இயற்கை பாதுகாப்புத் தொடர்பான விடயங்களில் அரசு மற்றும் பொது நிறுவனங்களுடன் பேச்சுவார்த்தை மற்றும் ஒத்துழைப்பினை வழங்குதல். விசேடமாக தேசிய இயற்கை ஒதுங்கிடங்கள், சரணாலயங்கள் என்பவற்றைஸ்தாபித்தல் மற்றும் அவற்றின் நிர்வாகத்திற்கு உதவுதல்.
- தனியார் வன விலங்க் ஒத்துக்கிடங்கள் மற்றும் இயற்கை சரணாலயங்கள் வைத்திருத்தல் ஸ்தாபித்தல் மற்றும் நிர்வகித்தல்.
- இந்நாட்டினுடைய இயற்கை பாதுகாப்பு மற்றும் வனஜீவராசிகளின் முக்கியத்துவம் தொடர்பாக வெளியிடுதல்.
- மேலே குறிப்பிடப்பட்ட இலக்குகளுடன் தொடர்புடைய ஏனைய அனைத்து விடயங்களையும் அடைவதற்கு பொருத்தமான சகலநடவடிக்கைகளையும் எடுத்தல்.

## Objectives

- To prevent the destruction and harmful commercial exploitation of species of wild animals and plants, and wherever desirable and possible, to preserve wildlife intact in natural conditions in Sri Lanka.
- To assist in protecting nature in all its forms, such as land, soil, water, flora, fauna, marine habitats and conserve it for future generations.
- To co-operate actively with other persons and organizations in Sri Lanka and in other countries in the interests conservation of nature and to give support for study and research concerning wildlife.
- To negotiate and co-operate with the state and public bodies in the interests of wildlife and nature conservation, especially to establish and support national reserves and sanctuaries, and assist in their administration.
- To establish, administer and hold private wildlife sanctuaries and nature reserves.
- To publicise the importance of wildlife and conservation of nature in the country.
- To do all other things which seems to be incidental or conductive to the attainment of the above aims.

Chartered Accountant,
De Mel Building, Upper Chatham Street, Fort, Colombo 01

**ශ්‍රී ලංකා වනසත්ව හා ස්වභාව ආරක්ෂක සංගමය**

**இலங்கை வனவிலங்கு மற்றும் இயற்கைப் பாதுகாப்புச் சங்கம்**

**THE WILDLIFE AND NATURE PROTECTION SOCIETY OF SRI LANKA**

Tel: +94 (0) 11 288 7390, +94-71-664-6664 | E-mail: admin@wnpssl.org

www.wnpssl.org

https://www.facebook.com/wnpssl/  https://twitter.com/wnpssl

## නිලධාරී මණ්ඩලය

මැයි 2022

### විධායක සභාව செயற்குழு உறுப்பினர்கள Executive Committee Members

| | |
|---|---|
| **සභාපති தலைவர் President** | Mr. Jehan CanagaRetna |
| **උප සභාපතිවරු உப தலைவர்கள் Vice Presidents** | Ms. Zaineb Akbarally |
| | Mr. Dilshan Hettiaratchi |
| **ගරු ලේකම් கௌரவ. பொதுச்செயலாளர் Hon. General Secretary** | Mr. Graham Marshall |
| **ගරු උප ලේකම් கௌரவ. உப பொதுச்செயலாளர் Hon. Asst General Secretary** | Mr. G. Jeremy Godrick |
| **ගරු භාණ්ඩාගාරික கௌரவ. பொருளாளர் Hon. Treasurer** | Mr. Niran Mahawatte |

### කාරක සභාව பொதுக் குழு General Committee members

| | |
|---|---|
| Sriyan de Silva Wijeyeratne | Ms. Caryll Tozer |
| Dr. Nirmali de Silva | Ms. Devika Rohan Wijesinghe |
| Mr. Dev Wijewardane | Prof. Sampath Seneviratne |
| Prof. Sevvandi Jayakody | Dr. Chaturangi Wickramaratne |
| Mr. Maxime Wickremasinghe | Ms. Sashi Wijesiriwardane |
| Mr. Revan Weerasinghe | Mr. Keshan Perera |
| **හිටපු සභාපති உடன் முன்னாள் தலைவர் Immediate Past President** | Mr. Spencer Manuelpillai |
| **ගරු සංස්කාරක - වාරණ/වාරණම් සඟරාව கௌரவ. பதிப்பாசிரியர் - வாரண/ வாரணம் Hon. Editor - Warana/Waranam** | Mr. Sanjaya Weerakkody |
| **ගරු සංස්කාරක - ලෝරිස් සඟරාව கௌரவ. பதிப்பாசிரியர் - லோரிஸ் Hon. Editor - Loris** | Ms. Sarasi Wijeyeratne |

### ගරු ගිණුම් පරීක්ෂක கௌரவ. கணக்காய்வாளர்கள் Hon. Auditors

M/s. Tudor V. Perera & Company,
Chartered Accountants,
De Mel Building, Upper Chatham Street, Fort, Colombo 01.

# වාරණ வாரணம்

JOURNAL OF THE WILDLIFE AND NATURE PROTECTION SOCIETY OF SRI LANKA

වාරණ සඟරාවේ පලවන ලිපි අදහස් හුදෙක්ම කතෘවරුන්ගේ අදහස් වන අතර සෑමවිටම ශ්‍රී ලංකා වනසත්ව හා ස්වභාව ආරක්ෂක සංගමයේ අදහස් නොවේ.

இவ் “வாரணம்" சஞ்சிகையில் தெரிவிக்கப்பட்டுள்ள கருத்துக்கள் நூலாசிரியர்களுடையதாகும்இ மற்றும் அது இலங்கை வனவிலங்கு மற்றும் இயற்கை பாதுகாப்புச் சங்கத்தினது கருத்துக்களை அவசியம் பிரதிபலிப்பனவாக இல்லை

The views explained in ‘WARANA’ journal are those of the authors and do not necessarily reflect the view of the Wildlife & Nature Protection Society of Sri Lanka.

“වාරණ” යනු “හස්ති රාජයා”

**“வாரணம்” என்பது “கம்பீரமான யானை”**

“Warana” means “Majestic Elephant”

**12 වෙළුම 2 සහ 3 වන කළාප මැයි සහ දෙසැම්බර් 2022**

**தொகுதி 12 எண் 2,3 வைகாசி ரூ மார்கழி 2022**

Vol. 12 Issue 2 & 3 May & December 2022

**இதழாசிரியர் සංස්කාරක Editor**

Sanjaya Weerakkody

**இதழாசிரியர் உதவியாளர் සහකාර සංස්කාරක Assistant Editor**

Gaya Kandasamy, Sethil Muhandiram, Vimukthi Gunasekara, Piratheepa Sivakumar, Deluxeani Kugathasan

**சுரவை பார்ப்பு සෝදුපත් කියවීම Proof Readers**

Vimukthi Gunasekara, Piratheepa Sivakumar

**மொழிபெயர்ப்பாளர்கள் පරිවර්තකවරු Translators**

Piratheepa Sivakumar

**அட்டைப்பட புகைப்படம் මුල් කවරයේ ඡායාරූපය Front Cover Picture**

*Chilobrachys jonitriantisvansickeli is the second species of Chilobrachys to be discovered from Sri Lanka after 126 years. The species is found in a heavily fragmented forest patch in the wet zone of the country.*

Image courtesy – Ranil Nanayakkara

**பிற்பக்க புகைப்படம் පසු කවරයේ ඡායාරූපය Back Cover Picture**

*An evening in Kaudulla national park with this majestic creature named as tusker Abhaya.*

Image courtesy - Toshan Wijeratne

**பக்க வடிவமைப்பு மற்றும் அச்சுப்புதிவு පිටු සැකසුම් හා මුද්‍රණය**

**Page Layout and Printed by**

Optima Designs (Pvt) Ltd.

64A 2/1, Ananda Coomaraswamy Mawatha, Colombo 3

**வெளியீடு ප්‍රකාශනය Published by**

The views explained in ‘WARANA/WARANAM’ journal are those of the authors and do not necessarily reflect the view of the Wildlife & Nature Protection Society of Sri Lanka

No. 86, Rajamalwatte Road, Battaramulla, Sri Lanka.

Tele. +94(0) 11 288 7390

E-mail : admin@wnpssl.org

## පටුන / உள்ளடக்கம் / Contents

**6/** සංස්කාරක සටහන ஆசிரியர் குறிப்பு Editor’s Note

**8/** පහළ කළු ගං මිටියාවතේ ජෛව විවිධත්ව පාරාදීසය - රිච්මන්ඩ් කාසල් වතුයාය
විහංගා අමරකෝන්

**10/** இலங்கைக் கடற்பாசிகளும் அவற்றின் முக்கியத்துவமும்
-சயந்தவி சதாசிவமூர்த்திஇ கபிலன் இரங்கநாதன்

**12/** බටදඬු කඳුවැටිය
උදය චානක

**22/** ගසක් කථා කරයි
වීණාවී සිල්වා

**23/** கடற்பஞ்சுகள் (Marine sponges)- ரமேஸ்குமார் நிரூஜன், துளசிதா வில்லியம் சாந்தகுமார்

**26/** පරාගනය සඳහා ඕකිඩ් දක්වන අනුවර්ථන
-ඉමදුව ප්‍රියදර්ශන

**28/** *Oryza rhizomatis*-
இலங்கைக்கு உரிய காட்டு நெல்லினம் விருத்தி செய்யப்பட்ட புதிய நெல் வர்க்கங்களை உருவாக்குவதில் அதன் சிறப்பியல்பு
கலாநிதி (திருமதி) கௌரி ராஜ்குமார்

**30/** මොකද්ද මේ රැම්සාර් තෙත්බිමක් කියන්නේ ?
යොහාන් චන්ද්‍රසේකරන්

**32/** කොටි ගැන නවමු කථා ගොන්නක් සඟවා ගත් කුරුළු පාරාදීසය කුමන
සඳමල් රශ්මී. ශ්‍රී. බුද්ධික

**35/** බලි රූපවල අඹා ඇති සත්ත්වයින් සහ කල්පිත සතුන්
ගයාන් මිත්‍ර විදිරිසිංහ

**37/** ශ්‍රී ලංකා වනසත්ව හා ස්වභාව ආරක්ශක සංගමය
වසරක මතක සටහන්

# අනුග්‍රාහක පණිවුඩය
# அனுசரணையாளரின் செய்தி
# Message from Sponsor



**හේමන්ත ගුණතිලක**
අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී
නේෂන්ස් ට්‍රස්ට් බැංකුව

**ஹேமந்த குணதிலக**
நிர்வாகஸ்தர்
நே'ன்ஸ் டிரஸ்ட் வங்கி

**Hemantha Gunetilleke**
Director/CEO
Nations Trust Bank

**පාරිසරික පද්ධතිවලට නව ජීවිතයක් ලබාදුන් දශකයක්**

කාලාන්තරයක් මුළුල්ලේ මිනිසා විසින්ම සොබාදහමට කළ අහිතකර බලපෑම්වලින් මිදීමට, අද වනවිට මිනිසාටත් සොබාදහමටත් සිදුවී ඇත. පසුගිය වසරේ එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින්, ඉදිරි වසර දහය ලෝක පරිසර පද්ධති යළි නගාසිටුවීමේ සහ ප්‍රකෘතිමත් කිරීමේ දශකයක් ලෙස ප්‍රකාශයට පත්කළේ මෙම ගෝලීය අවශ්‍යතාව මනාව තේරුම්ගත් නිසාය. මෙය විනාශයට ලක්වූ පාරිසරික පද්ධති ප්‍රකෘතිමත් වීමට පමණක් නොව, තවමත් අහිතකර බලපෑමට ලක්නොවූ පාරිසරික පද්ධති ආරක්ෂා කිරීමට ද ගෝලීය ප්‍රජාවට සිහිපත් කරන අතිශය වැදගත් - කාලීන පියවරකි. අග්‍රගණ්‍ය පාරිසරික පද්ධති මෙන්ම මිනිසා ද එකිනෙකට සමාන්තර ගමන් පථවල ධාවනය වේ.

වසර ගණනාවක් පුරා සොබාදහම නොතකා කටයුතු කළ මිනිසාගේ ක්‍රියාකලාපය නිසා, මිනිසාට හිතකර පාරිසරික පද්ධතීන් අද වනවිට මුහුණ පා ඇති තත්ත්වය අතිශය ශෝචනීය ය. වනාන්තර, කඳු පන්ති, සාගර සහ ගංගා ඇල දොළ, ගොවිබිම් සහ නාගරික පාරිසරික පද්ධති, අපට හුස්ම ගැනීමට අවශ්‍ය ඔක්සිජන් ද, අපේ පරිභෝජනය සඳහා කෘෂි වගාව ද ජීවත්වීමට අවකාශය නිර්මාණය කරන පාරිසරික පද්ධතිද අද වනවිට ඉමහත් තර්ජනයට ලක්ව ඇත. සංවර්ධනය කරා මිනිසා යන ගමනට මග පාදා ඇත්තේ වන විනාශය මතින් වන අතර, විවිධාකාර හා පරිසරයට අහිතකර ලෙස ක්‍රියාත්මක කරන කෘෂිකාර්මික පිළිවෙත් මගින් මහ පොළවේ ජීවගුණය නැති වී ඇත. ප්ලාස්ටික් අපද්‍රව්‍ය හා රසායනික මගින් වන දූෂණය, සාගර දූෂණයටත් කැස්බෑවන් සහ කකුළුවන් වැනි මුහුදු ජීවීන්ගේ පැවැත්මටත් දරුණු ලෙස හානිකර ඇත. දේශගුණික විපර්යාස නිසා ලැව්ගිනි ඇතිවන අතර සාගරයේ කොරල්පරවලටද ඉන් ඇතිවන හානිය සුළුපටු නොවේ.

ලෝක ජනගහනයෙන් අඩකට වඩා වැඩි ප්‍රමාණයක් ජීවත්වන්නේ - මිනිසා විසින්ම පාරිසරික පද්ධති විනාශකර ඉදිකළ නාගරික ප්‍රදේශවල වන අතර, කර්මාන්තවලින් සහ නිවාසවලින් බැහැරකරන අපද්‍රව්‍ය සොබාදහමට කරන හානිය සුළුකොට තැකිය නොහැක. මිනිසා භෞතිකව දියුණු වනවිට ස්වභාවධර්මයට එල්ලවන අහිතකර බලපෑමෙන් මුදවා යළි සොබාදහම යථා තත්ත්වයට පත්කිරීමට නම්, ලෝකයේ පාරිසරික පද්ධති රැකගෙන සංරක්ෂණය කළයුතුය. සොබාදහමට යළිත් ජීවයක් ලබාදීම, ප්‍රමුඛ කාලීන අවශ්‍යතාවකි.

පාරිසරික ක්ෂේත්‍රයේ විශේෂඥයන්ගේ ගණන් බැලීම්වලට අනුව, වර්තමානයේ සිට 2030 වසර අතර කාලය තුළ, හෙක්ටයාර මිලියන 350ක විනාශ වූ භූමි හා ජලජ පරිසර පද්ධති යළි ස්ථාපනය කිරීමෙන් - පාරිසරික පද්ධති සේවා සඳහා ඇමෙරිකානු ඩොලර් ට්‍රිලියනය 9ක් උපයාගත හැකිය. පාරිසරික ප්‍රතිසංස්කරණය මගින් හරිතාගාර වායු ගිගාටොන් 13 සිට 26 දක්වා ප්‍රමාණයක් අපේ වායුගෝලයෙන් ඉවත් කළහැකිය. එවැනි මැදිහත්වීම්වල ආර්ථික ප්‍රයෝජන පිරිවැය මෙන් නව ගුණයකටත් වඩා වැඩි අතර, එවැනි මැදිහත්වීමක් නොකර - ඒ ගැන නොසලකා සිටීමේ අහිතකර පිරිවැය, පාරිසරික පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම මෙන් අවම වශයෙන් තුන් ගුණයකි.

මෙම ගෝලීය ප්‍රයත්නයට ශ්‍රී ලංකාවේ දායකත්වය ලබාදෙන්නේ, 2015 වසරේ පැරිස් ගිවිසුම යටතේ ය. ඒ අනුව, විනාශ වූ වනාන්තර යළි වගාකිරීමෙන් සහ අතහැර දැමූ ඉඩම් යළි වනවගාවට යොමුකිරීම මගින්, රටේ වනගහණය සියයට දෙකකින් වැඩිකිරීමට ඒ යටතේ ශ්‍රී ලංකාව කටයුතු කරයි. මේ සඳහා දළ වශයෙන් හෙක්ටයාර් 130,000ක් ප්‍රතිසංස්කරණය කිරීම හෝ නැවත වන වගාකිරීම අවශ්‍ය වේ. එහෙත්, වනාන්තර නොවන ඉඩම් කළමනාකරණය වනසංරක්ෂණ දෙපාර්තමේන්තුවේ විෂයපථයෙන් ඉවත්කර, ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත පැවරීමට ගත් තීරණය නිසා, ශ්‍රී ලංකාවේ මෙම ප්‍රතිඥාවේ වලංගු බව ප්‍රශ්නාර්ථයක් වී ඇත. එය, වසරකට හෙක්ටයාර් 7,700 ක පමණ වන හානියක් වන මූලික මට්ටමටත් වඩා සියයට පහකින් සහ ඉන් ඔබ්බටත් - සමස්ත වන ආවරණය අහිමිවීමට බලපාන පියවරකි. පාරිසරික පද්ධති සුරැකීමට වහවහා යුහුසුළු නොවීමෙන්, මානව සෞඛ්‍යයට, ආහාර සුරක්ෂිතතාවට සහ සමස්ත මානව ආරක්ෂාවට වන්දි ගෙවීමට සිදුවන තත්තවයක් උදාවෙන බවට පරිසර සංරක්ෂණවේදීන් අනතුරු අඟවා ඇත.

නේෂන්ස් ට්‍රස්ට් බැංකුව, පසුගිය වසර හය තුළ, වනසත්ව සහ සොබාව ආරක්ෂක සංගමය (WNPS) සමග සම්බන්ධ වීම සහ එහි සොබාදහම

රැකගැනීමේ සංරක්ෂණ ප්‍රයත්නයන්ට සහායවීමට හැකිවීම ගැන අතිශය සතුටට පත්ව සිටී. සමාජ ව්‍යාපෘති සඳහා අඛණ්ඩව සහය දැක්වීමට මෙන්ම ලෝරිස්, වාරණ වාරණම් සඟරාවලට පූර්ණ අනුග්‍රහය දැක්වීමටත්, නේෂන්ස් ට්‍රස්ට් - WNPS මාසික දේශන මාලාව සංවිධානය කිරීමටත් ලද අවස්ථාව බැංකුවත් බැංකුව හා සම්බන්ධ පාර්ශවකරුවනුත් සළකන්නේ ඔවුන් වෙත ලද ඉමහත් ගෞරවයක් ලෙසිනි. මෙම සාමූහික ප්‍රයත්න, වන සංරක්ෂණය ගැන තව තවත් දැනුවත්වීමට අවස්ථාව උදාකරන අතරම, ජනතාවගේ පාරිසරික විඥානය හා සාක්ෂරතාව ඉහළ නැංවීමටත් - ඒ පිළිබඳ උනන්දුවන සමාන අදහස් ඇති පුද්ගලයන් ඒකරාශි කර වඩාත් ඵලදායී සංවාදයක් ඇතිකිරීමට මනා වේදිකාවක් නිර්මාණය කර ඇත.

මේ පිළිබඳ ජාතික සැලැස්මක් සකස් කිරීම, රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදකයින් සමඟ සහයෝග යෙන් කටයුතු කිරීම සහ උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්මක් ක්‍රියාත්මක කිරීම සඳහා, වනසත්ව සහ සොබාව ආරක්ෂක සංගමය (WNPS) ඉදිරියට ඒමට සුදුසුම මොහොත මෙය බව නේෂන්ස් ට්‍රස්ට් බැංකුව විශ්වාස කරයි.

**சுற்றுச்சூழல் மறுசீரமைப்பிற்கான ஒரு தசாப்தம்**

இயற்கையை சீரழிவிற்கு இட்டுச்செல்லும் மனிதனின் செயற்பாடுகள் துரித கதியில் அதிகரித்து வரும் நிலையில், ஐ. நா வானது அடுத்து வரும் பத்து ஆண்டுகளை உலகின் சுற்றுச்சூழல் மறுசீரமைப்பு மற்றும் மீட்சிற்கான தசாப்தமாக கடந்த வருடம் அறிவித்தது. எமக்கு தேவையான ஓட்சிசன், உணவு மற்றும் வாழ்விடம் போன்றவற்றை வழங்கும் காடுகள், மலைகள், பெருங்கடல்கள், நன்னீர் நிலைகள், மற்றும் விவசாய நிலங்கள் என்பன பருவநிலை மாற்றம், காட்டுத்தீ, காடழிப்பு மற்றும் இரசாயன உரப்பாவனை போன்றவற்றால் அச்சுறுத்தலுக்கு உள்ளாக்கப்பட்டுள்ளன. சுற்றுச்சூழலைக் பாதுகாக்க தற்போது செயற்படாமல் இருப்பது, மனித ஆரோக்கியம், உணவுப் பாதுகாப்பு மற்றும் ஒட்டுமொத்த மனித குலத்திற்கே ஆபத்தானது என்று இயற்கை ஆர்வலர்கள் எச்சரித்துள்ளனர்.

2022 இலிருந்து 2030 ற்கு இடையில் 350 மில்லியன் ஹெக்டேர் சிதைந்த நிலப்பரப்பு மற்றும் நீர்வாழ் சுற்றுச்சூழலை மறுசீரமைப்பதன் (restoration) மூலம் US$9 டிரில்லியனிற்கு சமனான சுற்றுச்சூழல் சேவைகளை பெற்றுக்கொள்ளவும் மற்றும் வளிமண்டலத்திலிருந்து 13 முதல் 26 ஜிகாடன் பச்சை வீட்டு வாயுக்களை அகற்றவும் முடியும். இவ்வகையான திட்டங்களை முன்னெடுப்பதன் மூலம் கிடைக்கப்பெறும் பொருளாதார நன்மைகளின் பெறுமதியானது முதலீட்டுச்செலவை விட ஒன்பது மடங்கு அதிகமாகும். அதேசமயம் எந்த நடவடிக்கையும் எடுக்காதிருத்தல் சுற்றுச்சூழலை மறுசீரமைப்பதற்கு ஏற்படும் செலவை விட அண்ணளவாக மூன்று மடங்கு அதிக செலவை உருவாக்கும்.

நேஷன்ஸ் டிரஸ்ட் வங்கி (Nations Trust Bank) கடந்த ஆறு ஆண்டுகளாக வனவிலங்கு மற்றும் இயற்கை பாதுகாப்புச்சங்கத்தோடு (Wildlife and Nature Protection Society) இணைந்து இயற்கையை பாதுகாக்கும் முயற்சிகளிற்கு உதவுவதில் மிகவும் மகிழ்ச்சி கொள்கிறது. தொடர்ந்தும் சங்கத்தின் முயற்சிகளிற்கு ஆதரவளிப்பதற்கும், லோரிஸ், வாரண மற்றும் வாரணம் இதழ்கள் மற்றும் வனவிலங்கு மற்றும் இயற்கைப் பாதுகாப்புச்சங்கத்தின் மாதாந்த விரிவுரைத் தொடரிற்கு முழு அனுசரணை வழங்குவதிலும் நேஷன்ஸ் டிரஸ்ட் வங்கி மற்றும் அதன் பங்குதாரர்கள் பெருமை கொள்கிறார்கள்.

**இழப்புக்களிலிருந்து மீண்டெழுதல்**

நாட்டின் பொருளாதார பேரழிவானது குடிமக்களின் வாழ்க்கையில் பாரிய தாக்கம் செலுத்துகின்றது. ஆண்டு தோறும் பணவீக்கம் 70 சதவீதத்தை நெருங்குவதுடன் உணவு பணவீக்கமும் 95 சதவீதமாக உயர்ந்துள்ளது. மக்கள் மீதான தாக்கம் ஓரளவு அளவிடக்கூடியதாக இருந்தாலும் உயிர்ப்பல்வகைமை மற்றும் சுற்றுச்சூழல் பாதிப்புகள் பற்றிய உறுதியான தரவு எதுவும் இல்லை. ஊடகங்களின் தகவலிற்கு இணங்க, எரிபொருள் விநியோகம் மற்றும் வனவிலங்கு பூங்காக்களிற்கு வருகை தரும் உல்லாச பயணிகளின் அல்லது பார்வையாளர்களின் எண்ணிக்கை குறைவின் காரணமாக ஏற்பட்ட வருமான வீழ்ச்சியினால் வனவிலங்குப் பாதுகாப்புத் திணைக்களத்தின் (DWC) அதிகாரிகளால் வழக்கமான ரோந்துப் பணியை மேற்கொள்ள முடிவதில்லை.

மேலும், செயற்கை உரக் கொள்கையின் தோல்வியானது முன்னோடியில்லாத பொருளாதார நெருக்கடிக்கான அடிப்படைக் காரணங்களில் ஒன்றாகும். உள்நாட்டு விவசாய உற்பத்தியில் ஏற்படும் வீழ்ச்சியினால், மனிதனும் விலங்குகளும் அரிதான உணவு வளங்களுக்காக நேருக்கு நேர் போட்டியிட நேரிடும் மற்றும் மனித-யானை மோதலில் அதிக சேதம் ஏற்படவும் வாய்ப்புக்கள் அதிகமுண்டு. மிருகங்களைச் கட்டுப்படுத்த விவசாயிகளுக்கு துப்பாக்கிகளை வழங்குவதுடன் அவை நீண்டகாலமாக பகுப்பாய்வு செய்யாமலேயே பயன்படுத்தப்படுகின்றது. இதனால் மிருகங்களை வேட்டையாடும் வாய்ப்புக்கள் அதிகரிக்கலாம்.

தொடர்ந்து வரும் வாழ்வாதார இழப்பு மற்றும் உணவுப் பாதுகாப்பின்மை ஆகியவற்றின் தாக்கத்தினாலும் வருமானம் ஈட்டுதல் மற்றும் விலங்குப்புரதத்தை உள்ளெடுத்தல் போன்ற தேவைகளுக்காகவும் மக்கள் அதிகளவில் விலங்கு இறைச்சி வியாபாரத்தினை நாடுகின்றார்கள். சிறுத்தை போன்ற அழிந்து வரும் விலங்குகள் கண்ணியில் சிக்கி உயிரிழப்பதற்கு இதுவே முக்கிய காரணம் என்று சந்தேகிக்கப்படுகிறது. ஆனால், மாற்று புரத மூலங்களைத் தேடுவது ஆபத்துக்களைத் தவிர்க்க உதவும். நாட்டின் விலங்கு புரத உட்கொள்ளலில் மீன் சுமார் 50 சதவீதத்தை கொண்டுள்ளது என்று உலக வங்கி எடுத்துக்காட்டுகிறது, இது உலக சராசரியை விட மூன்று மடங்கு அதிகமாகும்.

பழைய தோல்வியுற்ற பாதையில் பயணித்து புதிய முடிவுகளை எதிர் பார்க்க முடியாது. நாட்டின் கடன் சுமையை எதிர்கொள்ளவும் சுற்றுச்சூழல் பேரழிவுகளை முடிந்தவரை தவிர்க்கவும் சரியான புதிய கையாள வேண்டும்.

# සංස්කාරක සටහන
# ஆசிரியர் குறிப்பு
# Editor's Note

**වනජීවී සංරක්ෂණයේ අභියෝග ජය ගැනීම**

ශ්‍රී ලංකා වනසත්ව හා ස්වභාව ආරක්ෂක සංගමය (WNPS) විසින් ප්‍රකාශයට පත් කරන ලද වාරණ/වාරණම් සඟරාවේ නවතම සංස්කරණය වෙත සාදරයෙන් පිළිගනිමු. සුපුරුදු පරිදි වනජීවී සංරක්ෂණයට සම්බන්ධ ලිපි ඔබ වෙත ගෙන ඒම පිළිබඳව අපි ආඩම්බර වෙමු.

ශ්‍රී ලංකාව ජෛව විවිධත්වයෙන් පොහොසත් වුවද එය ආරක්ෂා කර ගැනීමේදී අප මුහුණ දෙන දැවැන්ත අභියෝග රාශියක් තිබේ. වාසස්ථාන විනාශයේ සිට දඩයම් කිරීම සහ නීති විරෝධී ජාවාරම් දක්වා වනජීවී විශේෂවල පැවැත්මට බොහෝ තර්ජන තිබේ. නමුත් මෙම අභියෝග මධ්‍යයේ වුවද සංරක්ෂණය පිළිබඳව බලාපොරොත්තුවක් තබාගත හැකිද? අධ්‍යාපනය, දැනුවත් කිරීම් සහ ප්‍රජා සහභාගීත්වය තුළින්, මෙම තර්ජන ජය ගැනීමට සහ ශ්‍රී ලංකාවේ වන ජීවීන් සඳහා තිරසාර අනාගතයක් නිර්මාණය කිරීමට අපට එක්ව ක්‍රියාකල හැකිය.

අප මුහුණ දෙන ප්‍රධාන අභියෝගයක් වන්නේ වාසස්ථාන අහිමි වීමයි. ශ්‍රී ලංකාවේ ජනගහන වර්ධනය සහ සංවර්ධනය අඛණ්ඩව සිදු වන විට, ස්වභාවික වාසස්ථාන ඉතා සීඝ්‍රයෙන් විනාශ වෙමින් පවතී. මෙය වන සතුන්ට පමණක් නොව ස්වභාවධර්මය විසින් සපයන පිරිසිදු ජලය සහ වාතය වැනි සේවාවන්ටද බලපායි. මෙම අභියෝගය ජය ගැනීම සඳහා ස්වභාවික වාසස්ථාන ආරක්ෂා කර නැවත යථා තත්ත්වයට පත් කිරීමට අප එක්ව කටයුතු කළ යුතුය. මෙයට තිරසාර ඉඩම් පරිහරණ පිළිවෙත්වලට සහාය වීම, නැවත වන වගාව සහ වාසස්ථාන ප්‍රතිෂ්ඨාපනය ප්‍රවර්ධනය කිරීම සහ විදුලි වැටවල් සහ අනෙකුත් මාරාන්තික නොවන වැළැක්වීම් වැනි ක්‍රියාමාර්ග හරහා මිනිස්-වනජීවී ගැටුම් අවම කිරීම ඇතුළත් වේ.

තවත් ප්‍රධාන අභියෝගයක් වන්නේ දඩයම් කිරීම සහ වන ජීවී ජාවාරමයි. නීතිවිරෝධී වනජීවී වෙළඳාම විවිධ ක්‍රම ඔස්සේ ක්‍රියාත්මක වන අතර ශ්‍රී ලංකාවේද යම්තාක් දුරකට ක්‍රියාත්මක බවට සාක්ෂි තිබේ. දඩයම් කිරීම සහ ජාවාරම එක් එක් විශේෂවල පැවැත්මට තර්ජනයක් පමණක් නොව පරිසර පද්ධතිවල සමස්ත සෞඛ්‍යයට ද හානි කරයි. මෙම අභියෝගයට එරෙහිව සටන් කිරීම සඳහා, අපි බලාත්මක කිරීමේ උත්සාහයන් වැඩි කළ යුතු අතර වනජීවී අපරාධ සඳහා දඬුවම් ශක්තිමත් කළ යුතුය. වන සතුන් ආරක්ෂා කිරීමේ වැදගත්කම සහ නීතිවිරෝධී වනජීවී වෙළඳාමේ නිරත වීමේ දරුණු ප්‍රතිවිපාක පිළිබඳව ද අප දැනුවත් කළ යුතුය.

අවසාන වශයෙන්, අපි මෙම අභියෝගවලට මූලික හේතු සොයා බැලිය යුතුය. මෙයින් අදහස් කරන්නේ දරිද්‍රතාවය අවම කිරීම, තිරසාර ජීවනෝපායන් ප්‍රවර්ධනය කිරීම සහ ආර්ථික සංවර්ධනය පාරිසරික ආරක්ෂාව සමඟ සමතුලිත බව සහතික කිරීම සඳහා ක්‍රියා කිරීමයි. WNPS හි අපි විශ්වාස කරන්නේ එක්ව වැඩ කිරීමෙන් මෙම අභියෝග ජයගෙන ශ්‍රී ලංකාවේ වන ජීවීන් සඳහා සුරක්ෂිත හෙට දවසක් නිර්මාණය කළ හැකි බවයි. සංරක්ෂණ සංවිධාන, පර්යේෂකයන් සහ ප්‍රාදේශීය ප්‍රජාවන් ශ්‍රී ලංකාවේ ස්වභාවික උරුමයන් ආරක්ෂා කිරීමට දරන ප්‍රයත්නයන්ට සහාය වීමට අපි කැපවී සිටින අතර ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය සුරැකීමේ අභියෝගාත්මක කාර්යයට අත්වැල් බැඳගන්නා ලෙස අප ඔබ සැමට ආරාධනා කරමු.

සංස්කාරක
වාරණ/වාරණම්

வாரணா/வாரணம் இன் சமீபத்திய பதிப்பிற்கு வரவேற்கிறோம், இது வனவிலங்கு மற்றும் இயற்கை பாதுகாப்பு சங்கத்தால் (ஞுளேஎ) வெளியிடப்படுகின்றது. எப்போதும் போல, வனவிலங்கு பாதுகாப்பு தொடர்பான கட்டுரைகளை உங்களிடம் கொண்டு வருவதில் பெருமிதம் கொள்கிறோம்.

இலங்கையின் வளமான உயிர்ப்பல்வகைமையினை பாதுகாப்பதில் நாம் எதிர்கொள்ளும் பாரிய சவால்கள் இவை. வாழ்விடம் அழிக்கப்படல் மற்றும் வேட்டையாடுதலும் கடத்தலும் வரை, இலங்கையின் தனித்துவமான வனவிலங்குகளின் உயிர்வாழ்வதற்கான பல அச்சுறுத்தல்கள் உள்ளன.

ஆனால் இந்த சவால்கள் இருந்தபோதிலும், அங்கே நம்பிக்கை உள்ளது. கல்வி, விழிப்புணர்வை ஏற்படுத்தல் மற்றும் சமூக ஈடுபாடு ஆகியவற்றின் மூலம், இந்த அச்சுறுத்தல்களை முறியடிப்பதற்கும், இலங்கையின் வனவிலங்குகளுக்கு நிலையான எதிர்காலத்தை உருவாக்குவதற்கும் நாம் ஒன்றிணைந்து செயல்பட முடியும்.

நாம் எதிர்கொள்ளும் முக்கிய சவால்களில் ஒன்று வாழ்விட இழப்பு. இலங்கையின் சனத்தொகை வளர்ச்சி மற்றும் அபிவிருத்தி தொடர்வதால், இயற்கை வாழ்விடங்கள் ஆபத்தான விகிதத்தில் அழிக்கப்படுகின்றன. இது வனவிலங்குகளை மட்டுமல்ல, இயற்கை வழங்கும் சுத்தமான நீர் மற்றும் காற்று போன்ற சேவைகளையும் பாதிக்கிறது. இந்தச் சவாலை முறியடிக்க, இயற்கையான வாழ்விடங்களைப் பாதுகாக்கவும் மீட்டெடுக்கவும் நாம் ஒன்றிணைந்து செயல்பட வேண்டிய தேவை ஏற்பட்டுள்ளது. நிலையான நில பயன்பாட்டு நடைமுறைகளை ஆதரிப்பது, காடுகளை வளர்ப்பது மற்றும் வாழ்விட மறுசீரமைப்பை ஊக்குவித்தல் மற்றும் மின்சார வேலி மற்றும் பிற மரணம் அல்லாத தடுப்புகள்

போன்ற நடவடிக்கைகள் மூலம் மனித-வனவிலங்கு மோதலைக் குறைப்பது ஆகியவை இதில் அடங்கும்.

மற்றொரு பெரிய சவால் வேட்டையாடுதல் மற்றும் கடத்தல். சட்டவிரோதமான வனவிலங்கு வர்த்தகம் பல வழிகளில் செயற்படுகின்றது. இலங்கை அதன் விளைவுகளிலிருந்து விடுபடவில்லை. வேட்டையாடுதல் மற்றும் கடத்தல் ஆகியவை தனிப்பட்ட உயிரினங்களின் உயிர்வாழ்வை அச்சுறுத்துவது மட்டுமல்லாமல் சுற்றுச்சூழல் அமைப்புகளின் ஒட்டுமொத்த ஆரோக்கியத்தையும் குறைமதிப்பிற்கு உட்படுத்துகின்றன. இந்த சவாலை எதிர்கொள்ள, அமுலாக்க முயற்சிகளை அதிகரிக்க வேண்டும் மற்றும் வனவிலங்கு குற்றங்களுக்கான தண்டனைகளை வலுப்படுத்த வேண்டும். வனவிலங்குகளை பாதுகாப்பதன் முக்கியத்துவம் மற்றும் சட்டவிரோத வனவிலங்கு வர்த்தகத்தில் ஈடுபடுவதால் ஏற்படும் கடுமையான விளைவுகள் குறித்தும் விழிப்புணர்வு ஏற்படுத்த வேண்டும்.

இறுதியாக, இந்த சவால்களுக்கான மூல காரணங்களை நாம் கவனிக்க வேண்டும். வறுமையைக் குறைப்பதற்கும், நிலையான வாழ்வாதாரத்தை மேம்படுத்துவதற்கும், சுற்றுச்சூழல் பாதுகாப்போடு பொருளாதார மேம்பாடு சமநிலையில் இருப்பதை உறுதி செய்வதற்கும் நாம் வேலை செய்யவேண்டும் என்பதே. WNPS இல், நாம் ஒன்றிணைந்து செயற்படுவதன் மூலம், இந்த சவால்களை முறியடித்து இலங்கையின் வனவிலங்குகளுக்கு பிரகாசமான எதிர்காலத்தை உருவாக்க முடியும் என்று நாங்கள் நம்புகிறோம். இலங்கையின் இயற்கை பாரம்பரியத்தைப் பாதுகாப்பதற்கான அவர்களின் முயற்சிகளில் பாதுகாப்பு அமைப்புகள், ஆராய்ச்சியாளர்கள் மற்றும் உள்ளூர் சமூகங்களின் முயற்சிகளுக்கு ஆதரவளிக்க நாங்கள் கடமைப்பட்டுள்ளோம். வாரணா/வாரணம் இதழின் ஆசிரியர் என்ற வகையில், இலங்கையின் பன்முகத்தன்மை வாய்ந்த பல்லுயிரியலைப் பாதுகாக்கும் சவாலான பணியில் கைகோர்க்குமாறு உங்கள் அனைவருக்கும் எனது அழைப்பை விடுக்கிறேன்.

இதழாசிரியர்
வாரணா/வாரணம்

# පහළ කළු ගං මිටියාවතේ ජෛව විවිධත්ව පාරාදීසය-රිච්මන්ඩ් කාසල් වතුයාය

- විහංගා අමරකෝන් -



රූපය 01: රිච්මන්ඩ් කාසල් වතුයාය
Source: https://en.wikipedia.org/wiki/File:Richmond_Castle_Kalutara.jpg



රූපය 02: *Apis* sp. මීමැස්සන්

ඇල්බට් අයින්ස්ටයින් පැවසූ ආකාරයට නිර්මාණශීලීත්වය යනු අනෙකා දකින දේ එලෙසම දැකීමත් ඒ පිළිබඳව කිසිවෙකු නොසිතූ ලෙස සිතීමත්ය. එවන් අද්විතීය මනසක් තිබූ ශ්‍රී ලාංකිකයෙකු විසින් ගොඩනංවන ලද මහා නිර්මාණයක් කළුතර ප්‍රදේශයේ පිහිටා ඇති බව ඔබ දැන නොසිටියා වන්නට ඇත. එය නම් Richmond Castle හෙවත් රිචමන්ඩ් මන්දිරයයි.පළාතොට ප්‍රදේශයේ කළු ගඟට මායිම්ව, කළුතර නගරයේ සිට කි.මී. 2 ක පමණ දුරින් පිහිටි මනරම් කඳු ගැටයක් මත පිහිටා ඇති මෙම දැවැන්ත මන්දිරය, 1900-1910 සමයේදී ඉදිවූවක් බව සැලකේ. දොන් ආතර් ද සිල්වා විජේසිංහ සිරිවර්ධන පඩිකාර මුදලිතුමන් විසින් ඉදිකරන ලදැයි සැලකෙන මෙම මන්දිරය, අද්විතීය ගෘහ නිර්මාණ ශිල්පය නිසා මෙන්ම අක්කර 42 පුරා පැතිරුණ අගනා වතුයාය නිසාත් විශේෂත්වයට පත්වෙයි. දැනට මෙම මන්දිරය සහ වතුයාය, රජයේ භාරකාර දෙපාර්තමේන්තුව භාරයේ පවතී.

මෙම අනර්ඝ වතුයායට ස්වභාවික මෙන්ම මිනිසා විසින් නිර්මාණය කරන ලද පරිසර පද්ධතීන්ද ඇතුළත් වේ. මෙහි ඇති භෞමික පරිසර පද්ධතීන් ලෙස විශාලව පැතිරුණ පොල් රුප්පාව, රබර් වගාව, ලඳු කැළෑ ප්‍රදේශ, තණබිම්, මුඩුබිම් සැලකිය හැකි අතර ජලජ පරිසර පද්ධතීන් ලෙස කළු ගඟ හා ඒ ආශ්‍රිත ඉවුරු ප්‍රදේශය, වගුරු බිම් කොටස්, පොකුණු, කුඩා ඇල මාර්ග හා දිය කඩිති ආදිය හඳුනාගත හැක.

මෙම එක් එක් පරිසර පද්ධතීන් විවිධ වර්ගයේ ශාක හා සත්ත්ව ගහණ රැසකට වාසස්ථාන සපයන අතර ඒවායේ පරිසර සාධක ද එකිනෙකට බෙහෙවින් වෙනස් වේ. මෙම විචල්‍ය පරිසර සාධක අතර වාතයේ උෂ්ණත්වය, ආර්ධතාවය හා ආලෝක තීව්‍රතාව ප්‍රමුඛත්වයක් උසුළයි. විශේෂයෙන්ම, මෙම වතුයාය ආශ්‍රිත ප්‍රදේශය රටේ තෙත් කලාපය තුළ පිහිටා ඇති නිසා වාර්ෂික සාමාන්‍ය වර්ෂාපතනය 3000-5000 mm අතර වන අතර වාර්ෂික සාමාන්‍ය උෂ්ණත්වය 27.5 ºC වේ.

මෙම භෞමික පරිසර පද්ධතිවල බහුලව දක්නට ලැබෙන සත්ත්ව විශේෂ අතර කුහුඹු විශේෂ රාශියක්, සලඹයින්, සමනලයින්, තණකොල පෙත්තන්, කුරුමිණි විශේෂ, ගැඩවිලුන්, පත්තෑයින්, මකුළුවන්, සර්පයින් හා කටුස්සන් වැනි උරග විශේෂ ද වේ. තවද, ගස් බෙන තුල ජනපද ආකාරයෙන් සිටින විත රහිත බිඟුන් (Stingless Bees) මෙන්ම මීවද ආකාරයට ලඳු කැලෑ ප්‍රදේශ වල සිටින *Apis* sp. මීමැස්සන් ද දැකගත හැකිය.

මෙම භෞමික පරිසර පද්ධතිය තුළ හමුවෙන සුවිශේෂී සත්ත්වයෙක් වන්නේ Wickramasinghe’s Bronzeback *(Dendrelaphis wickrorum)* නම් ශ්‍රී ලංකාවට ආවේණික උරග විශේෂයයි. මෙම විශේෂය රටේ තෙත් කලාපය තුළ හමුවන අතර මුල්ම වතාවට නව විශේෂයක් ලෙස හඳුනාගනු ලැබූවේ 2020 වසරේදීය. පර්යේෂකයින් පවසන අන්දමට මෙම විශේෂය බොහෝ විට ලඳු කැලෑ හෝ වනාන්තර තුළ හමුවන අතර මොවුනට ඇති ප්‍රධානම තර්ජනය වන්නේ වගාබිම් ප්‍රසාරණය



රූපය 03:
Wickramasinghe's Bronzeback
*(Dendrelaphis wickrorum)*




රූපය 04: රිච්මන්ඩ් කාසල් වතුයායේ මීටර් 250 ක වපසරිය තුළ පිහිටි වාසස්ථාන වල කෘමීන්ගේ අවකාශීය ව්‍යාප්තිය
Source: Prepared by the author using ArcGIS 10.3.1

සඳහා තෙත් කලාපය තුළ ඇති වනාන්තර එලිපෙහෙළි කිරීම නිසා වාසස්ථාන අහිමි වීමයි.

මීට අමතරව මෙම වතුයාය තුළ ජලජ පරිසර පද්ධතීන් ලෙස කළු ගඟේ ඉවුරු ප්‍රදේශය, වගුරුබිම, පොකුණු හා කුඩා ඇල මාර්ග පවතී. මේවායේ බහුලව දිය ලිස්සන්නන්, බත්කූරන් හා කුඩා මාළු විශේෂ දක්නට ලැබේ. විශේෂයෙන්ම කළු ගඟේ ඉවුර ආශ්‍රිතව ඇති කඩොලාන ශාක ප්‍රජාව තුළ ජලජ කකුළුවන් දැකගත හැකිවේ. මීට අමතරව, මිරිදිය ජලජ පද්ධතීන් වාසස්ථාන කරගත් දන්ඩියා, උඩ හඳයා හෙවත් Ceylon Killifish *(Aplocheilus dayi)* වැනි මසුන් දක්නට ලැබේ.

තවද, මෙහි පරිසර පද්ධති තුළ, ලංකාවේ විශාලම උකුසු විශේෂය වන කුසඇලි මුහුදුකුස්සා (White-bellied Sea-eagle) ද දැකිය හැකිය. එමෙන්ම, මෙහි ලංකාවට ආවේණික, අන්තරායට ලක්වූ විශේෂයක් වන කලු වඳුරා (Purple-faced Leaf Monkey) දැකිය හැකි වන අතර මෙරට වෙසෙන දෙවන විශාලතම වල්බළල් විශේෂය වන හඳුන් දිවියාගේ (Fishing Cat) සලකුණු ද හමුවේ.

සමස්තයක් වශයෙන් සැලකීමේදී, මෙම වතුයායට අයත් වාසස්ථාන තුළ බහුලව දක්නට ලැබෙන සත්ත්ව කොට්ඨාසය ලෙස කෘමීන් හඳුනාගත හැකිය. රූපය 04 හි දැක්වෙන සිතියමට අනුව සිදුකරන ලද දත්ත විශ්ලේෂණයට අනුව වැඩිම කෘමි විශේෂ ප්‍රමාණයක් වගුරුබිම් ආශ්‍රිතව හා රබර් වගාව ආශ්‍රිතව දක්නට ලැබේ. මෙම වාසස්ථානවල පරිසර සාධක කෘමි විශේෂවල පැවැත්මට හා ප්‍රජනනයට වාසිදායක වන ලෙස පැවතීම මෙම බහුලතාවයට හේතු ලෙස දැක්විය හැකිය.

මේ සියල්ල සැලකීමේදී, රිච්මන්ඩ් කාසල් වතුයාය, ශ්‍රී ලංකාවේ ස්වභාව සෞන්දර්යට අද්විතීය අපූර්වත්වයක් එකතු කරන බව මනාව පැහැදිලි වේ. සොබාදහම යනු තම අතීත මුතුන් මිත්තන්ගෙන් ලද දායාදයක් ලෙසට වඩා තම අනාගත පරපුරෙන් ඉල්ලාගත් උරුමයක් මැයින් අප සැලකිය යුතුය. එබැවින්, ජෛව විවිධත්වයෙන් අනූන වූ මෙම භූමිය අනාගතය වෙනුවෙන් සුරැකිව තබා ගැන්ම අපගේ යුතුකම වන්නේය.

(කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ ජීවවිද්‍යා විෂය ධාරාව හදාරන ප්‍රථම වසර සිසුන් සමඟ මහාචාර්ය සම්පත් සෙනෙවිරත්න මහතා විසින් රිච්මන්ඩ් කාසල් වතුයාය තුළ සිදුකරන ලද ක්ෂේත්‍ර අධ්‍යයනය ඇසුරෙනි.)


**References:**

Danushka, A. D., Kanishka, A. S., Amarasinghe, A. A. T., Vogel, G., & Seneviratne, S. S. (2020). A NEW SPECIES OF Dendrelaphis BOULENGER, 1890 (REPTILIA : COLUBRIDAE) FROM THE WET ZONE OF SRI LANKA WITH A REDESCRIPTION OF Dendrelaphis bifrenalis (BOULENGER, 1890). *Taprobanica*, 9(1), 83–102. https://doi.org/10.47605/tapro.v9i1.224

*Richmond Castle in Kalutara – Kalutara, Sri Lanka - Atlas Obscura.* (n.d.). Retrieved September 29, 2022, from https://www.atlasobscura.com/places/richmond-castle-kalutara

# இலங்கைக் கடற்பாசிகளும் அவற்றின் முக்கியத்துவமும்



படம் 1:
A: *Ulva* (பச்சைப்பாசி)
B: *Turbinaria* (பழுப்புப்பாசி)
C: *Gracilaria* (சிவப்புப்பாசி)
D: *Sargassum* (பழுப்புப்பாசி)

சயந்தவி சதாசிவமூர்த்தி,
கபிலன் இரங்கநாதன்

## முன்னுரை

வெற்றுக் கண்களுக்கு புலனாகின்ற கடல் அல்காக்களே கடற்பாசிகள் ஆகும். இவை ஒளித்தொகுப்பை மேற்கொள்ளக் கூடிய யூக்கரியோடிக் அங்கிகள். கடல்,ஏரி, குளம் மற்றும் ஈரலிப்பான இடங்களில் இவற்றின் வளர்ச்சியைக்காணலாம் .கடல்சார் இயற்கைவளங்களில் கடற்பாசிகளும் மிகமுக்கியத்துவம் வாய்ந்தவை. அண்ணளவாக 1700 கி.மீ கடற்கரையை கொண்ட இலங்கைதீவில் பல்வேறு குடும்பங்களைச் சேர்ந்த 320 இனங்கள் சார்ந்த கடற்பாசிகள் காணப்படுகின்றன. கற்பிட்டி, திருகோணமலை, மன்னார்இ பேருவளை அம்பாந்தோட்டை மற்றும் யாழ்ப்பாணம் ஆகிய இடங்களில் அதிகளவான கடற்பாசிகளைக் காணக்கூடியதாக உள்ளன. இவை 180 மீற்றர் வரைகடலின் அடியில் வளர்வதுடன் 30-40 மீற்றர் ஆழத்தில் பாறைகளுடன் இணைந்தும் காணப்படுகின்றன.

## கடற்பாசிகளின் வகைகள்

பிரதானமாக நிறப்பொருட்களை மையமாகக் கொண்டு இவை பச்சைப்பாசி (Chlorophyta), சிவப்புப்பாசி (Rhodophyta)மற்றும் பழுப்புப்பாசி (Phaeophyta)என வகைப்படுத்தப்பட்டுள்ளது. இவை அனைத்திலும் குளோரபில் a நிறப்பொருள் காணப்படுகின்றன. பழுப்புபாசிகளில் குளோரபில் a க்கு மேலதிகமாக சாந்தோபல் நிறப்பொருளைகொண்டிருப்பதால் பழுப்புநிறமாகவும், சிவப்புபாசிகளில் பைகோபிலன்களுக்கு சொந்தமான துணைநிறப்பொருளைக் கொண்டிருப்பதால் சிவப்புநிறமாகவும் தென்படுகின்றன. பச்சைக் கடற்பாசிகள் மற்றைய இரண்டிலும் பார்க்க நிலத்தாவரத்துடன் மிகவும் நெருங்கியதொடர்புடையது. இவ்வகைகளில் பழுப்புப் பாசி மற்றும் சிவப்புப் பாசிகள் உணவாக பயன்படுத்தப்படுகின்றன. இலங்கையில் பச்சைப்பாசிவகைகளாவன *Ulva, Caulerpa* இனங்களும் பழுப்புப்பாசிகளான *Turbinaria*, *Sargassum* மற்றும் *Laminaria* இனங்களும் சிவப்புப் பாசிகளான *Gracilaria, Laurencia* மற்றும் *Hypnea* இனங்களும் அதிகளவில் காணப்படுகின்றன.

## கடற்பாசிகளின் விசேடஅம்சங்கள்

கடற்பாசிகள் பூக்கும் திறன் அற்றவை. இவற்றிற்குதரைத் தாவரங்கள் போன்று வேர்,தண்டு, இலை என பாகங்கள் கிடையாது. கலன் கட்டுக்களும் இவற்றில் இல்லாமையால் தேவையான ஊட்டச்சத்துக்களை சுற்றியுள்ள கடல் நீரிலிருந்து பரவல் செயற்பாட்டின் மூலம் பெற்றுக்கொள்கின்றன. இவற்றின் உடலமைப்பு “தலஸ்” எனும் சிறப்புப் பெயரால் அழைக்கப்படுகின்றன. இருப்பினும் கடற்பாசிகளின் சில கட்டமைப்புக்கள் தாவரத்தை ஒத்ததாக அமைகின்றன. இதில் குளோரபில் a நிறப்பொருள் இருப்பதால் ஒளி அல்லது இரசாயனசக்தியைப் பயன்படுத்தி அவற்றுக்கான உணவை உற்பத்தி செய்யும் திறன் கொண்டது. ஆகவே இவை தற்போசணைக்குரியவையாகும். அதிகஅலைகள் கொண்ட கடல் மற்றும் உப்புத்தன்மையில் மாற்றம் ஏற்படும் கடல் நீர் என்பன கடற்பாசிகளின் வளர்ச்சியை குறைவடையச் செய்யும் காரணிகளாக அமைகின்றன. பற்றுக்கால் என்பது கடற்பாசிகளில் மிகவும் சிறப்பு வாய்ந்த ஒரு அங்கமாகும். இதனைப் பயன்படுத்தி கடினமான பாறைகள், கற்கள் மற்றும் பிறதாவரங்களின் மீது கடற்பாசிகள் பற்றிக் கொள்வதன் மூலம் கடலலைகளில் இருந்து அடித்துச் செல்லாது உறுதியாகவும் நிலையாகவும் இருப்பதற்கு உதவுகின்றது. சிவப்புபாசிகளை ஆழ்கடலிலும் பச்சைபாசிகளை நன்னீரிலும் அதிகளவில் காணக்கூடியாதாக இருக்கும். இவற்றின் இனப்பெருக்கமானது இலிங்கமுறைமற்றும் இலிங்கமில் முறையில்நடைபெறுகிறது.

## இலங்கைக் கடற்பாசிகளின் பொருளாதாரமுக்கியத்துவம்

கடற்பாசிகள் காலப்போக்கில் உடைந்துபோகும் போது அவை கடல் நீரில் கரைந்து நீரை வளப்படுத்துகின்றன. *Gracilaria* இனப்பாசிகள் 1800 களிலிருந்து



**படம் 2:** கடற்பாசிபயிர்ச்செய்கை

இலங்கையிலிருந்து ஏற்றுமதிசெய்யப்படுகின்றன. இலங்கையில் கடற்பாசிகள்பயிரிடுவது இதுவரை சோதனைக் கட்டத்திலே உள்ளது. வணிகரீதியாக மன்னார்இகிளிநொச்சிஇநயினாதீவு மற்றும் காரைநகர் ஆகிய இடங்களில் பெருமளவில் பயிரிடப்படுகிறது. ஏற்றுமதிக்கானஅதிக தேவைகாரணமாகவும் மிகையான பாவனை காரணமாகவும் அச்சுறுத்தலை எதிர்கொள்ளும் *Gracilaria* இனங்கள் மீது அதிக கவனம் செலுத்தப்பட்டுள்ளது. சமீபத்தில் *FAO* இன் வங்காளவிரிகுடா திட்டத்தின்படி, இலங்கையில் அதிகளவான *Gracilaria* வளர்ப்பதன் மூலம் வணிகமயமாக்கலிற்குஉதவும் என நம்பப்படுகிறது. இலங்கைக் கடற்பாசியிலிருந்து பெறப்படும் "கர்ஜினன்" எனும் திரவம் மருத்துவக்குணம் வாய்ந்தது. இத் திரவம் விலங்குகளின் உணவில் பயன்படுத்தப்படுகிறது. "ஹேலிஸ்" எனும் தனியார் நிறுவனம் இவ்வாறான கடற்பாசிகளை கொள்வனவுசெய்வதில் அக்கறைகாட்டுகின்றன. *Porphyra, Laminaria* போன்றபாசி இனங்கள் வியாபாரமுக்கியத்துவம் வாய்ந்தவை. பழுப்புப் பாசிகளான *Sargassum* உயிரி எரிபொருள் தயாரிப்பிற்கும், *Turbinaria* ஒற்றைச் செல் புரதத் தயாரிப்பிற்கும் மூலப்பொருளாக பயன்படுகின்றன. சமீபகாலமாக இவ்வகையான பழுப்புப்பாசியின் திரவச்சாறுகள் உரங்களாக பயன்படுத்துவதன் மூலம் வேளாண்மையை அதிகரிக்கசெய்கிறது. கடற்பாசிவளர்ப்பை ஊக்குவிப்பதன் மூலம் கரையோர மக்களின் வாழ்வாதாரத்தை அதிகரிக்கச் செய்யலாம்.

## பயன்கள்

பல நீர்வாழ் உயிரினங்களிற்கு உணவாக மட்டுமன்றி வசிப்பிடமாகவும் கருதப்படுவதால் கடல் சூழல் அமைப்புக்களில் கடற்பாசி மிகமுக்கியமான பங்குவகிக்கின்றது. *Porphyra vietnamensis* எனப்படும் சிவப்புப்பாசியில் மனித உணவுக்கான அதிகளவான புரதம், காபோவைதரேற்று, இலிப்பிட்டு மற்றும் விற்றமின்கள் காணப்படுகின்றன. கடற்பாசி மனித உணவாக மட்டுமன்றி விலங்குகளுக்கான தீவனமாகவும் உபயோகிக்கப்படுவதுடன்மேலும் அழற்சிஎதிர்ப்பு நுண்ணுயிர்எதிர்ப்புக் காரணிகளைக் கொண்டுள்ளதால் காச நோய்இகீழ்வாதம் மற்றும் சளித்தொற்றுகளுக்கான மருந்துதயாரிப்பிற்கும்பயன்படுத்தப்படுகிறது. சிவப்புப்பாசியிலிருந்து ஏகார் எனும் பாதார்த்தம் பிரித்தெடுக்கப்பட்டு உணவுபதப்படுத்தும் தொழிற்சாலைகளிலும் பயன்படுத்தப்படுகிறது. பழுப்புப் பாசிகளான *Sargassum* மற்றும் *Turbinaria* இலிருந்து பெறப்படும் "அல்ஜின்" எனும் பல்சக்கரைட் மனித உடலிலுள்ள தேவையற்ற கொழுப்புக்களைகுறைக்கின்றது. சுவர்பூச்சுக்கான சுண்ணாம்புதயாரிப்பில் ஒட்டும் தன்மையை அதிகரிக்க *Gracilaria* இனம் சேர்க்கப்படுகிறது.

## கடற்பாசிகளிற்கான சவால்களும் அவற்றிற்கான தீர்வும்

மனிதன் பலவகைகளிலும் கடற்பாசியை பயன்படுத்துவதால் அவற்றின் பயிரிடும் வீதத்தைவிட நுகர்வுவீதம் அதிகரித்துச் செல்கிறது. நல்லதரமான நாற்றுகள் இன்மைஇ மூலப்பொருட்களின் பற்றாக்குறைஇ நிதிப்பற்றாக்குறை மற்றும் சமூகத்தின் நிச்சயமற்ற தன்மை ஆகியவை பயிரிடும் வீதம் குறைவதற்கான காரணங்களாக குறிப்பிடலாம். மனிதனால் அதிகமான கடற் போக்குவரத்துஇ தொழிற்சாலை கழிவுகளிலிருந்து நீர் மாசடைதல் மற்றும் கடலோர நகரமாக்கல் போன்ற மனித நடவடிக்கைகளால் இயற்கையாக வளரும் கடற்பாசிகளிற்கும் அச்சுறுத்தலாக காணப்படுகின்றன. இவற்றால் எதிர்காலத்தில் கடற்பாசி இனங்கள்முற்றிலும் அழிவடையும் சாத்தியக்கூறுகள் அதிகமாக உள்ளது. கடற்பாசிகளின் பயிர்ச்செய்கையை அதிகரிக்க புதிய சாகுபடிமுறைமையை ஆராய்ந்து உற்பத்தியை விரிவுபடுத்தல்இ புதியதொழில்நுட்பமுறைகளை பயன்படுத்தல்மற்றும் மனிதவளங்களைக் கொண்டும் பாசி வளர்ப்பை மேம்படுத்தலாம். இன்றைய காலகட்டத்தில் காலநிலை மாற்றம் என்பது சூழலுக்கு பாதிப்பு ஏற்படுத்தக்கூடிய பிரச்சினை ஆகும். இக் கடற்பாசிகள் பூமியில் 50% ஆன ஒட்சிசனை விநியோகிப்பதுடன் வளிமண்டலத்திலிருந்து பெரியளவிலான காபனீரொட்சைட்டை உறிஞ்சுகிறது. எனவே சூழற் பிரச்சினைகளுக்கு கடற்பாசிகளின் வளர்ப்பு பாரியஅனுகூலமாகஅமைகின்றது.


**References**

Coppejans, E., Liliaert, F., Dargent, O., Gunasekara, R. and Clerk, O.D. (2009), Sri Lankan Seaweeds, Methodologies and field guide to the dominant species, ABC Taxa, 6.

Pati, M.P., Sharma, S.D., Nayak, L. and Panda, C.R. (2016), Uses of sea weeds and its application to human welfare: A review, International journal of Pharmacy and Pharmaceutical Sciences, 8(10).

Premarathna, A.D., Kumara, A.M.C.P., Jayasooriya, A.P., Jayanetti, D.E., Adhikari, R.B., Sarvananda, L. and Amarakoon, S. (2020), Distribution and Diversity of seaweed species in south coastal waters in Sri Lanka, 7(1): 196.



## Abstract

Sea weeds are marine macro algae and an autotrophic organism. Several seaweed species are covering the Coastal line of Sri Lanka. Unlike terrestrial plants, sea weeds are not differentiated as root, shoot and leaves. Seaweeds are mainly grouped as green algae, red algae and brown algae. This algal population is facing lots of anthropogenic threats like contaminants, habitat alteration as a result of coastal urbanization. Sea weeds are well known for their uses in the fields like medicine, textile industries, food industries and red algae Gracilaria sp have been exported from Sri Lanka to other counties. Therefore indiscriminate seaweed collections severely disturb the marine ecosystem.



## Affiliation

| Shayanthavi Sathasivamoorthy | Kapilan Ranganathan |
|---|---|
| Department of Botany - University of Jaffna | Department of Botany - University of Jaffna |

# - බටදඬු කඳුවැටිය -



දුම්බර කඳුවැටියෙහි සුන්දර දසුනක්....

දිස්වෙයි පළමු ගල්තල කොරහනෙ කන්ද
දකුණින් පොල්වත්ත කළුපහනා කන්ද
මනහර සොබාදම් වෙල් එළියක මන්ද
තනියම රිදී දිය දහරා ගලන වද

සටහන සහ ඡායාරූප
- උදය චානක -

ඌ දුම්බර මිටියාවතේ ගැමියන් ගේ මුවින් එදා දුම්බර පිළිබඳව ගලා ආ ජන කවියකි. සොබාදර්මයේ අපූරු නිර්මාණයක් වන මෙම කඳු වැටිය මහනුවර හා මාතලේ යන දිස්ත්‍රිකවල පැතිර ඇත. දකුණින් සහ නැගෙනහිරින් මහවැලි නිම්නයෙන් ද බටහිරින් මාතලේ නිම්නයෙන් ද වෙන්ව සිරිලක මධ්‍යම කඳුකර කලාපය දක්වා විහිදී ඇත. මෙම කඳුවැටියට දුම්බර යන නාමය පටබැඳී ඇත්තේ මෙහි ඇති උස් කඳු පන්ති නිරතුරුව ම පාහේ මිහිදුමින් වැසී පවතින නිසා ය. අපගේ පැරැන්නන් මෙය දුම්බර හෝ බටදඬු කඳුවැටිය නමින් ව්‍යවහාර කරද්දී අප රට ආක්‍රමණය කරනු ලැබූ සුදු ජාතිකයන් මෙම කඳුවැටිය හඳුන්වනු ලැබුවේ නකල්ස් නමිනි. එයට හේතුව වූයේ මෙම කඳුවැටිය අතක ඇඟිලි මිට මොලවාගෙන සිටින ආකාරය ඈතට දිස්වන නිසා ය. මෙම කඳුවැටියේ විවිධ උස් මට්ටම්වලින් යුත් කඳු ශිඛර 34 පමණ දක්නට ලැබෙන අතර ඒ, සෑම කන්දක් ම මීටර 900ට වඩා උසකින් යුක්ත වේ. මෙහි ඇති ප්‍රධාන කඳු ලෙස

| කන්ද | උස මීටර |
|---|---|
| ගොම්බානිය | 1906 |
| දුම්බර | 1852 |
| කිරිගල්පොත්ත | 1648 |
| දුම්බානගල | 1642 |
| කළුපහන | 1628 |
| වමාරපුගල | 1558 |
| දෝතළුගල | 1575 |
| පොත්දොරාවගල | 1528 |
| තෙළඹුගල | 1331 |
| ලකේගල | 1317 |

දැක්විය හැකිය. ගිණිකොන සිට වයඹ දෙසට විහිදෙන මෙම කඳුවැටියේ දිග සැතැපුම් 12 පමණ වන අතර මෙහි විශාලත්වය හෙක්ටයාර 18502 පමණ වේ. දුම්බර කඳු වැටිය අතරින් ගලා බසිනා දිය දහරා අතර දකුණේ සිට ඊසාන දෙසට ගලායන මහඔය හෙවත් හීන් ගඟ ද උතුරට ගලා යන කළු ගඟ ද බටහිර දෙසට ගලායන හුලු ගඟ ද වේ. ලංකාවේ ප්‍රධාන කඳු පෙළින් වෙන්ව පවතිනා නිසා ලංකාවේ ඇති සියළු දේශගුණික ලක්ෂණ මෙම කඳුවැටියෙහි දක්ණට ලැබේ. මැයි මාසයේ සිට සැප්තැම්බර් දක්වා සමස්ථ නකල්ස් අඩවියම දේශගුණික වශයෙන් වියලි තත්වයක පැවතුන ද කඳුවැටිය ගිණිකොන සිට වයඹ දිගට පිහිටා ඇති නිසා නිරිත හා ඊසාන දිග මෝසම් වැසි මගින් නො අඩුව වර්ෂාපතනය ලැබේ. මෙහි සාමාන්‍යය උෂ්ණත්වය සෙන්ටිග්‍රේට් අංශක 10ත් 37ත් අතර අගයක් ගනු ලැබේ. කඳු වැටියේ අභ්‍යන්තරය නිර්මාණය වී ඇත්තේ චානොකයිට් ශ්‍රේණියට අයත් පාෂාණ තට්ටු මගින් බව සැලකේ. මෙහි බටහිර බෑවුම්වල රතු දුඹුරු ලැටසොලික් පස ද ළා දුඹුරු ලෝම පස ද, රතු පොඩ්සොලික් පස ද වනාන්තර බිම් ආශිතව හ්‍යුමස් මිශ්‍ර කළු පස ද දක්නට ලැබේ. මයිකා, මැණික්, ෆෙල්ස්පාර්, ස්පටික හුණුගල්, මිනිරන් වැනි ඛනිජ වර්ග ද ග්‍රැනයිට්, ලනයිස්, ඉල්මනයිට්, ඩොලමයිට්, ලයිම්ස්ටෝන්, ආම්ලික නයිස්, ක්වාට්සයිට්, ක්වාට්පිෂ්ට් වැනි පාෂාණ වර්ග ද මෙහි දක්ණට ලැබීම විශේෂත්වයකි. මෙම කඳුවැටිය ආශ්‍රිතව ලංකාවේ දී දක ගත හැකි සෑම වනාන්තර වර්ගයක් ම පාහේ දක්නට ලැබෙන නීසා ද ඉහළ සත්ත්ව විවිධත්වයකින් යුක්තවන නිසා ද සංස්කෘතික හා ඓතිහාසික වශයෙන් වැදගත් වන ස්ථානයක් නිසා ද මෙම කඳුවැටිය ලංකාවේ ප්‍රථම සංරක්ෂණ වනාන්තරය ලෙස වර්ෂ 2000 මැයි මස 05වන දින අංක 1130/22 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කරණ ලදි. මෙම කඳු වැටිය ආශ්‍රිතව පවතින ඉහළ ජෛව විවිධත්වය හේතුවෙන් 2010-07-25 වන දින යුනෙස්කෝ සංවිධානයේ ලෝක උරුම කමිටුව විසින් නම් කරන ලද ලෝක උරුම 21ක අතරට දුම්බර කඳුවැටිය ද එක් කිරීම අප ලද භාග්‍යකි.

දුම්බර යනු පාරිසරික හා ජෛව විවිධත්වය අතින් පමණක් නොව මෙය සංස්කෘතික හා ප්‍රාග් ඓතිහාසික වශයෙන් ද ඉතා වැදගත් ස්ථානයකි. දුම්බර හා බැඳුණු විවිධ ජන කතා, සාහිත්‍යමය මූලාශ්‍ර හා පුරාවිද්‍යාත්මක සාධක පිළිබඳව සලකා බැලීමේදී රාවණා රජු සීතා දේවිය පැහැර ගෙන අවුත් සඟවා ඇත්තේ මෙහි ඇති ලකේගල බව පැවසේ. තව ද එතුමාගේ රාජධානිය දුම්බර ආශ්‍රිතව පැතිර තිබූ බවට ද සැලකෙන අතර මාළිගාතැන්න, වමාරපුගල, කළුනික පොකුණ, යහන් ගල, ගිනිකෙළියාව, වැනි ස්ථාන හා රාවණා රජුගේ සබඳතාවය ජනප්‍රවාදවල සදහන් වේ. එපමණක් ද නොව රාවණා රජුගේ දඩුමොණරය පහතට ගැනීම සඳහා ඉලක්ක කළ ගල වූ ඉලක්කෙ ගල පසුව ලකේගල වශයෙන් ව්‍යවහාර වූවා යයි පැවසේ. මීමුරේ ගම්මානය ආශ්‍රිතව ඇති දණ්දෙනිය කුඹුර නමින් හැඳින්වුණු පැරණි ගම්මානය හරහා ගලන රාවණා ඇළ නමින් හැඳින්වෙන ඇළක් ඇති



දුම්බර කුරුබෝදිලමා
*Cophotis dumbara*



දුම්බර ජන ජීවිතය



පෙතියාගොඩගේ කටුස්සා
*Calotes pethiyagodai*



දුම්බර කඳුවැටියෙහි සුන්දර දසුනක්



මනමේන්ද්‍රගේ කටුස්සා
*Calotes manamendrai*



*Cnemaspis punctata*

අතර මෙම ඇළ දිගේ පහළට ගමන් කරන ලද ගැමියන් පිරිසකට විවිධ බහිරව රූප නිධානවල ලකුණු දර්ශනය වුවත් නැවත වරක් ඇළ දිගේ උඩට එන විට ඔවුන්ට එම රූප දිස් නොවුණු බවත් ගැමියෝ පවසති. ඒ පිළිබඳව ලොරී නමැත්තා (1898) සිය ග්‍රන්ථයේ ද සඳහන් කොට ඇත. දුම්බර කඳුවැටියෙහි කුඹුක්ගොල්ල ප්‍රදේශයෙහි පිහිටි වෙඩි ලුණු ගුහාවත්, කරඹකැටිය ප්‍රදේශයෙහි පිහිටි අළුගල් ලෙනත්, අතීතයේදී ආදිවාසීන්ගේ වාසභූමි වූ බවට සැලකේ. තව ද මෙම ප්‍රදේශයේ බේදුරුවා නමැති වැද්දෙක් විසූ බවත්, ඔහු පිළිබඳව මෙහි ඇති ජනකතාවල සඳහන් වේ. පළමුවන විමලධර්මසූරිය රජු සමයේ රජ වාසලට මී පැණි සැපයීම භාරව තිබී ඇත්තේ මේ බේදුරු වැද්දට ය. දිනක් පෝද්දල්ගොඩ කඩතුරාගල සිට දඩයමේ පැමිණි හේරත් හාමි විසින් විදින ලද වල් ඌරකු මැරී තිබෙණුයේ මෙම මීමුරේ අද වෙල්යායක් වශයෙන් පවතින ඉසව්වක ය. හේරත් හාමි මෙම ඌරාව මස් කිරීමට අවට බලන විට එහි ආ බේදුරුවා තම ඉසව්වට හේරත් හාමිගේ පැමිණීමට විරෝධය දක්වා ඇත. නමුත් පසුව බේදුරුවා සමග මිත්‍ර වූ හේරත් හාමි වරින් වර මෙහි පැමිණ ඇත. මෙම ප්‍රදේශයට සිත් ඇදී ගිය හේරත් හාමි සිය සහෝදරයකු වන රිටි හාමි සමග මෙහි පැමිණ පදිංචි වී ඇත. දිනක් බේදුරුවාගේ සීමා මායිම් බැලීමට කැළයේ ඇවිදින අතරේ ඔහු විසින් බේදුරුවාව මරා දමන ලදි. එම බේඳුරුවා මැරූ ස්ථානය ලකේගලට ආසන්නයේ ඇති බේඳුරුවා මැරූ තැන්න වශයෙන් අද හඳුන්වනු ලබයි. තව ද ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා සිය දියණියන් දෙදෙනා සතුරු උපද්‍රවවලින් ආරක්ෂා කර ගැනීම සඳහා සඟවා ඇත්තේ මෙම මීමුරේ ගම්මානයේ ය. එම දියණියන් සැගව සිටි නිවස හඳුන්වා ඇත්තේ මැද ගෙදර නමිනි. දියණියන් ස්නානය කළ ළිඳ හඳුන්වා ඇත්තේ කටුපඳුර ළිඳ වශයෙනි. එම ළිඳ අදටත් මීමුරේ දී දැක ගත හැකි ය. එයින් පෙනී යන්නේ මෙම ප්‍රදේශය අපගේ ආදිවාසීන්ගේ නිජබිමක් වූ බවයි.

2002 වසරේ දුම්බර පිටවල පතනේ සිදු කරන ලද කැනීම්වලදී වසර 5000ක් පමණ පැරණි ගල් ආයුධ සොයා ගනු ලැබූ අතර මේවා බලංගොඩ මානවයා භාවිත කළ ජ්‍යාමිතික ක්ෂුද්‍ර ශිලා මෙවලම් වේ. පිටවල පතන පුරාවට ම මෙම මානවයා භාවිතා කරනු ලැබූ ගල් ආයුධ හමුවේ. වෙඩි ලුණු ගුහාවේ ඇති වෙඩි ලුණු මහනුවර යුගයේදී භාවිතයට ගැනීමත්, අළුගල්ලෙන ගුහාව වැනි ස්ථාන පසුකාලීනව වැදි ජනයා භාවිතයට ගැනීමත් නිසා ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ෆොසිල හා වෙනත් සාධකවල විරලතාවයක් පවතී. ඓතිහාසික වශයෙන් සැලකීමේදී ශ්‍රී ලංකාවේ විවිධ යුගවලදී දුම්බර ආශ්‍රිතව ඇති ගම්මානවල ජනතාව රාජධානි සමග සම්බන්දතා පවත්වා ගෙන ආ බව සැලකිය හැකි අතර ඒ සඳහා සාක්ෂි ද ඉතිරිව ඇත. එනම්, තෙල්දෙණියට ආසන්නව ඇති බඹරගල සෙල්ලිපියේ ''උතුර ගුත තෙරහ ලෙනෙ මනපදශනෙ කොලගමහි තුබෙ කලතෙහි එක ලෙණෙ චිතනගහි පශදෙ තෙරහ දිනෙ'' මෙයින් කියැවෙනුයේ ක්‍රි.පූ. 3වන සියවස වන විටත් දුම්බර ජනාවාස වී පැවති බවත් එහි කොළගම නම් වූ ගම්මානයක් තිබූණු බවත් ය. එසේම ක්‍රි.පූ. 5-6 පමණ වන විට ලංකාපුරය නමින් හැඳින්වුණු ගෝත්‍ර ජනාවාසයක් තිබූ බවට ද සාක්ෂි ලැබේ. විජය කුමාරයා මෙහි පැමිණි පසු දිනක් කුවේණිය හා රාත්‍රිය ගත කරන විට කුමරුට කිසියම් ඝෝෂාවක් ඇසුණු අතර කුමාරයා ඒ පිළිබඳව කුවේණියගෙන් විමසූ විට ස්වාමීනි මෙහි සිරිසවත්තු නම් යක්ෂ පුරයේ දෙටු යකු පිණිස ලංකා නගරවාසී වූ කුමරියක් මෙහි ගෙනෙන ලද්දීය යන්න ප්‍රකාශ කර තිබේ. (මහාවංශය පරි44) එකල සිරිසවත්පු පුරය හා ලංකාපුරයේ යක්ෂ ගෝත්‍රිකයන් අතර විවහ සිදුවූ බව පෙනේ. පසුකාලීනව විජය රජතුමා විසින් කුවේණිය අතහැර දැමූ විට ඇය පිළිසරණ පතා ගියේ ද ලංකාපුරයට බව සඳහන් වේ. එදා ලංකාපුරය ලෙස හඳුන්වා ඇත්තේ ද මෙම දුම්බර කඳු වැටිය ආශ්‍රිත ප්‍රදේශය යි. එමෙන්ම දුටුගැමුණු රජතුමා මහියංගනයේ සිට ලංකාපබ්බතය අසල පිහිටි රණමුරේ හරහා ඇති මාර්ගයේ අනුරාධපුරය දක්වා ගමන් ගත් බව ද සඳහන්වේ. එකල රජු සේනා මෙහෙය වූ ගමන් මාර්ගයේ එක් මධ්‍යස්ථානයක් ලංකා පබ්බතය අසල පිහිටි මීමුරේ ගම්මානය හරහා වැටී තිබුණි. දුම්බර හා බැඳී ඇති ප්‍රාග් ඓතිහාසික හා ඓතිහාසික කරුණු බොහොමයක් ඇත. ඒ සියල්ල අපට විදහා දක්වනුයේ දුම්බර ඉතිහාසය බොහෝ සෙයින් ඈත අතීතය වෙත දිවෙන බවකි.

දුම්බර නැරඹීම සඳහා ප්‍රවේශ විය හැකි ප්‍රධාන මාර්ග කිහිපයකි.

i කොළඹ - මාතලේ - රත්තොට - පිටවල පතන හරහා (දුර කිඃ මීඃ 170)

ii කොළඹ - මහනුවර - හුන්නස්ගිරිය - ලූල්වත්ත හරහා ය.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක දුම්බර සංරක්ෂණ ව්‍යාපෘතියෙහි මහනුවර දිසාවේ ප්‍රධාන සංරක්ෂණ මධ්‍යස්ථානය ලූල්වත්ත පාරේ ඩීන්ස්ටන් වන නිවහනෙහි පිහිටා ඇත. එහි සිට

# බටදඹු කඳුවැටිය...



නකලස් වක් නිය හූනා
*Cyrtodactylus soba*



ඩිසිල්වාගේ මැඩිල්ලා
*Aspidura desilvai*



බඩරතු දෙපත් කළුවා
*Calliophis haematoetron*



*Pseudophilautus mooreorum*



*Nannophrys marmorata*



*Pseudophilautus asankai*

ප්‍රධාන නැරුඹුම් මාර්ග 05 සකස්කොට ඇත. ඒවා, නම් අළුගල්ලෙන, වෙඩි ලුණු ගුහාව, දෝතලුගල, හපුගස් කුඹුර සහ කුඩා ලෝකාන්තය යි. මෙහි සංචාරය කරන්නෙකුට ඉලුක්කුඹුර හෝ ඩීන්ස්ටන් සංචාරක බංගලා වෙන් කරවා ගත හැකි ය. ඒ සඳහා වන සංරක්ෂණ දෙපාර්තුමේන්තුවේ රජමල්වත්ත පාර බත්තරමුල්ලේ පිහිටි ප්‍රධාන කාර්යාලය වෙත පැමිණිය යුතු ය.

## ජෛව විවිධත්ව සහ පාරිසරික වැදගත්කම

දුම්බර කඳුවැටිය යනු ජෛව විවිධත්වය අතින් ඉහළ ම ස්ථානයක් හිමිකර ගන්නා කඳුවැටියකි. එකල බ්‍රිතාන්‍යය ජාතික සිවිල් සේවකයකු මෙම දුම්බර ප්‍රදේශය උද්භිද පාරාදීසයක් ලෙස හඳුන්වා දී ඇත. ශ්‍රී ලංකාවේ ඇති සෑම වනාන්තර වර්ගයක් ම පාහේ මෙම කඳුවැටියේදී දක්නට ලැබීම මෙහි ඇති විශේෂත්වයයි. මෙම වටිනාකම තේරුම් ගත් බිතාන්‍ය ජාතිකයන් 1873 දී දුම්බර කඳුකරයේ මීටර 1500 ට වඩා ඉහළ ඇති වළාකුළු වනාන්තර ප්‍රදේශ දේශගුණික රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත. තෙත් සදාහරිත වනාන්තර, කඳුකර තෙත් වනාන්තර, කඳුකර වියළි සදාහරිත වනාන්තර, පහත් වියලි අර්ධ සදාහරිත වනාන්තර, කඳුකර තෘණ බිම් පතන්, පිග්මි වනාන්තර වැනි විවිධ පරිසර පද්ධතීන් රාශියක එකතුවක් ලෙස දුම්බර හැඳින්විය හැකි ය. ලංකාවේ මුළු භූමි ප්‍රමාණයෙන් 0.32 % ක් පමණ ආවරණය වන දුම්බර කඳුකරයෙන් මහවැලි ගගේ ජල පෝෂක ප්‍රදෙශ අතුරින් 30% ක් පමණ ආවරණය වේ. සිදු කර ඇති අධ්‍යයන වලට අනුව මෙම වනාන්තරයේ කුල 141 කට අයත් සපුෂ්ප ශාක විශේෂ 1033 ක් පමණ හඳුනාගෙන ඇත.ඒ අතුරින් විශේෂ 160 ක් ලංකාවට ආවේණික වේ. ලංකාවේ වාර්තා වී ඇති සමස්ථ ශාක විශේෂ අතුරින් 27.4%ක් පමණ දුම්බර අඩවියෙන් වාර්තා වීම මෙම වනාන්තරයේ ඇති තවත් සුවිශේෂීතාවයකි. මුළු ලොවින්ම දුම්බර අඩවියටම පමණක් සීමා වන ශාක විශේෂ 06ක් මෙම අඩවියෙන් වාර්තා වේ. ඒ දඹ විශේෂයන් වන *Syzygium congylos, Syzygium madugodensis* හා *Eugenia apica* ද, කීන විශේෂයක් වන *Calophyllum cuneifolium* ද *Ilex knucalensis* ශාකය ද පතන් බිම් වල දක්ණට ලැබෙන පතන් අල *Brachystelma lankana* ශාකය ද දුම්බර අඩවියටම ආවේණික වූ ශාක විශේෂයන්ය. මෙහි මීවන ශාක විශේෂ 42ක් හඳූනාගෙන ඇති අතර ඉන් විශේෂ 06ක් ලංකාවට ආවේණිකය. ඒ අතුරින් දුර්ලභ මීවන ශාක විශේෂ වන *Psilotum nudum, Huperzia phyllantha, Botrychium daucifolium* සහ *Elaphoglossum spathulatum* දුම්බර අඩවියෙන් වාර්තා වේ. පහත දැක්වෙනුයේ මෙම ප්‍රදේශයේ දක්නට ලැබෙන වනාන්තර වර්ග පිළිබදව කෙටි හැදින්වීමකි.

## වියළි සදාහරිත වනාන්තර

මෙම වනාන්තර වර්ගය දුම්බර පහත් කලාපයේ දැකිය හැකි ය. මෙහි අතර මැදි කලාපීය වනාන්තරවල ලක්ෂණ ද දැකිය හැකි ය. සාමාන්‍යයෙන් වර්ෂාව ලැබෙනුයේ නොවැම්බර්-පෙබරවාරි යන කාලවලදී යග මීටර 30ක් පමණ උසට වැඩෙන ශාකවලින් සෑදුණු වියන් ස්තරයක් ද උප වියන් ස්තරයක් ද පඳූරු ස්තරයක් ද හදුනාගත හැකි ය. මෙම වනාන්තර තුළ දක්නට ලැබෙන ශාක විශේෂ අතර පිහිඹිය *(Filicium decipiens)* ලුණුමිදෙල්ල *(Melia dubia)* බදුල්ල *(Semecarpus obscura)* මිල්ල *(Vitex altissima)* ඇටඹ *(Mangifera zeylanica)* බල *(Nothopegia beddomei)* කීන *(Calophyllum tomentosum)* වැනි ශාක විශේෂ ද පඳූරු ශාක ලෙස දියරත්මල් *(Saraca asoca)* කෝරකහ *(Memecylon angustifolium), Ardisia missionis* වැනි ශාක විශේෂ දැක්විය හැකි ය.

## කඳුකර තෙත් සදාහරිත වනාන්තර

මෙම වනාන්තර වර්ගය මීටර 1300ට වඩා උස්බිම් ප්‍රදේශවල දැකිය හැකි වේ. මෙහි ශාක මීටර 15 පමණ උසට වැඩෙන අතර යටිරෝපණයක් ද දක්නට ලැබේ. මෙහි දක්නට ලැබෙන ශාක විශේෂ අතර කීන වර්ග කිහිපයක් ද මඩොල් ශාක, මීවන හා අපි ශාක විශේෂ ද උඩවැඩියා විශේෂ ද ලයිකන හා ඇල්ගී විශේෂ ද බහුලව දැකිය හැකි ය. මෙම වනාන්තර මෙහි අක්කර 16000ක පමණ බිම් ප්‍රමාණයක පැතිර ඇත. මෙහි ම මීටර 1650 ට වඩා උස් බිම්වල ඇති වනාන්තර පිග්මි වනාන්තර ලෙස හදුන්වන අතර මෙම ප්‍රදේශවල ඇති අධික සුළං සහිත බව හා සීතල අධික වීම නිසා මෙහි ඇති ශාකවල පත්‍ර පළල් ය. ශාක කුරු වී මිටිවී ඇත. මෙම වනාන්තරවල වැඩුනු ශාකයක උස අඩි 03-04 ත් අතර අගයක් ගනු ලබයි. මෙහි හමු වන ශාක විශේෂ අතර වල් කරාබු, වල් ජම්බු, කීන, මහරත්මල් වැනි ශාක විශේෂ දැක්විය හැකි ය.



අළු උනහපුලුවා
*Gray slender loris - Loris lydekkerianus*



අඳුරු නිල් මැසිමාරා
*Dull-blue Flycatcher*



ශ්‍රී ලංකා
කහකන්
කොණ්ඩයා
*Yellow-eared Bulbul*



*Tawny Rajah*



*Blue Magpie*



දුම්බරට පායන හිරු

### කළුකර තෘණ බිම්

වර්ෂ 1842 දී පමණ මෙම ප්‍රදේශවල ඇතැම් ස්ථානයන්හි කෝපි වගා කොට අතහැර දමා ඇති අතර කාලයත් සමග එම බිම් ප්‍රදේශවල මාන තෘණ හා ඉලුක් වර්ගවලින් ගහන වී පතන් බිම් බවට පරිවර්තනය වී ඇත. කළුපහනින් ඊසාන දිශාවට පිහිටි රණාකෙටූ පතන සෞම්‍ය වියලි කලාපයේ පතනක් වේ. මෙම පතනට ආවේණික වඳවී යාමේ තර්ජනයට ලක්ව ඇති *Brachystelma lantana* ශාකය රණාකෙටූ පතනින් වාර්තා වේ. තවද පිටවල පතන ලබුලැස්සේ පතන ආදී විශාල පතන් ද තැනින් තැන කුඩා පතන් විශාල ප්‍රමාණයක් ද දක්නට ලැබේ.

### කළුකර වියලි සදාහරිත වනාන්තර

මෙම වනාන්තර මෙම කඳුවැටියෙහි මීටර 450-1000ත් අතර උස් ප්‍රදේශවල පැතිර ඇති අතර හීන් ගඟ ද්‍රෝණියේ ද පැතිර ඇත. මෙහි ප්‍රමුඛ ශාක ලෙස මිල්ල (*Vitex altissima*) මලබොඩ (*Myristica dactyloides*) යකුල්මරන් (*Syzygium zeylanicum*) බල (*Nothopegia beddomei*) ඇටඹ (*Mangifera zeylanica*) වැනි ශාක දැක්විය හැකි ය.

මෙම කඳුකරයේ සිදු කර ඇති පර්යේෂණ අනුව මෙහි ඇති ශාකවලින් 50 ක් පමණ ආවේණික ශාක වන අතර මෙහි වටිනා ඖෂධ ශාක විශේෂ ද වාර්තා වේ. ඒ අතර සඳරාජ, වනරාජ, ඉරුරාජ, කුඩා හැඩයා, බිම් කොහොඹ වැනි ශාක වැදගත් වේ. තව ද ලංකාවට ආවේණික උඩවැඩියා විශේෂ රාශියක් ද මෙහි වාර්තා වී ඇත.

දුම්බරදී අපට හමු වන අප රටට ආවේණික ශාක විශේෂ කිහිපයක් පහත දැක්වේ. ඇටඹ (*Mangifera zeylanica*), ගැට බඳුල්ල (*Semecarpus obscura*), කටු මොද (*Cullenia rosayroana*), කෝරකහ (*Memecylon angustifolium*), අලදු (*Broussonetia zeylanica*), *Ficus fergusoni*, *Eugenia contrinifolia*, *Eugenia mabaeoides*, *Eugenia trotundata*, වල් ජම්බු (*Syzygium cordifolium*), වැලි දඹ (*Syzygium umbrosum*), කැටිය (*Pittosporum ceylanicum*), වල් කරපිංච (*Micromelum minutum*), දියතාලිය (*Mastixia tetranda*), ගල් වෙරලු (*Elaeocarpus montanus*), බේරු (*Agrostistachys coriacea*), තලන් (*Litsea gardenri*), ගෝනපනා (*Pseudocarapa championii*), වැව්ය (*Hortonia floribunda*), කටු කිතුල් (*Oncosperma fasciculatum*), වලාබුරුත (*Canthium montanum*), අඟන (*Timonius jambosella*), කිරිහැඹිලිය (*Palaquium grande*), තෙල් කීන (*Calophyllum tomentosum*), බලු දං (*Ardisia humilis*) වැනි ශාක විශේෂ දැක්විය හැකි ය.

දුම්බර යනු පාරිසරික අතින්ද ඉතාම අලංකාර ස්ථානයකි. මෙහි සංචාරය කර තිබෙන අයෙකුට කිසිදා මෙම වන පියස අමතක නොවනු ඇත. මෙය නිරතුරුව මිහිදුමින් බරවී තිබීමත් විවිධ පරිසර පද්ධතීන් රාශියකින් නිර්මාණය වී තිබීමත්, විවිධ සත්ත්ව විශේෂවල වාසස්ථානයක් වීමත් නිසා මෙය අතිශයින්ම කාගේත් සිත් ගන්නේ ය. මෙය සිරිලක ඇති සුන්දර ම කඳුවැටියක් වීමට තවත් හේතුවක් වී ඇත්තේ මෙහි ඇති විශාල දිය ඇලි සංඛ්‍යාවයි. මෙම කඳුවැටියෙන් ගලා බසිනා ජලධාරා විවිධ ස්ථානවලදී පහතට කඩා හැලෙමින් විශාල දිය ඇලි ප්‍රමාණයක් නිර්මාණය කරන අතර ඒ අතුරින් මෙහි ප්‍රධාන දිය ඇලි 12ක් හඳුනා ගත හැකි ය. එනම්, දුම්බර ඇල්ල නොහොත් දූවිලි ඇල්ලල උඩ දූවිලි ඇල්ලල කළු පහන ඇල්ලල වැද්දා පැණි ඇල්ලල සේරු ඇල්ල, බඹරුන් ගහන ඇල්ල , තිබ්බටු කනත ඇල්ල, අඳුරු ඇල්ල, කිරි ඇල්ල, දිය කැරුල්ල ඇල්ල, පතන ඇල්ල, හා රත්නින්ද ඇල්ලයි. එපමණක් ද නොව මෙහි සුන්දරත්වය තවත් ඔප්නැංවීම සඳහා මෙහි ඇති පුංචි ලෝකාන්තය ද හේතුවකි. ඕන්ස්ටන් වන නිවහන ඉදිරියෙන් කුඩා ලෝකාන්තය නැරඹීමට සකසා ඇති මාවතේ ගොස් කුඩා ලෝකාන්තය ද නැරඹිය හැකි ය. මාතලේ රත්තොට රිවස්ටන් පිටවල පතන හරහා ගොස් එහි ඇති පුංචි ලෝකාන්තය නැරඹීමට ද ඔබට හැකි ය. මෙම දුම්බර කන්ද තරණය කරන කාගේ වුව ද නෙත් ඇද බැඳ තබාගන්නා දර්ශනයක් වේ. ඒ දකුණින් පෙනෙන පුජනීය ශ්‍රීපාද කඳුගැටය යි. එයට නැගෙනහිරින් ලංකාවේ උස ම කන්ද වන පිදුරුතලාගල දිස්වන අතර බටහිරින් පෙනෙන හන්තාන කඳුවැටිය ද හුන්නස්ගිරියද ඉතා දැකුම්කළු ලෙස දිස්වෙයිග එම නිසා මෙම දුම්බර කඳුවැටිය ඉතා මනස්කාන්තජනක ස්ථානයක් ලෙස හැඳින්විය හැකි ය.

### කෝබට්ස් ගැප් නොහොත් අට්ටාල වෙට්ටුව

හුන්නස්ගිරිය ලුල්වත්ත මාර්ගයේ මීමුරේ සහ තංගප්පුව දෙසට මාර්ග බෙදී යන ස්ථානය අතීතයේ දී හඳුන්වනු ලැබුයේ අට්ටාල මුට්ටුව වශයෙනි. මෙම ස්ථානය කඳු පන්ති 03 ක් එකට එකතු වන ස්ථානයකි. මෙහිදී ස්පිනිස් රොක්, සුදු වලාගල, ලකේගල, වමාරපුගල, දෙතළුගල, මඩොල්සිම, නමුණුකුල, බළල් ගිරිය වැනි අවට කඳු පන්ති රාශියක් ද විට්ටෝරියා, රන්දෙණිගල, රන්ටැඹේ, අභය භූමිය ද සොරබොර වැව ද දැක ගත හැකි යග අට්ටාල වෙට්ටුවට හරහා වේගයෙන් ගමන් ගන්නා

# බටදඹු කඳුවැටිය...



කඳුකර තෙත් සදාහරිත වනාන්තර



කඳුකර තෙත් සදාහරිත වනාන්තර



සේර ඇල්ල



දුම්බර අං කටුස්සා
*Ceratophora tennentii*



අඳුරු වන දුම්බර හෙටදවසේ දිනෙන් දින
පිරී යන මොරගහකන්ද ජලාශය



අඳුරු වන දුම්බර හෙටදවසේ දිනෙන් දින
පිරී යන මොරගහකන්ද ජලාශය

සුළං ධාරා එහි සංචාරය කර ඇති කිසිවකුට කිසි ද අමතක නොවන සොඳුරු මතක සටහනකි.

### මීමුරේ හා ලකේගල

කළුපහණ සහ කෙහෙල්පත්දෙරුගල කඳු වැටි අතර නිම්නයේ පිහිටි මීමුරේ ගම්මානය භාෂාව හා ඇවතුම් පැවතුම් අතින් අනෙක් ගම්මානවලට වඩා බොහෝසෙයින් වෙනස් හුදකලා ගම්මානයකි. මෙහි පිවිසෙන කාගේත් නෙත් සිත් වශී කරවන හෙල්මලු ක්‍රමයට තනා ඇති කුඹුරු යායත්, ඉහළ අහසට නැග ඇති ලකේගල නමැති විශාල ගල් පරයත් මෙම ගම්මානයේ සුන්දරත්වය ඉහළ නැංවීමට සමත් වී ඇත. ලකේගල පිළිබඳව මී මූරේ ගැමියෙකුගේ මුවින් නික්මුණු කවියක් මෙසේ ය.

ගලේ උස බෝය ගල උඩ　　　බලන්නට
ගලේ වට බෝය ගල වට　　　දුවන්නට
සිතේ සැක බෝය පද කර　　　කියන්නට
ලකේගල හොදයි දගැබ්　　　බදින්නට

මීමුරේ වැසියන්ගේ ජන ජීවිතය තවමත් අපට පැරණි ගම්මානයක ඇති ගැමි සුවඳ, ගැමි සුන්දරත්වය මොනවට කියා පාය. අදටත් දැක ගත හැකි මැද මිදුල් සහිත මැටියෙන් ඉදි වූ පැරණි නිවාස ද සිය ඉඩම්වල සීමා මායිම් ලකුණු කිරීමට යොදා ගත් ගල් වැටි ක්‍රමය ද කෘෂිකාර්මික ජීවන රටාව ද පාරම්පරික ඇදහිලි විශ්වාස හා විවිධ කෙම් ක්‍රම ද මීමුරේ ගැමියන්ගේ අතීත උරුමය අපට පසක් කර දෙයි.

### සේර ඇල්ල

දුම්බර වනපෙතේ හමු වන දිය ඇලි අතුරින් සුන්දර ම දිය ඇල්ල වනුයේ සේර ඇල්ලයි. මෙය ඉලුක්කුඹුර ප්‍රදේශයේ සිට කිලෝමීටර් 12 පමණ දුර වනාන්තරය මැදින් ගොස් නැරඹිය යුත ය. උසින් අඩු වූවත් පලළින් වැඩි දිය ඇල්ලකි.

### පිටවල පතන හා පුංචි ලෝකාන්තය

මාතලේ රත්තොට හරහා පිවිසිය යුතු ය. නැතිනම් මහියංගනය හෙට්ටිපොළ හරහා ද පිවිසිය හැකි යග දුම්බර වනපෙතේ පරිසර පද්ධති විවිධත්ව අවබෝධ කර ගැනීමට හැකි ස්ථානයකි. ගමෙහි ඇති පතනශ්‍රීලී පරිසරයත් නිරතුව පවතින මීදුමින් බර ගතිය නෙත් සිත් පිනවන දසුනකි. මේ ආශ්‍රිතව ඇති පූංචි ලෝකාන්තය ද පිටවල පතනට වැඩි වටිනාකමක් එක් කරයි.

## දුම්බර සත්ත්ව විවිධත්වය

මෙම කඳුවැටිය අශ්‍රිතව ඇති විවිධ වූ පරිසර පද්ධතීන්ට අනුවර්තනය වූ ඉතා ඉහළ සත්ත්ව විවිධත්වයක් දක්නට ඇත. මෙම කඳුවැටියේ පිහිටි එකිනෙකට වෙනස් වූ දේශගුණික ලක්ෂණ නියෝජනය කරන වනාන්තර වර්ග,තෘණ බිම්, ඉතා හොඳ ජලවහන රටාව, අඩු වැඩි වශයෙන් පවතින උෂ්ණත්වය ආදී සාධක මේ සත්ත්ව විවිධත්වයට හේතු වී ඇත. මෙහි සත්ව ප්‍රජාව පිළිබඳව තවමත් පර්යේෂණ සිදු කෙරෙමින් පවතින අතර මෙහි වනගුල්ම තුළ තවමත් මිනිස් ඇසට හසු නොවුණු නව සත්ව සාමාජිකයින් කෙතරම් නම් සිටී දැයි මේ නිසා ඔවුන් පිළිබඳ පර්යේෂණ සිදු කොට ඔවුන් සංරක්ෂණයට පියවර ගැනීම අපගේ වගකීමක් වන්නේ ය. පහත දැක්වෙනුයේ මෙහි වාර්තා වන සත්ත්ව විවිධත්වය පිළිබඳ කෙටි සටහනකි.

### ක්ෂීරපායී විවිධත්වය

ශ්‍රී ලංකාවේ ගොඩබිමින් වාර්තා වී ඇති ක්ෂීරපායී විශේෂ 98 න් විශේෂ 31 ක් දුම්බරින් වාර්තා වී ඇත. මෙහි නැගෙනහිර බෑවුමෙහි වනාන්තරවල වල් අලින් (*Elephas maximus*) ද දිවි ගෙවන අතර බොහොමයක් වන අලින් ඇතැම් වියලි කාලවල දී වස්ගොමුව ජාතික වනෝද්‍යාන ප්‍රදේශයේ සිට සංක්‍රමණය වේ. වාර්තාවන අනෙක් ක්ෂීරපායී විශේෂ ලෙස දිවියා (*Panthera pardus kotiya*), ගෝණා (*Cervus unicolor unicolor*), ඕලු මුවා (*Axis porcinus porcinus*), කොල දිවියා (*Prionailurus rubiginosus*), වල් ඌරා (*Suscrofa chirstatus*), කළු වඳුරා (*Semnopithecus vetulus monticola*), රිලවා (*Macaca sinica opisthomelas*), රන් කළවැද්දා (*Paradoxurus stenocephalus*), දඬුලේනා (*Ratufa macoroura dadolena*), කබල්ලෑවා (*Manis crassicaidata*), උනහපුලුවා (*Loris lydekkerianus*), ඉත්තෑවා (*Hystrix indica*), දිය බල්ලා (*Lutra lutra ceylonica*) වැනි ක්ෂීරපායී සත්ත්ව විශේෂයන් දැක්විය හැකිය.

### පක්ෂි විවිධත්වය

මෙහි පක්ෂි විවිධත්වයට හිමිවන්නේ ද අද්විතීය ස්ථානයකි. ශ්‍රී ලංකාවේ වාර්තා වන පක්ෂි විශේෂ 506 න් විශේෂ 200 යකට ආසන්න ප්‍රමාණයක් මෙහිදී දැක ගත හැකි ය. මෙහි පක්ෂි විවිධත්වය



සංවේදී පරිසර පද්ධති ආශ්‍රිතව ඉදිවන අනවසර තාවකාලික ව්‍යාපාර ස්ථාන හා සුන්දර පරිසරය විනසන ඇතැම් සංචාරකයෝ



හැලීගේ රුක් හීරලුවා
*Dasia halianus*



පිටවල පතනෙහි දක්නට ඇති බලංගොඩ මානවයා භාවිත කළ ජ්‍යාමිතික ක්ෂුද්‍ර ශිලා මෙවලම්



මල් පෙතියා
*Dawkinsia srilankensis*



ගඩයා
*Labeo fisheri*



දුම්බර පෙතියා
*Systomus martenstyni*

අතින් වැදගත් වනුයේ ලංකාවට ආවේණික පක්ෂි විශේෂ 33න් විශේෂ 30ක් මෙම කඳුවැටියෙන් වාර්තා වී තිබීමයි. ඒ අතර ගුරු කොණ්ඩයා (Yellow-eared Bulbul), අඳුරු නිල් මැසිමාරා (Dull-blue Flycatcher), අරංගයා (Whistling Thrush), කැහිබෙල්ලා (Sri lanka Blue Magpie), කඳු මල්කුරුල්ලා (Ceylon Hill White -eye), මයිලගෙ ායා (Sri lanka Wood pigeon), ශ්‍රී ලංකා වන රැ වියා (Sri lanka Bush Warbler) වැනි පක්ෂි විශේෂ මෙහි වාර්තා වන කඳුකර වාසී ආවේණික පක්ෂීන් විශේෂ වන අතර මීට කැහිබෙල්ලා (Sri lanka Blue Magpie), රතු දෙමලිච්චා (Sri Lanka Orange billed babbler), අළු දෙමලිච්චා (Ashy Headed Laughingthrush), හිස දුඹුරු දෙමලිච්චා (Brown-Capped Babbler), දෑ දෙමලිච්චා (Scimitar Babbler), ලංකා පිළලිච්චා (Legge's Flowerpecer), අළු කෑදැත්තා (Sri lanka Grey hornbill), සැලළිහිණියා (Sri lanka Mynah), පුල්ලි වල් අවිච්චියා (Sri lanka Spot Winged-thrush), හිස කළු කොණ්ඩයා (Black Capped Bulbul), මහ කෑරලා (Crimson-backed Woodpecker), මූකලන් කොට්ටෝරුවා (Yellow- Fronted Barbet), ශ්‍රී ලංකා අළු ගිරවා (Layard's Parakeet), ශ්‍රී ලංකා ගිරා මලිත්තා (Sri lanka Hanging Parrot), මූකලන් බස්සා (Chestnut –backed Owlet), පිට රතු බටගොයා (Sri Lankan Green Pigeon) වැනි ආවේණික පක්ෂීන් විශේෂයන් ද වාර්තා වේ.

## උරග විවිධත්වය

මෙම කඳුකර කලාපයේ ඇති සුවිශේෂී පරිසර පද්ධති විවිධත්වය හේතුවෙන් මෙහි ඉතා ඉහළ උරග විවිධත්වයක් දැක ගත හැකිය. මෙහි වාර්තා වන ඇතැම් උරග විශේෂයන් මෙම කඳුකර කලාපයට ම පමණක් සීමා වී ඇත. ලංකාවේ හමුවන කටුස්සන් විශේෂ 22 න් විශේෂ 10ක් වාර්තා වී ඇති අතර ඉන් විශේෂ 08ක් ලංකාවට ආවේණික වන අතර එයින් විශේෂ 04ක් දුම්බර අඩවියටම පමණක් සීමා වූ විශේෂ වේ. ඒ මනමේන්ද්‍රගේ කටුස්සා (Calotes manamendrai), පෙතියාගොඩගේ කටුස්සා (Calotes pethiyagodai), පත්‍ර අං කටුස්සා / දුම්බර අං කටුස්සා (Ceratophora tennentii) සහ දුම්බර කුරුබෝදිලමා (Cophotis dumbara) ය. මෙම කඳුවැටියෙන් ලංකාවේ වාර්තා වී ඇති හූනන් විශේෂ 63 න් විශේෂ 12 ක් වාර්තා වී ඇති අතර ඉන් විශේෂ 09ක් ලංකාවට ආවේණික වේ. ඒ අතුරින් නකලස් වක් නිය හූනා (Cyrtodactylus soba), දිවාසැරි හූනන් විශේෂ වන *Cnemaspis kallima*, *Cnemaspis phillipsi*, *Cnemaspis kandambyi* සහ *Cnemaspis punctata* ඇතුළුව හූනන් විශේෂ 05ක් දුම්බර අඩවියටම පමණක් සීමා වූ විශේෂයක් වේ. මෙම කඳුවැටිය ආශ්‍රිතව ලංකාවේ වාර්තා වී ඇති හිකනලයන් විශේෂ 34න් විශේෂ 11ක් වාර්තා වී ඇති අතර ඉන් විශේෂ 06ක් ලංකාවට ආවේණික විශේෂයන් ය. එම විශේෂයන් වන්නේ *Chalcidoseps thwitesii*, *Dasia halianus*, *Lankascincus fallax*, *Lankascincus taylori*, *Eutropis austini* සහ *Nessia bipes* යන විශේෂයන් ය. ලංකාවේ වාර්තා වී ඇති සර්ප විශේෂ 108 න් විශේෂ 45ක් දුම්බර කඳුවැටියෙන් වාර්තා වී ඇත. ඉන් විශේෂ 14ක් ලංකාවට ආවේණික වේ. ආවේණික විශේෂ අතර දෙපත් නයා (Cylindrophis maculata), ඩිසිල්වාගේ මැඩිල්ලා (Aspidura desilvai), නිහලුවා (Rhabdophis ceylonensis), පුල්ලි දත්කැටියා (Oligodon sublineatus), වයිරම් දෙපත්කළුවා (Calliophis haematoetron), පහතරට මූකලන් තෙලිස්සා *Hypnale zara*, මූකලන් තෙලිස්සා (Hypnale nepa), පළා පොළඟා (Trimeresurus trigonocephalus), මුදු කරවලා (Bungarus ceylonicus) වැනි විශේෂ වැදගත් වේ. දුම්බර අඩවියේ වනාන්තර පරිසර පද්ධතීන් ආශ්‍රිතව ජීවත් වන මෙතෙක් සොයා නොගත් උරග විශේෂයන් පිළිබඳව තවමත් පර්යේෂණ සිදු වෙමින් පවතී.

## මත්ස්‍ය විවිධත්වය

දුම්බර යනු ලංකාවේ ඇති මිරිදිය මත්ස්‍ය විද්‍යාත්මක කලාප තුනෙන් එකකි. නකල්ස් කඳුවැටි කලාපය තෙත් කලාපය තුළ පිහිටි ගොඩබිම් දූපතක් (Land- Island) ලෙස පිළිගැනේ. ශ්‍රී ලංකාවේ ඊසානදිගට ගලා බසින මෙරට වන විශාලම ගංගාවේ මොහොර (Catchment) කලාපය ලෙස සැළකෙන්නේ දුම්බර කඳුකර කලාපයයි. ශ්‍රී ලංකාවේ වාර්තා වන මත්ස්‍ය විශේෂ 95 අතුරින් විශේෂ 29 ක් පමණ මෙම කලාපයෙන් වාර්තාවේ. ඒ, අතුරින් විශේෂ 09ක් ලංකාවට ආවේණික මසුන් වේ. ඒ, අතුරින් දුම්බර පෙතියා (Systomus martenstyni), ශ්‍රී ලංකා පෙතියා (Dawkinsia srilankensis), දුම්බර කරඅඳයා (Laubuka insularis, ගඩයා (Labeo fisheri) මෙම ප්‍රදේශයට ම පමණක් සීමා වී ඇති ලංකාවට ආවේණික විශේෂ වීම ඉතා වැදගත් ය. එහෙත් ශ්‍රී ලංකා පෙතියා සහ දුම්බර පෙතියා නකල්ස් කඳුකර කලාපයේ මෙන්ම මහවැලි දෝණියේ පහත් කලාපවලින් ද වාර්තා වේ.

## උභයජීවී විවිධත්වය

නකලස් කඳුකරය ආශ්‍රිතව පවතින්නා වූ විවිධ වූ දේශගුණික තත්වයනට අනුව හැඩගැසී ඇති එකිනෙකට වෙනස් වූ පරිසර පද්ධතීන් ආශ්‍රිතව

# බටදඹු කඳුවැටිය...



කළු ගඟ ජලාශ සීමාවේ සැරිසරන
එක් දළයක් සහිත ඇතා



කඳුකර වියළි සදාහරිත වනාන්තර



*Lankascincus fallax*



*Sri Lanka wood pigeon*



දූම්බර කඳුවැටියෙහි සුන්දර දසුනක්



*Cruiser*

ලංකාවේ දැනට වාර්තා වී ඇති උභයජීවී විශේෂ 118 න් විශේෂ 28ක් වාර්තා වන අතර ඉන් විශේෂ 19ක් ලංකාවට ආවේණික වන අතර එයින් විශේෂයන් 09ක් දූම්බර අඩවියටම පමණක් සීමා වූ විශේෂ වේ. එම විශේෂ 09 වන්නේ *Nannophrys marmorata, Lankanectes pera, Pseudophilautus fulvus, Pseudophilautus hankeni, Pseudophilautus asankai, Pseudophilautus macropus, Pseudophilautus mooreorum, Pseudophilautus steineri iy Pseudophilautus stuarti* වේ. දූම්බර අඩවියේ වනාන්තර පරිසර පද්ධතීන් ආශ්‍රිතව ජීවත් වන මෙතෙක් සොයා නොගත් උභයජීවී විශේෂයන් පිළිබඳව තවමත් පර්යේෂණ සිදු වෙමින් පවතී.

## සමනල විවිධත්වය

මෙම අපූරු කඳුවැටිය තවත් හැඩගන්වමින් මෙහි සුන්දරත්යව දෙගුණ තෙගුණ කිරීමට මෙහි තැනින් තැන පියාසලන සමනලුන් ද මහත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. දැනට මෙම වන බිමේ දී ශ්‍රී ලංකාවේ වාර්තා වන සමනල විශේෂ 246 න් විශේෂ 75ක් පමණ හමු වේ. ඒ අතුරින් *Autumn Leaf, Club Beak, Lobed Beak, Small Leopard, Great Orange Tip, Painted Sawtooth, Black Prince Ceylon Tiger, Banded Peacock, Common Tinsel, Silver Streak Blue, Spot Swordtail, Tamil Lacewing Chestnut Streaked Sailor, Gaudy Baron, Indian Nawab, Cruiser, Clipper, Redspot Duke, Danaid Eggfly Common Castor, Angled Castor, Tawny Rajah, Autumn Leaf ,Rustic, Tamil Yeoman, Hedge Hopper, Giant Red Eye, Dark Palm Dart* වැනි විශේෂ වැදගත්කමක් උසුලයි.

ඉහත දක්වුණු පාරිසරික, ජෛව විද්‍යාත්මක,ප්‍රාග් ඓතිහාසික හා ඓතිහාසික තොරතුරු අපට කියන්නේ දූම්බර අපගේ මහාර්ඝ උරුමයක් බව ය. එහෙත් අසන්නට හා දකින්නට ලැබෙන දේවල් වල හැටියට දූම්බර අනාගතය එතරම් සුබදායී නොවනු ඇත. රජයේ රැකවරණය ලබන ඉහළ ම තැන්වලින් අද දූමබර වනපෙත නිරුවත් කර මහා පරිණත සංචාරක බංගලා ඉදිවෙමින් පවති. හෝටල් ඉදි කරති. අද වන විට නකල්ස් සංරක්ෂිත වනාන්තරය තුළ ගිරිස්වත්ත, කොස්ගොල්ලවත්ත, කුඹුක්ගොල්ලවත්ත, ලූල්වත්ත, කෝබට් ගැප්, ගෝනමඩවත්ත පතන හා සුදුගල යන නකල්ස් සංරක්ෂිත වනාන්තරයට පවරා ගැනීමට නියමිත ප්‍රදේශවල හෝටල් ඉදි කරමින් පවතී. සංශෝධිත 1951 අංක 25 දරණ පාංශු සංරක්ෂණ පනත යටතේ දූමුබර කඳුකරය ආවරණය වන ප්‍රදේශ 2008 මැයි 22 වන දින අංක 1550 /9 දරණ ගැසට් නිවේදනය මගින් සංරක්ෂණ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයටපත්කර තිබේ.මෙම ප්‍රදේශවල මානව ක්‍රියාකාරකම් සීමා කර ඇති අතර ජාතික පාරිසරික පනත යටතේ ප්‍රකාශිත 1993 ජූනි 24 දින අංක 772/22 දරණ ගැසට් නිවේදනයට අනුව පාංශු සංරක්ෂණ පනත යටතේ ප්‍රකාශයට පත් කළ යම් ප්‍රදේශයක් තුළ සංවර්ධන ක්‍රියාකාරකම් සිදු කිරීමට ප්‍රථම පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලියට කටයුතු කර අදාළ පූර්ව ලිඛිත පාරිසරික අනුමැතිය මධ්‍යම පරිසර අධිකාරියෙන් ලබා ගත යුතුය. ඉහත එකම ඉදි කිරීමක් සඳහාවත් මෙම අනුමැතිය ලබා ගෙන නොමැත. ඒවා සියල්ල අනවසර හා නීති විරෝධී ඉදි කිරීම් ය. එබැවින් මෙම නීතිමය ප්‍රතිපාදනයන් භාවිතා කර දූම්බර කඳුකරයේ මෙම සියලුම හානිකර සංවර්ධන ක්‍රියාකාරකම් පාලනය කිරීමේ හැකියාව ඇත. නමුත් මෙම නීති මධ්‍යම පරිසර අධිකාරියෙන් ක්‍රියාවේ නොයොදවන්නේ කුමක් නිසාදැයි අපට ගැටළුවකි. දූම්බර ලලන පැළැඳි ශ්වේත සළුපිළි කිළිටි කර ඉන් පෝෂණය ලබන වනපෙත හැඩ වූ දූමින් බර දූම්බර වැනසීමේ කතන්දර ය ආරම්භ වන්නේ අපගේ සෙසු කඳුකර වනාන්තර වලට ද කණකොකා හැඩ වූ බ්‍රිතාන්‍ය පාලකයින් මෙහි පය තැබූ තැන් සිටය. ඔවුහු මේ කඳුකර වන බිම් එළිපෙහෙළි කර තේ හා කෝපි වගාව මෙහි ව්‍යාප්ත කළෝය. ඒ යටත් විජිත චින්තනයෙන් මඬනා ලද අපගේ වර්තමාන කලු සුද්දෝ අද ද තේ හා කෝපි නැතත් මෙහි වනපෙත එළිපෙහෙළි කරමින් එනසාල් වගා කරති. පතන් බිම් වලට ගිනි තබති. වනබිමේ උරුමකරුවන් වූ සතුනට ගිනිබිඳිති, කළු ගඟ හා මොරගහකන්ද මහා පරිමාණ ව්‍යාපෘති වලට පින් සිද්ධ වන්නට දූම්බර අඩවියට අයත් වන බිම් රැසක් මේ වන විට දියට අභිමිව යමින් පවතී. ඉඳින් සුදෝ සුදු සළු ඇත්මැත් කොට යුග ගණනක් තිස්සේ සිය දරු කැළ ද රැක ගනිමින් අපූරු රංගනයක යෙදෙන සුන්දර දූම්බර අංගනා වට මේ නො පණත්කම් තවත් ඉවසා සිටිය නොහැක. එම නිසා අපගේ ජාතික උරුමයක් වන මෙම දූම්බර කඳුවැටිය මතු පරපුර උදෙසා රැක ගැනීම අප කාගේත් යුතුකමක් නොවන්නේ ද.



*Pseudophilautus steineri*



*Semnopithecus vetulus monticola*






*Phaius wallichii*









මීටර 1600ට වඩා උස් බිම්වල ඇති පිග්මි වනාන්තර





This tiger picture was taken at Nagerhole Tiger Reserve in the state of Karnataka in South India. The tiger, being the national animal of India, is a charismatic species and an attraction for wildlife photographers and nature lovers worldwide.

This picture was taken after a brief spell of rainfall, and the animal was enjoying the small pool formed by the rain.

*Image curtesy – Byju H*

# ගසක් කථා කරයි

- වීණාවී සිල්වා -

ආදරණීය දුවේ පුතේ, ගසක් කියලා කියන්නේ ස්වභාවදහමේ අපූර්ව නිමැවුමක්. පොළොව ගැඹුරට මුල් විහිදුවමින් මහපොළොව බදාගෙන ආකාසේ දෙසට අතු පතර විහිදවන ස්වාභාවදහමෙන් පැවරුණු භාරදූර රජකාරි අකුරටම ඉෂ්ඨ කරන, එහෙත් ඒ වෙනුවෙන් කිසිත් යලි බලාපොරොත්තු නොවන නිහඬ සේවයේ යෙදෙන ජීවීන් කොටසක්. ජල චක්‍රය, කාබන් චක්‍රය, පරිසර උෂ්ණත්ව යාමනය, ඊට අමතරව අනෙකුත් ජීවීන් ගේ පැවැත්මට අත්‍යවශ්‍ය අහාර සහ ඔක්සිජන් සපයාදීමත් අප විසින් සිදුකරන මහගු සේවාවන් අතර වනවා. එලෙසම අප සෙවණට එන ඕනෑම ජීවියෙකුටම තරාතිරම නොබලාම අවශ්‍ය සිසිලස, සෙවණ හා මානසික සුවය ලබාදීමටත් අපි සැදී පැහැදී සිටින්නේ එක සිතින්මයි.

එහෙත් මිනිස් ඔබට! ගසක් කථා කරයි කියන්නේ විහාගයක් සමත් වන්නට ලියන රචනාවක මාතෘකාවක් පමණයි. නුඹලාට දැන් අපේ වටිනකම අපේ තියෙන කඳන් පරිමාවට සීමාවෙලා. කාසි පස්සේ දුවන නුඹලට නුඹේ මුල් අමතක වෙලා. එත්.. ඇත්තටම ගස් කථා කරනවද? අපොයි ඔව් ! හැබැයි හැමෝටම ඇහෙන්නේ නෑ. ඇත්තටම ඇහුම්කන් දෙන අයට විතරයි. අපි ඇත්තටම කථා කරනවා, සමහර වෙලාවට අපේ තියෙන වේදනාව කෑගහල කියනවා. හැබැයි බහුතරයකට ඇහෙන්නේ නම් නෑ. නුඹේ මේ වර්තමාන පරම්පරාව ඒ තරමටම ආත්මාර්ථකාමීයි, අසංවේදීයි. නුඹලාට සාපේක්ෂව නුඹේ මුතුන් මිත්තන් අපට ඇහුන්කම් දුන්නා, අපෙන් ප්‍රයෝජන ගත්තා, අපිට යලි වැඩෙන්න ඉඩ දුන්නා, අපිව හූරන්කෑවේ නෑ. ඒ උන්දැලා අපිත් එක්ක සමාදානෙන් ජීවත් උනා, අපිව පරිස්සම් කළා, ඒ නුඹලා වෙනුවෙන්. එහෙත් ඔබේ දරුවන්ට?

තාක්ෂණයට යටවුනු නුඹලා සීත කරපු වාහන වල යන්න එන්න, සීත කරපු ගෙවල්වල ජීවත් වෙන්න පුරුදු වුණා. ඇත්තටම නුඹලට ගසක් යට හිඳින විට දැනෙන සිසිලස, සුවය, නිස්කලංකබව, නැවුම්බව අමතක වෙලා ගියා. තුරඟ තරඟයක ජීවත් මිනිසුන් සේ ඔහේ දුවනවා. හති වැටුනත් නවතින්න විදිහක් නැතුවම.

නුඹලාට දැන් මතක නෑ; නුඹ, අපි සහ අනෙකුත් සෑම ජීවියෙක්මත් එකම සොබාදහම් මාතාවගේ දරුවන් බවත්, ඇය හමුවේ අපට ඇත්තේ එකම වටිනාකමක් බවත්, අප අයිති ඇයට මිස, ඇය අපට අයිති නැති බවත්. නුඹලාගේ ඇති තමන් සියල්ලටම වඩා උසස් යන ආකල්පත් සමඟ නුඹ අපට කරන විනාශය සාධාරණීකරණය කරගන්න පටන් අරන්. එහෙත් ඔබ ඇත්තටම සිතනවාද මවක් විදිහට ස්වාභාවදහම් මාතාව ඔබේ සහෝදරයාට කරන විනශයට ඉඩදේවි කියා. ඉදින් නුඹලා දැන්වත් සංවේදී වී සහජීවනයෙන් (Coexist) ජීවත් වීමට කටයුතු නොකළහොත් නුඹලාට මවකගේ ශාපයට මුහුණදෙන්නනට සිදුවේවි. එදිනට ඔබගේ සියලු මොරගෑම් හා වේදනාත්මක කෑගෑම් වලට ඇය බිහිරි වේවී.



# கடற்பஞ்சுகள் (Marine sponges)

ரமேஸ்குமார் நிருஜன், துளசிதா வில்லியம் சாந்தகுமார்

## அறிமுகம் (Introduction)

பஞ்சுயிரிகள் கணம் பொறிபெரா (Porifera) வினுள் உள்ளடக்கப்படுகின்ற நீர்வாழ் விலங்குகளாகும் (Kingdom: Animalia). இவை பஞ்சுயிரி அல்லது பஞ்சுடலிகள் எனவும் அழைக்கப்படுகின்றன. இவை புவியில் முதலில் தோன்றிய பல்கல அங்கிகள் எனவும் அனுமானிக்கப்பட்டுள்ளது. இவை பொதுவாக ஓரிடத்தில் ஒட்டி வாழ்பவை ஆகும். இதுவரை உலகில் ஏறத்தாள 9452 இனங்கள் கண்டறியப்பட்டுள்ளன. இவற்றில் 150 இனங்கள் நன்னீர் வாழ்க்கைக்குரியவையாகும். ஏனையவை கடல்வாழ்க்கைக்குரியவையாகும். எனவே பெரும்பாலானவை கடலில் வாழ்பவை ஆகும். எனவே இவை கடற்பஞ்சுகள் என அழைக்கப்படுகின்றன. நமது நாட்டு கடற்பரப்பில் ஏறத்தாள 300 கடற்பஞ்சு இனங்கள் கண்டறியப்பட்டுள்ளன. கடற்பஞ்சுகள் பிரதானமாக கல்கேரியா (Calcarea), கோமோஸ்கெலரோமோபா (Homoscleromorpha), டெமோஸ்பொஞ்சியே (Demospongiae), கெக்ஸ்ஸக்ரினெல்லிடா (Hexactinellida) ஆகிய 4 வகுப்புக்களாக வகைப்படுத்தப்பட்டுள்ளன.

இவை மிகவும் எளிய உடற்கட்டமைப்பைக் கொண்டவையாகும். உடலானது இரு படைகளை உடையதாகும். உடலின் வெளிப்புறத்தில் உள்ள படை புறப்படை (Ectosome) என அழைக்கப்படும். இது பினாக்கோசைட்டுக் (Pinacocytes) கலங்களினால் உருவாக்கப்பட்டதாகும். உடலின் உட்புறத்தை ஆக்கும் படை அகப்படை (Endosome) என அழைக்கப்படும். இது நீண்ட உணர் இழைகளையுடைய (Flagella) கொலர் கலங்களால் (Collar cells / Choanocytes) ஆக்கப்பட்டவையாகும். புறப்படை மற்றும் அகப்படை என்பன வழுவழுப்பான பசைப்படையினால் (Mesoglea) வேறுபடுத்தப்படுகின்றன. இது ஸ்கெலரோசைட்டுக்கள் (Sclerocytes) மற்றும் அமீபாக்குழியங்கள் (Amoebocytes) போன்ற பல்வேறுபட்ட கலங்களையுடைய ஒரு தொடுப்பிழையப்படையாகும் (படம் 1). அத்துடன் இவ்விழையம் நுண்முட்கள் (Spicules) மற்றும் பஞ்சு நார்களை (Sponginfibers) கொண்டிருப்பதன் மூலம் பஞ்சுயிரிகளிற்கு வன்கூட்டையும் வழங்குகின்றது. அத்துடன் பஞ்சுயிரிகளின் கல ஒருங்கிணைப்பையும் வடிவத்தையும் பேணுவதில் பெரும் பங்காற்றுகின்றன. நுண்முட்கள் பசைப்படையிலுள்ள ஸ்கெலரோசைட்டுக்களினால் (Sclerocytes) சுரக்கப்படுகின்றது. இவை கல்சியம் காபோனேற்றினால் ($CaCO_3$) அல்லது சிலிக்காவினால் ($SiO_2$) ஆக்கப்பட்டவையாகும் (படம் 2).

## உடற் கட்டமைப்பு (Structure of the body)




படம் 1. கடற்பஞ்சின் உடற்கட்டமைப்பு




படம் 2. கடற்பஞ்சின் நுண்முட்கள் (Spicules)

# கடற்பஞ்சுகள் (Marine sponges)...




**படம் 3.** கடற்பஞ்சின் உடலமைப்புக்கள்



**படம் 4.** *Cliona celata* (Yellow colour)



**படம் 5.** கடற்பஞ்சு மற்றும் நொருங்கு நட்சத்திரம் என்பவற்றின் ஒன்றியவாழிட்டம்

கடற்பஞ்சுகள் அஸ்கொன் (Ascon), சைகொன் (Sycon), லியூகொன் (Leucon) ஆகிய மூன்று பிரதான உடலமைப்புக்களில் காணப்படுகின்றன. இவ் உடலமைப்புக்கள் கடற்பஞ்சுகளின் வடித்துண்ணலை அதிகரிப்பதில் பெரும் பங்காற்றுகின்றன. அஸ்கொன் (Ascon), சைகொன் (Sycon) மற்றும் லியூக்கொன் (Leucon) என்ற ஒழுங்கில் இவற்றின் உடலின் சிக்கற்தன்மை அதிகரிக்கின்றது (படம் 3).

## உணவூட்டம் (Feeding)

கடற்பஞ்சுகளின் உடலினது பக்கச்சுவர்கள் ஏராளமான புரைகளைக் (Pores) கொண்டுள்ளன. இந்தத் துளைகள் வழியே நீரானது அதன் உடலினுட் சென்று பொதுவான துளை (Osculum) வழியே நீரானது வெளியேற்றப்படுகின்றது. இதன் மூலம் உணவூட்டம், கழிவகற்றல் மற்றும் சுவாசம் ஆகிய செயன்முறைகள் நடைபெறுகின்றன. உணவூட்டலின்போது நீரோட்டத்தின் மூலம் வரும் நீரில் மிதக்கும் அழுகிய சிறிய துணிக்கைகளையும் பக்றீரியாக்களையும் மற்றும் ஏனைய தனிக்கலவுயிரிகளையும் (Unicellular organisms) உணவாக உட்கொள்வதன் மூலம் தம்மைச் சுற்றியுள்ள நீரை வடிகட்டுகின்றன. இதன் மூலம் நீரின் கலங்கற்தன்மையை குறைப்பதில் பெரும்பங்காற்றுகின்றன. இதனால் இவை வடித்துண்ணிகள் (Filterfeeders) என அழைக்கப்படுகின்றன. உள்ளெடுக்கப்பட்ட உணவுத் துகள்கள் அமீபாக்குழியங்களினால் உட்கொள்ளப்பட்டு சீரணக் குமிழியை உண்டாக்குவதன் மூலம் சமிபாடடையச் செய்யப்படுகின்றது. சில கடற்பஞ்சு இனங்கள் (*Cliona* sp) பவளப் பாறைகளின் மீது ஒட்டுண்ணிகளாக காணப்படுவதுடன், பவளப்பாறைகளின் சிதைவுக்கும் காரணமாகின்றன (படம் 4).

## இனப்பெருக்கம் (Reproduction)

இவை இலிங்கமுறை (sexual) மற்றும் இலிங்கமில்முறை (Asexual) மூலமாக இனப்பெருக்கம் செய்கின்றன. இலிங்கமில்முறை இனப்பெருக்கம் பிரதானமாக அரும்புதல் (Budding) மூலம் நடைபெறுகின்றது. இதன்போது வாய் (Osculum) இல்லாத பகுதியில் அரும்பி (bud) வளர்ந்து பின்னர் உடைந்து வளர்ச்சிக்கு சாதகமான இடத்தில் ஒட்டி வளர்கின்றது.

இலிங்கமுறை இனப்பெருக்கம் பசைப்படையிலுள்ள மூலக்கலங்களிலிருந்து உருவாகும் விந்துக்கள் மற்றும் முட்டைக் கலங்கள் நீரில் விடப்பட்டு புறக்கருக்கட்டலடைவதன் (External fertilization) மூலம் நடைபெறுகின்றது. கருக்கட்டப்பட்ட முட்டையானது கருமுட்டை (Zygot) என அழைக்கப்படும். இது பிளவுபடலிற்குட்பட்டு (Cleavage) முளையமாக (Embryo) விருத்தியடைகின்றது. முளையம் விருத்தியடைந்து குடம்பி (larva) பருவத்தை தோற்றுவிக்கின்றது. இக் குடம்பிப் பருவங்களே, உணர் இழைகளையுடைய கடற் பஞ்சுகளின் ஒரேயொரு அசையக்கூடிய படிநிலைகளாகும் (motile stage). இவை நீரில் நீந்திச் சென்று நீண்ட சுதந்திர வாழ்வுக்குப் பின் வளர்ச்சிக்கு சாதகமான இடங்களில் ஒட்டி மேலதிக விருத்தியடைகின்றன.

## சூழலியல் முக்கியத்துவம் (Ecological importance)

கடற்பஞ்சுகள் பவளப்பாறைகளைப் போன்று அனேக அங்கிகளுக்கு வாழிடமாக செயற்படுகின்றன. இறால், நண்டு, நொருங்கு நட்சத்திரம், பொலிகீற்றுக்கள் (Polychaetes), மென்னுடலிகள் (Mollusca) மற்றும் அல்காக்கள் ஆகியன கடற்பஞ்சை வாழிடமாக பயன்படுத்தும் சில அங்கிகளாகும் (படம் 5). அத்துடன் கடற்பஞ்சுகள் கடலாமைகள் (Turtles), நட்சத்திரமீன்கள், மீன்கள் மற்றும் நண்டுகள் போன்ற அங்கிகளுக்கு உணவாக அமைகின்றன. இவை நீரில் உள்ள மாசுத் துணிக்கைகளை வடித்துண்ணலின் மூலம் அகற்றி நீரின் தெளிவுத்தன்மையை அதிகரிக்கின்றன. கனியுப்புக்களின் மீள் சுழற்சியிலும் பெரும்பங்காற்றுகின்றன. கடற்பஞ்சுகள் பொதுவாக மாசாக்கிகளுக்கு மிகவும் உணர்திறன் கூடியவையாகும். எனவே கடலில் உலோக மாசுக்களின் மாசாக்கத்தை இனங்காண இவை உயிரியல் காட்டிகளாக (Biological indicators) பயன்படுத்தப்படுகின்றன. கடற் பஞ்சுகளின் உருவவமைப்பு, வளர்ச்சியில் ஏற்படும் மாற்றத்தின் அடிப்படையிலும் உடற்சாற்றின் ஆய்வின் அடிப்படையிலும் இவ் உலோக மாசாக்கம் கண்டறியப்படுகின்றது.




**படம் 6.** மண்டைதீவில் அடையாளம் காணப்பட்ட சில கடற்பஞ்சுகள.

## பொருளாதார முக்கியத்துவம் (Economical importance)

கடற்பஞ்சுகள் இழைய நிலைக்குரிய, பௌதீக பாதுகாப்பு பொறிமுறைகளைக் கொண்டிராத உயிரங்கிகளாகும். இதனால் இவை பல்வேறுபட்ட துணையான அனுசேப விளைவுகளை (Secondary metabolites) உருவாக்குவதன் மூலம் தமது பாதுகாப்பு பொறிமுறைகளை அதிகரிக்கின்றன. இவை அனுசேபத் தாக்கங்களின் போது இடைநிலை விளைவாக தோற்றுவிக்கப்படுகின்றன. ரேபீனொயிட்டுக்கள் (Terpenoids), அல்கலொயிட்டுக்கள் (Alcaloides), ஸ்ரீரொயிட்டுக்கள் (Steroides), பெப்ரைட்டுக்கள் (Peptides) மற்றும் பல்பெப்ரைட்டுக்கள் (Polypeptides) ஆகியன சில துணையான அனுசேப விளைவுகளாகும். இவ் அனுசேப விளைவுகள் இரைகௌவிகளிடமிருந்தும் ஏனைய வளர்ச்சியைப் பாதிக்கும் உயிரங்கிகளிடமிருந்தும் கடற்பஞ்சிற்கு பாதுகாப்பை வழங்குகின்றன. சில கடற்பஞ்சுகள் ஏனைய அங்கிகளுடன் ஒன்றியவாழீட்டத்தில் வாழ்வதன் மூலம் தமது பாதுகாப்பு பொறிமுறைகளை அதிகரிக்கின்றன. கடற்பஞ்சுகளில் காணப்படும் பல்வேறு உயிர் இரசாயனப்பதார்த்தங்கள் விஞ்ஞானிகளினால் புதிய மருந்துப் பொருட்களின் உற்பத்தியிலும், விவசாய இரசாயனங்களின் உற்பத்தியிலும், பக்றீரியா, பங்கசு மற்றும் வைரசுக்களுக்கெதிரான பதார்த்தங்களின் உற்பத்தியிலும் பயன்படுத்தப்படுகின்றன. உதாரணமாக புற்றுநோய்க்கான மருந்து தயாரிப்பில் *Discodermia calyx, Spongia* sp. மற்றும் *Spirastrella* sp. போன்ற கடற்பஞ்சுகள் பயன்படுத்தப்படுகின்றன. அத்துடன் பக்றீரியாக்களுக்கெதிரான பதார்த்தங்களின் தயாரிப்பில் *Callyspongia diffusa* எனும் கடற்பஞ்சு பயன்படுத்தப்படுகின்றது.

எனவே கடற்பஞ்சுகள் சூழலியல் மற்றும் பொருளாதார முக்கியத்துவம் வாயந்த அங்கிகளாகும். வடமாகாணக் கடற்பரப்பில் பரந்துபட்டுக் காணப்படுகின்றன. எனினும் இவற்றின் இனப்பாகுபாடு தொடர்பான தகவல்கள் இன்னும் பூரணமாக கண்டறியப்படவில்லை. சமீபத்திய ஆய்வின் அடிப்படையில் 30 கடற்பஞ்சு இனங்கள் மண்டைதீவில் இனங்காணப்படடுள்ளன. இவற்றில் *Callyspongia diffusa, Mycale tenuispiculata, Spheciospongia inconstans* மற்றும் *Spongia officinalis* போன்ற சில பொருளாதார முக்கியத்துவம்வாய்ந்த இனங்களும் உள்ளடங்குகின்றன (படம் 6).

# පරාගනය සඳහා ඕකිඩ් දක්වන අනුවර්ථන

- ඉමදූව ප්‍රියදර්ශන -

ස්වයං පරාගනයට අනුවර්තනය නොවුනු ඕනෑම සපුශ්පික ශාකයක පරාගනයට ජීවී හෝ අජීවී භාහිර සාධකයක් අත්‍යවශ්‍ය බව අප ප්‍රායෝගිකවම දනිමු. අජීවී සාධකයන් වන වා සුළං හෝ ජල ධාරවන් මගින් මේ ආකාරයට සහය ලබා ගන්නා සමහර පුෂ්පයනට අමතරව, බොහෝමයක් ශාක ලොකයේ තුරු ලතා අනුවර්තනය වන් නේ පරාගනය උදෙසා යම් ජීවියෙකුගේ සහය ගැනීමයි.

සපුශ්පීය ශාක ලොවෙහි සුවිශේෂී පුශ්පික අනුවර්තන රැසකට හිමිකම් කියන උඩවැඩියා ශාකයද සිය ප්‍රජනන ක්‍රියාවලිය උදෙස විකාශනය වී ඇති ආකාරය විශ්මය දනවන සුලුය. මේ සඳහා කුහුඹුවන්, වේයන්, පක්ශීන්, හුනන්, මීයන් වැනි සත්ව කාණ්ඩ සමඟ විවිධ ආකාරයේ සම්බන්ධතාවයන් පවත්වන ආකාරය නිරීක්ෂණය බොහෝ පහසුය.

ඉතාමත්ම සාධාරණ අන්‍යෝන්‍ය සහසම්බන්ධතාවයක සමපල නෙලා ගන්නා ආකාරයේ පරාගනයක ප්‍රතිඵලය වනුයේ පුශ්පයක් විසින් සිය පරාගනයට උපයෝගී කරගන්නා පරාග වාහකයා හට යම් ආකාරයක ප්‍රතිලාභයක් ලබා දී සිය අභිප්‍රාය වන සාර්ථක පරාගනයක් සිදු කරවා තම පරපුරේ පැවැත්ම පිරිපුන් බීජ නිශ්පාදනයක් තුලින් පවත්වා ගැනීමයි. මෙහිදී පරාග වාහකයාට ලබාදෙනු ලබන ප්‍රතිලාභය, එම වාහාකයාගේ ආහාරය හෝ සාර්ථක ලිංගික සහකරුවෙකු සොයා ගැනීමකට අවශ්‍ය කරන්නා වූ රසායනික සංඝටකයක් හෝ විය හැක.

මෙසේ ලබා දෙන්නාවු රසායනික ස්‍රාවය, පරාග වාහකයා හට සිය සහකරුවා හෝ සහකාරිය සොයා ගැනීමට හෝ තමා වෙත ගෙන්වා ගැනීම උදෙසා නිදහස් අවකාශයට මුදා හල හැකි සුවිශේෂි සුගන්දයක් නිකුත් කරන ද්‍රාවනයක් හෝ එම ද්‍රාවනය සිය අඟ පසෙහි තවරා ගත් කල ලැබෙන්නාවූ දීප්තිමත් ස්වභාවය හෙතුවෙන් වෙනත් එම වර්ගයේ සුදුසු ලිංගික සහකරුවනට ඔහු හෝ ඇය වෙත පැමිනීම උදෙසා කෙරෙන්නා වූ සුවිශේෂී ආකර්ශනීය උත්දීපනයක් විය හැකිය.

මෙවැනි පරිත්‍යාගයකින් සිය පරාග වාහකයා තෘප්තිමත් කිරීම සඳහා අනුවර්තනය වූ ලාංකික උඩවැඩියා පිලිබඳව විද්‍යාත්මක සාධක සහිත උදාහරණ දුලභ ඌවද, සීනි සහිත අහාරමය ද්‍රාවනයන් සිය අධරිකාවෙහි අග නිර්මාණය කරගත් අධරිකා පැසක හෝ කෙණ්ඩියක ආධාරයෙන් සිය පරාග වාහකයාට පරිත්‍යාග කර තම අභිප්‍රායන් ඉටු කර ගැනීමට අනුවර්තනය වූ ලාංකික උඩවැඩියාවනට කදිම උදාහරණ ලෙස *Robiquetia virescens* හෝ *Peristylus aristatus* මෙන්ම *Habenaria dichopetala* යන විශේෂයන් හුවා දැක්විය හැක.

ඕනෑම උඩවැඩියාවක ව්‍යාප්තිය උදෙසා පවතින වැදගත්ම අනුවර්තනයක් වන, සියළුම ආකාරයේ උඩවැඩියාවන්, කුමනාකාරයක ස්තරයක් මත පතිත වී සිය දිවි මෙන්ම ව්යාප්තිය පවත්වා ගැනීම සඳහා අනුවර්තනය වූවද, මේ සෑම ස්තරයකම පවතින පොදු ලක්ශනයක් වන්නේ එම ස්ථර බොහෝමයක් ඉතාමත් නිසරු හෝ ශුෂ්ක පරිසර පද්ධති වීමය. මේ හේතුව නිසාම උඩවැඩියාවන් බොහෝමයකට සිය පැවැත්ම ස්ථාපිත කර ගැනීම උදෙසා ඇත්තෙ ඉතාමත්ම සීමිත වූ සම්පත් ප්‍රමාණයකි. එම නිසා බොහොමයක් උඩවැඩියාවනට තම පෝශනය උදෙසා පමණක්ම එම සම්පත් භාවිතා කරන අතරම, තම පරාගන ක්‍රියාවලිය සඳහා තොරාගන්නා පරාගන සහායකයාට පරිත්‍යාග කිරීමට පෝශන හෝ වෙනත් අකාරයක ප්‍රදානයන් සඳහා සම්පත් අවභාවිතා කිරීමට ඉඩ ප්‍රස්තා නැති තරම්ය. මේ හෙතුව නිසාම, ඔවුනගේ අනුවර්තනය වී ඇත්තේ ප්‍රයෝගකාරීව එම සහායකන් තමා වෙත ගෙන්වා ගැනීමට සිදු විමකි. මේ ආකාරයට ප්‍රයෝගකාරී වීමේදි සිදු වෙන තවත් අනුවර්තනයක් වනුයේ සෑම ප්‍රයෝගකටම රැවටිය හැකිවනුයේ ඉතාමත් සීමිත සහායක විශේෂයක් හෝ විශේෂකීපයක් පමණක්ම වීමයි. මෙම අනුවර්තනයේ භයානකම අතුරු ඵලය වන්නේ, මෙවන් උඩවැඩියා විශේෂ සියල්ලම සිය වර්ගයාගේ පැවැත්ම එකම එක වාහකයෙකුගේ පැවැත්ම මත රඳවනවා පමණක්ම නොව, එම වාහකයාගේ පැවැත්ම උදෙසා පවතින යම් ආකරයක තර්ජනයක් ඉවත් කිරීමට හෝ පැවත්මක් ස්තාපිත කිරීමක් උදෙසා කිසිමාකාරයක රුකුලක් හෝ ලබා දිම සඳහා පවතින නොහැකියාවය.

පරාගන ප්‍රයෝගන්හීදි උඩවැඩියාවන් බොහෝමයක් භාවිතා කරන ප්‍රයෝගයනට මුලිකවනුයේ සිය තෝරා ගත් වාහකයාගේ ලිංගික කියාවලියට අවැසි සහකරුවා හෝ සහකාරිය හා සබැඳි ප්‍රයොගයන්ය. මෙවන් ප්‍රයොගකාරී පරාගනයන් "ලිංගික ප්‍රයෝග කාරී පරාගන" *(Polination by sexual deception)* කාන්ඩය ලෙසටද එසේ නොවන සෑමාකාරයකම පරාගන ප්‍රයෝගයන් "අලිංගික ප්‍රයෝගකාරී පරාග න" *(Polination by asexual deception)* කාන්ඩය ලෙසටද වෙන වෙනම සාකච්චා කල හැකිය.

මෙහිදී, "ලිංගික ප්‍රයෝගකාරී පරාගන" කාන්ඩය යටතේ පවතින අනුවර්තන සලකා බැලීමෙදී, සමහරක් විශේෂයන් වාහකයාගේ ආකර්ශනය දිනීම සඳහා ඔවුනගේ සහකරු හෝ සහකාරිය, වාතයට මුදා හැරීමට අනුවර්තනය වී ඇති ආකරයටම ඔවුනගේ පෙරමෝනයට සමානවූ ගන්දයක් සහිත රසායනික ස්‍රාවයක් වාතලයට මුදා හැරීම මගින්, සිය වාහකයාව තමන් වෙත ආකර්ශනය කර ගනී. වාහකයා සිය සහකාරිය සොයමින් මල මත මෙන්ම මලෙහි අධරිකාව මත කෙරෙන සංචරනයේ ප්‍රතිපලක් වන්නේ මලෙහි ප්‍රධාන ලිංගික අවයවය වන ස්ථම්භය *(Column)* අග







**“සපුශ්පීය ශාක ලොවෙහි සුවිශේෂී පුශ්පික අනුවර්තන රැසකට හිමිකම් කියන උඩවැඩියා ශාකයද සිය ප්‍රජනන ක්‍රියාවලිය උදෙස විකාශනය වී ඇති ආකාරය විශ්මය දනවන සුලුය.”**

පවතින පරාග පිංඩයන් *(Pollinia)* සිය සිරුර මතු පිට ඉතාමත්ම සුක්ශම ලෙස තම අනු දැනුමටත් පරිභාහිරව අලවා ගැනීමයි. මෙම ක්‍රියාවලියේ සාර්ථකභාවය රඳා පවතිනුයේ එම වාහකයාම නැවැතත් ඒ අකාරයේම පුශ්පයක් තුලින් නිකුත්වන පෙරමොනයට රැවටී සිය සහකරු නැවතත් සොයා යෑමේදී ප්‍රථමයෙන් අල්වාගත් පරාග පිංඩ දෙවන පුශ්පයේ කලන්කය *(Stigma)* මත පතිත කරවා මලෙහි පරාගන ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමෙනි. මෙවන් උඩවැඩියාවන්ගේ එම සුවද හෝ එය මුදවා හැරීමෙන් ගෙන්වා ගන්නා වාහකයන් පිළිබඳව පැහැදිලි විද්‍යාත්මක පරීක්ශන ලංකාව තුල පවත්වා නැති මුත්, *Vanda tessellata* මෙවන් විශේෂයකට අප රට තුල වැඩෙන උඩවැඩියා ප්‍රජාව අතුරින් කදිම නිදසුනකි.

”ලිංගික ප්‍රයෝගකාරී පරාගන” ක්‍රියාවලිය යටතේ ගත හැකි දෙවන ප්‍රයෝගය වනුයේ පුශ්පයක් බොහෝ විට සිය අධරිකාව ඔවුනගේ වාහකයාගේ සහකාරියගේ ස්වරුපයට සමාන ස්වරූපයකට හැඩ ගන්වා ගැනීමයි. මෙහිදීද පරාග වාහකයාගේ ඒකායන බලාපොරොත්තුව වන්නේ සිය සහකාරිය සමග සහවාසයේ යෙදීම වන අතර එසේ ක්‍රියාත්මක වීමට එවන් අධරිකාවක් මත සිදු කරන්නාවූ හැසිරීම් රටාව අනුව එම උඩවැඩියාව සිය ස්ථම්භය හැඩග න්වා ගෙන ඇත්තේ ඉතාමත්ම සූක්ශම සහ කාර්යක්ශමව සිය පරාග පිංඩයන් එම වාහකයාගේ සිරුර මත අලැවීමටත් නැවතත් වෙනත් එවැනිම පුශ්පයක් මත එවැනිම හැසිරීමක ප්‍රථිපලක් හැටියට එම පිංඩයන් එම පුශ්පයේ කලන්කය මත තැන්පත් වීම ස්ථාපිත කරවන අකාරයටමය. ලිංගික ප්‍රයෝග කාරී පරාගනයනට කදිම උදාහරනයක් හැටියට ලංකාවේ තෙත් කලපයේ ව්‍යාප්තව පවතින *Cottonia peduncularis* නොහොත් ”Bee Orchid” හඳුන්වා දිය හැකිය. මෙහිදී ගසක උඩ අත්තක සිය වාසය ස්ථාපිත කර ගන්නා මෙම විශේෂය, සිය පුශ්පයන් බිහි කරනුයේ මීටරයකට ආසන්න වූ දිගකින් යුතු පුශ්ප මංජරියක කෙලවරෙහිය. එය එසේ වූ විට අවකාශයේ සැරි සරන්නා වූ කෘමීන් හට මෙවැනි පුශ්පක් නිරීක්ශනය වනු ඇත්තේ වාතලය මත සංචරනයේ යෙදෙන තවත් කෘමියෙකු ලෙස විය යුතුමය. තවද, මෙම උඩවැඩියා විශේෂය සිය පරාග වාහකයා යැයි අරමුනු කරගත් කෘමියා හට මෙවන් පුශ්පයක් නිරීක්ශනය වනුයේ සිය සහකාරියගේ පිරිපුන් අදරීය ලිංගික අවයවයන් ලෙසටය. මෙවන් ප්‍රයොගයක් සමග පුශ්පය එම කෘමියාගේ සහකාරිය විසින් සාමාන්‍ය අවස්ථාවන්හීදී නිකුත් කරන්නා වූ පෙරමෝනයට සමාන සුසන්දයක්ද නිකුත් කරනවා විය හැකි මුත් එවැනි අධ්‍යනයන් හෝ ඒ හා සම්බන්ධ නිරීක්ශන වාර්තා දුලබ වීම එවන් අනුවර්ථනයන්ගේ ස්වභාවය නිශ්චිතවම හුවා දැක්වීමට පවතින බාධාවකි.

ලිංගික ප්‍රයෝගකාරී පරාගනයනට හසු නොවෙන අනෙකුත් සෑම ප්‍රයොගයක්ම ”අලිංගික ප්‍රයෝගකාරී පරාගන” ක්‍රියාවලිය යටතේ ගිනිය හැකි වන අතර මින් ප්‍රධාන තැනක් ”ආහාර ප්‍රයෝගයන්” (Food deceptions) යටතේ නිරීක්ශනය කල හැකිය. මෙහිදීද, මේ ආකරයේ ප්‍රයෝගයනට අනුවර්ථනය වූ පුශ්පයන් විසින් අනුගමනය කරනුයේ, විවිධාකාර වාහකයනගේ ආකර්ශනය දිනිය හැකිවනාකාරයේ ආහර වලට අයත් සුගන්දයන් අවට වා තලයට මුදා හැරීමයි. එවැනි ආහාර සුවඳවල් අතර, ඉදුනු හෝ පර වෙමින් හෝ නරක් වූ පලතුරු ගන්ධයන්, මෙන්ම සත්ව මේදය, කුනු වෙමින් පවතින සත්ව කොටස්, විවිධ සතුන්ගේ අසුචි වල ගන්ධයන් පවා ලොව පුරා ව්‍යාප්තව පවතින උඩවැඩියාවන් ගේ අනුවර්ථනයන් වනුයේ එවන් ගන්ධයන් මගින් මෙම පුශ්ප විශේෂයනට ඉතාමත් පහසුවෙන් එම ගන්ධයන්ට අයත් සත්ව හෝ ශාක කොටස් මත යැපෙමින් දිවි ගෙවන්නාවු කුඩා සත්ව කාණ්ඩ ඉතාමත්ම පහසුවෙන් සිය පුශ්ප අධරිකාවන් මතට ගෙන්වා ගැනීමට හැකි වීම නිසාය. එසේ පැමින, අධරිකාව මත සහ අවට ආහාර සොයන වාහකයා මත සිය පරාග පිංඩක ඇලවීමට සහ නැවතත් එසේ අලවාගත් පිංඩක පහසුවෙන් සහ ඉතාමත් සාර්ථකව වෙනත් එවැනිම මලෙක කලංකයකට මුහු කිරීමට දක්වන ස්ථම්බික අනුවර්තන ඔවුනගේ ප්‍රයෝග අනුවර්ථනයනට නොදෙවෙනි වන්නේමය.

තවද, ”වර්ණ හෝ හැඩ ප්‍රයොගයන්” (Colour or Shape deceptions) අනුගමනය කිරීමට අනුවර්තනය වූ විශේෂයන්ගේ ඉලක්කය වනුයේ එවැනි වර්ණ හෝ හැඩතල ඇති වෙනත් පුශ්පයන් වෙත යන බිඟුවන්, මල් පැනි සොයා යන කුඩා පක්ශීන්ය. සමහරක් විශේෂයන්ගේ ඉලක්කය වනුයේ වෙනත් කෘමීන්ගේ සතුරු, ආක්‍රමණශිලීන්ගේ ස්වරූපය ගෙන ඔවුන් ලවා සිය විලෝපිකයාට පහර දීමට පෙලඹීවමක් මුවාවෙන් සිය පරාගන ක්‍රියාවලිය පරිපූර්න කර ගැනීමමය.

ඉහත සඳහන් එකදු අනුවර්තනකට හෝ උදාහරන වශයෙන් ගිනිය හැකි විද්‍යාත්මක නිරීක්ශන ලංකාවේ උඩවැඩියා අධ්‍යයන ක්ෂේත්‍රයේ මේ වනවිට නොපැවතීම උඩවැඩියා ආශ්‍රිත ක්‍රියාකරකම් හෝ ඒවයේ සංරක්ශන ක්‍රියාවලියට පවතින පැහැදිලි බාධාවක් බව නොරහසකි. ලංකාව තුල ස්ථාපිතව පවතින උඩවැඩියාවන්ගේ ප්‍රයෝග කාරි හැසිරීම් රටා අධ්‍යයනය පවතිනුයේ ඉතාමත් ප්‍රාථමික අවධියක වන අතර, ඒ සඳහා නව විද්වතුන්, පාසැල් ශිෂ්‍ය ප්‍රජාව මෙන්ම උඩැවැඩියා ලෝලීන්ගේ විශේෂ අවධානය යොමු වන්නේනම් එය උඩවැඩියවන්ගේ මෙන්ම ඒ හා ආශ්‍රිත සියළුම පාරිසරික පද්ධතීන්ගේ පැවැත්ම ස්ථාපිත කිරීම උදෙසා මහත් රුකුලක් වනු නිසැකය.









# *Oryza rhizomatis* இலங்கைக்கு உரிய காட்டு நெல்லினம் விருத்தி செய்யப்பட்ட புதிய நெல் வர்க்கங்களை உருவாக்குவதில் அதன் சிறப்பியல்பு

- கலாநிதி (திருமதி) கௌரி ராஜ்குமார் -

இலங்கையானது நெல் பல்வகைமையைக் கொண்ட ஒரு இரண்டாவது மத்திய நிலையமாக கருதப்படுகின்றது (Secondary diversity centre for rice genetic resources). ஏனெனில் எமது நாட்டில் இரண்டாயிரத்திற்கு மேற்பட்ட பாரம்பரிய நெல்வர்க்கங்கள் (Traditional rice varieties), நூற்றுக்கணக்கான புதிய மற்றும் பழைய விருத்தி செய்யப்பட்ட நெல்வர்க்கங்கள் (Improved varieties) அத்துடன் ஐந்து வகையான காட்டு அரிசி இனங்கள் (wild rice species) போன்ற நெல் உயிர் பல்வகைமையை இலங்கை கொண்டிருப்பதே இதற்கு காரணமாகும். அத்துடன் எமது நாட்டில் நிலவுகின்ற காலநிலைக் காரணிகள், சூழல்காரணிகள், நிலவியல் (Topography) மற்றும் மண்வளம் என்பனவும் நெல்பல்வகைமையைக் கொண்டிருப்பதில் செல்வாக்குச் செலுத்துகின்றன.

இலங்கையில் 5 வகையான காட்டு நெல் இனங்கள் காணப்படுகின்றன. அவையாவன *Oryza rhizomatis, Oryza rufipogon, Oryza nivara, Oryza eichingeri* ஆகும். இவற்றில் *Oryza rhizomatis* இலங்கைக்கே உரித்தான உள்நாட்டு (endemic) காட்டு நெல் இனமாகும். இது இலங்கையில் முதன்முறையாக Dr. Vaughan என்பவரால் 1989ம் ஆண்டு கண்டறியப்பட்டது.

*Oryza rhizomatis* ஆனது காட்டு இனமான *O. eichingeri* உடன் நெருங்கிய தொடர்புடைய இடைநிலை இனமாகும். (Intermediate type). *Oryza rhizomatis* ஆனது இலங்கையின் உலர்வலயம் பிரதேசத்தில் மார்கழிக்கும் வைகாசிக்கும் இடைப்பட்ட காலங்களில் காணக்கூடியதாக உள்ளது. அத்துடன் *O.rhizomatis* ஆனது இலங்கையின் முதன்மைக் காடுகள் மற்றும் இரண்டாம் நிலை (Secondary) காடுகளில் காணப்படுகின்றது. ஆனால் இவை சிங்கராஜவனம் போன்ற மழைக்காடுகளில் காணப்படுவதில்லை. இவை இலங்கையில் அதிக வெப்பநிலை கூடிய வரண்ட பிரதேசங்கள் உப்புத்தன்மை கூடிய மண் பிரதேசத்தில் செழிப்பாக வளர்ந்து காணப்படுகின்றன. இவை சூழலில் காணப்படுகின்ற பல்வேறு பாதகமான சுற்றுச் சூழல்

நிலைமைகளுக்கு எதிர்ப்புத்தன்மை அல்லது சகிப்புத்தன்மை கொண்டிருப்பதற்கு அவற்றில் காணப்படும் சில சிறப்பியல்புகள் காரணமாகும். அவையாவன *O.rhizomatis* இல் தடித்த வேர்த்தொகுதி அமைப்பு காணப்படுவதுடன் நிலக்கீழான கிளைகளைக் கொண்ட வேர்த்தண்டுகிழங்கு rhizome காணப்படுதல் ஆகும். நெல் இனங்களிலேயே கிளை கொண்ட வேர்த்தண்டுக் கிழங்கைக் கொண்ட ஓரேயொரு இனம் *O.rhizomatis* ஆகும். இவ் வேர்த்தண்டுக் கிழங்கானது சூழலில் நிலவும் தகாத காலங்களைக் கழித்து தப்பி வாழ்வதற்கு உதவுகின்றது. மீண்டும் பொருத்தமான சூழல் நிலைமைகளில் புதிய பயிரை உருவாக்கும் இவ்வியல்பு *O.rhizmatis* ஐ ஒரு Perennial பயிராக மாற்றியுள்ளது.

ஊயிர்காரணிகளால் ஏற்படுத்தப்படும் நோய்களான *Xanthomonas oryzae* யினால் ஏற்படுத்தப்படும் நோயான *Bacterial leaf Blight* மற்றும் நெற்பயிர்களுக்கு பாரிய நோய் விளைவுகளை ஏற்படுத்தக்கூடிய Brown plant hopper, *Nilaparvata lugens* என்பவற்றுக்கு எதிர்ப்பை காட்டுகின்றது. இதற்கு இவற்றின் பரம்பரையலகுகளில் இந்நோய்களை எதிர்க்கும் மரபணு காணப்படுவது ஆராய்ச்சிகள் மூலம் கண்டறியப்பட்டுள்ளது. (Rajkumar et al. 2017).

அத்துடன் *O.rhizomatis* ஆனது இலங்கையில் உப்புத்தன்மை கூடிய கரையோரப்பகுதிகளில் (புத்தளம்) செழிப்பாக வளர்வதால் இவற்றின் உவர்தன்மைக்கு சகிப்புத்தன்மையான மரபணுக்களை கொண்டிருக்க வேண்டும்.

Rajhumar et at., (2014) இனால் *O.rhizomatis* இனத்திற்கும் இலங்கையில் பெருமளவு நிலப்பரப்பில் உற்பத்தி செய்யப்பட்டு பெரும்பாலான மக்களால் நுகரப்படும். புதிய விருத்தி செய்யப்பட்ட பயிரினமான மூசலனய Bg352 விற்கும் இடையிலான பிரதான போசணை கூறுகளின் ஒப்பீடு மேற்கொள்ளப்பட்டது. அதன்படி *O.rhizomatis* ஆனது ஒப்பீட்டு ரீதியில் Bg352 ஐ விட அதிகளவு கனிமங்கள் மற்றும் புரதத்தையும் குறைந்தளவு கொழுப்பு மற்றும் காபோவைதரேற்றையும் கொண்டிருப்பது அறியப்பட்டுள்ளது.

அத்துடன் Rajkumar et al. (2017) இனால் மேற்கொள்ளப்பட்ட ஆய்வுகளின் படி Bg352 நெல்வர்க்கத்தில் இல்லாத *O.rhizomatis* இல் மட்டும் காணப்படுகின்ற தனித்துவமான மரபணுக்கள் வேறாக்கப்பட்டு அதனை வகைப்படுத்தப்பட்டு இனங்கானப்பட்டன. அதன்படி *O.rhizomatis* இல் காணப்படும் இத் தனித்துவமான மரபணுக்களே இதன் அசாதாரண சூழல் நிலைமைகளில் சிறப்பாக வாழ்வதற்கான தன்மைகளுக்கும் மற்றும் உயிர் (biotioc) அத்துடன் உயிரற்ற (abiotic) காரணிகளுக்கு எதிர்பதற்கான தன்மைகளுக்கும் காரணமாகின்றன.

ஆகவே *O.rhizomatis* இல் காணப்படும் இத் தனித்துவமான மரபணுக்களை உயிர் தொழிநுட்பம், மற்றும் மரபணு பொறியியல் மூலம் ஏனைய நெல் இனங்களுக்கு அறிமுகப்படுத்தி புதிய விருத்தி செய்யப்பட்ட மற்றும் பிறப்புரிமை மாற்றப்பட்ட பயிர்களை உருவாக்கலாம்.

"Rajhumar et at., (2014) இனால் *O.rhizomatis* இனத்திற்கும் இலங்கையில் பெருமளவு நிலப்பரப்பில் உற்பத்தி செய்யப்பட்டு பெரும்பாலான மக்களால் நுகரப்படும். புதிய விருத்தி செய்யப்பட்ட பயிரினமான ழுசலணய Bg352 விற்கும் இடையிலான பிரதான போசணை கூறுகளின் ஒப்பீடு மேற்கொள்ளப்பட்டது. அதன்படி *O.rhizomatis* ஆனது ஒப்பீட்டு ரீதியில் Bg352 ஐ விட அதிகளவு கனிமங்கள் மற்றும் புரதத்தையும் குறைந்தளவு கொழுப்பு மற்றும் காபோவைதரேற்றையும் கொண்டிருப்பது அறியப்பட்டுள்ளது."


**References:**

Rajkumar G, Silva R, Weerasena J, Kumudu K. Comparison of General Nutritional composition of wild rice *O.rhizomatis* D.A. Vaughan and the commercial variety Bg352. Tropical Plant Research. 2014:1:2:08–10.

Gowri Rajkumar, Jagathpriya Weerasena and Kumudu Fernando. DNA Sequencing and Bioinformatics Analysis of Clone pOr78 from the Species-Specific Suppression Subtractive Hybridization Library Constructed from Endemic Wild Rice Species *O. rhizomatis*. International Journal of Applied Sciences and Biotechnology. 2017:5(2): 133-140

Rajkumar G, Weerasena J, Fernando K, Liyanage A, Silva R. Genetic differentiation of Sri Lankan traditional rice *(Oryza sativa)* varieties and Wild rice species by AFLP markers. Nordic Journal of Botany. 2011; 29:2:238–243.





*O.rhizomatis* இன் தடித்த வேர்த்தொகுதி



*O.rhizomatis* இன் நெல்

# මොකද්ද මේ රැම්සාර් තෙත්බිමක් කියන්නේ?

යොහාන් චන්ද්‍රසේකරන්

## අපි සමරන තෙත්බිම් දිනය

ලොව ප්‍රථම වතාවට තෙත්බිම් දිනය සමරනු ලැබුවේ, 1997 වර්ෂයේදීයි. එතැන් පටන් සෑම වසරකදීම, රජයේ කාර්යාංශ, රාජ්‍යනොවන සංවිධාන සහ විවිධ තරාතිරම් වල පුරවැසි කණ්ඩායම් විසින්, තෙත් බිම් වල වටිනාකම් හා ප්‍රතිලාභ පිළිබඳවත්, විශේෂයෙන් රැම්සාර් සම්මුතිය ගැනත් සම්බන්ධ පොදු දැනුවත් කිරීම් සිදුකරනු ලැබේ. මේ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය සඳහාරැම්සාර් මහලේකම් කාර්යාලයද, අවශ්‍ය ද්‍රව්‍ය හා ආධාර සපයයි.

ශ්‍රී ලංකාව ජෛව විවිධත්වය සම්බන්ධයෙන් ලොව ප්‍රමුඛපෙලේ රටවල් අතරට අයත් රටකි. එය ලෝක ව්‍යාප්ත ජෛව විවිධත්වස්ථාන පිළිබදව කල පර්යේෂණ ඇසුරින් නම් කරන ලද ස්ථාන 25 අතරටද ලංකාව අයත් වීමෙන් තහවුරුවේ. මේ සදහා ප්‍රමුඛබලපෑමක් බූන්දල ජාතික වනෝද්‍යානයෙන් සිදුවේ. කලපු පරිසර පද්ධතියත්, වැලි කඳුත්, මහා සාගරයට විවෘත වී තිබිමත්, වනගහනයන් පැවතීමත් බූන්දල වනෝද්‍යානයේ පාරිසරික හා ජෛව අගය වැඩිදියුණු කරයි.

1969 දෙසම්බර් මස 12 වන දින ගැසට් අංක 14887 යටතේ වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අභය භූමියක් ලෙසප්‍රකාශයට පත් කරන ලදි. තවද මෙහි ආරක්ෂාව වඩාත් හොදින් තහවුරු කරනු වස් 1992 දෙසැම්බර් 31 දින බූන්දල ජාතිකවනෝද්‍යානයක් බවට ප්‍රකාශයට පත් කළේය. එසේම 1996 දී ශ්‍රී ලංකාවෙන් ප්‍රථම වරට අන්තර් ජාතික වටිනාකමක් හිමිකරගත්තෙත් බිමක් වූ බූන්දල ජාතික වනෝද්‍යානය ජාත්‍යන්තර ලේඛනයක් යටතට ගොනු කරනු ලැබූ රැම්සා ලේඛනයේ වටිනාම තෙත්බිම් අතරට මෙම තෙත්බිම ද එක් කරනු ලැබීය.

## මොකද්ද මේ රැම්සාර් ලේඛනය කියන්නේ?

1971 වසරේ ඉරානයේ රැම්සාර් නුවරදී, ජාතීන් 21 ක් විසින් තෙත්බිම් සම්බන්ධ රැම්සාර් සම්මුතියට අත්සන් කල දිනය, එනම්පෙබරවාරි 2 වන දිනය, ලෝක තෙත්බිම් සැමරුම් දිනය ලෙස තෝරා ගෙන තිබෙයි.

රැම්සාර් සම්මුතිය (අන්තර්ජාතිකව වැදගත් වන තෙත් බිම් පිළිබඳව සම්මුතිය) යනු, තෙත්බිම් සංරක්ෂණය කිරීම සහ ඒවාතිරසාර ලෙස භාවිතයට ගැනීම වෙනුවෙන්, ජාත්‍යන්තරව සකසා ගන්නා ලද සම්මුතියකි. තෙත්බිම් බලයෙන් අල්ලාගැනීම,





වර්ථමානයේදී හා අනාගතයේදී තෙත්බිම් විනාශයට පත් වීම වැළැක්වීම හා, තෙත් බිම් හී මූලික පාරිසරික විද්‍යාත්මකක්‍රියාකාරීත්වයන් සහ ඒවායේ ආර්ථික, සංස්කෘතික, විද්‍යාත්මක සහ වින්දනීය වටිනාකම් හඳුනාග ැනීම සඳහා, මෙම ගිවිසුමනිර්මාණය කොට ගෙන තිබෙයි. 1971 වසරේදී ගිවිසුම අත්සන් කල ස්ථානය වූ, ඉරානයේ රැම්සාර් (Ramsar) නගරයේ නමින්, මෙම සම්මුතිය නම් කර ඇත.



**රැම්සාර් සම්මුතිය Ramsar Convention**

අන්තර්ජාතිකව වැදගත් වන තෙත් බිම් පිළිබඳව සම්මුතිය, විශේෂයෙන් ජලජ පක්ෂීන්ගේ ස්වභාවික වාසස්ථාන සංරක්ෂණය (Convention on Wetlands of International Importance" especially as Waterfowl Habitat)

1971 පෙබරවාරි 2 වන දින ඉරානයේ රම්සාර් හි, එරට පරිසර දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලැබූ සමුළුවකට සහභාගී වූජාතීන් විසින්, මෙම සම්මුතිය මුල්ම වරට වැඩිදියුණු කොට ක්‍රියාත්මක කල යුතු දෙයක් ලෙස සම්මත කර ගන්නා ලදී. 1975 දෙසැම්බර් 21 වන දින සිට මෙම සම්මත කර ගත් ගිවිසුම, බලාත්මක කිරීම ආරම්භ වුණි.
රැම්සාර් සම්මුතිය සතුව නිත්‍ය කාරක සභාවක්, විද්‍යාත්මක හා තාක්ෂණික සමාලෝචන කමිටුවක් සහ මහලේකම් කාර්යාලයක්පවතියි. මෙහි මූලස්ථානය ස්විට්සර්ලන්තයේ, Gland හි පිහිටුවා තිබෙයි.

මේ වන විට ලොව පුරා රැම්සාර් කලාප 2,400 කට වඩා නම් කර තිබේ. මෙවා වර්ග කිලෝමීටර් මිලියන 2.5 කට වඩා භූමිප්‍රමාණයක් ආවරණය කරයි.වැඩිම රම්සාර් තෙත් බිම් ප්‍රමාණයක් සහිත රට එක්සත් රාජධානිය (තෙත් බිම් 169ක්) වන අතර, විශාලතම රැම්සාර් තෙත් බිම කැනඩාව සතු වෙයි. (වර්ග කිලෝ මීටර 130000 ක් පමණ විශාල).

ශ්‍රී ලංකාවේ දැනට රැම්සාර් කලාප 6 ක් නම් කර ඇත ඒවා

1. බුන්දල ජාතික උද්‍යානය
2. වයඹ පළාතේ ආනවිලුන්දාව අභය භූමිය
3. දකුණු පළාතේ මාදුගඟ අභය භූමිය
4. මන්නාරම් දිස්ත්‍රික්කයේ වාන්කාලේ අභය භූමිය
5. කුමන - පානම අභයභූමිය
6. විල්පත්තුව

වන අතර මෙම භූමි ප්‍රමාණය හෙක්ටයාර් 198,172 කි.




1971 වසරේදී ජාතීන් 21ක් දෙනෙකුගේ එකඟතාවකින් ආරම්භ කරන ලද මෙම සම්මුතියට, 1999 වර්ෂය වන විට සාමාජිකයියෝ119 දෙනෙකුත්, මේ වන විට, සාමාජිකයෝ 168 දෙනෙකුත් සම්බන්ධව සිටිති.සෑම වර්ෂ තුනකට වතාවක් මෙම සම්මුතියටඅදාලව සමුළුවාර (Conference of the Contracting Parties (CCP)) පැවැත්වෙන අතර, ඉන් ප්‍රථම සමුළුව 1980 වසරේදීඉතාලියේ, ස්ටකස්රස හීදී පවත්වනු ලැබිණි. 1982 වසරේ පැරිස් සමුළුවාරයේදී හා 1987 Regina සමුළුවාරයේදී, රම්සාර්සම්මුතියෙහි මුල් එකඟතාවලට සංශෝධන කිහිපයක් එක් කෙරුණි.

ජාත්‍යන්තර සංවිධාන සහකරුවන් (International Organization Partners (IOPs)) ලෙස හඳුන්වනු ලබන ප්‍රධාන ජාත්‍යන්තරසංවිධාන පහක් සමඟ, රැම්සාර් සම්මුතිය සමීප ලෙස කටයුතු කරයි. ඒවා නම් Birdlife International, පරිසර සංරක්ෂණය සඳහා වූ අන්තර්ජාතික එකමුතුව (International Union for Conservation of Nature (IUCN)), ජාත්‍යන්තර ජලකළමණාකරන ආයතනය (International Water Management Institute (IWMI)), Wetlands International සහ WWF International (World Wide Fund for Nature) යන සංවිධාන වෙයි.

විශේෂඥ තාක්ෂණික උපදෙස් ලබාදීම, ක්ෂේත්‍ර අධ්‍යයනයන් සඳහා දායක වීම හා මූල්‍යමය ආධාර ලබාදීම වැනි දෑ මගින්, මෙමජාත්‍යන්තර සංවිධාන සහකරුවන්, රම්සාර් සම්මුතියට සිය දායකත්වය ලබා දෙයි. මීට අමතරව ඔවුහු, රැම්සාර් සම්මුතිසමුළුවාරයන්හීදී නිරීක්ෂණ සාමාජිකයින් ලෙසත්, විද්‍යාත්මක හා තාක්ෂණික සමාලෝචන කමිටුවේදී පූර්ණ සාමාජිකයින් ලෙසත්ක්‍රියා කරයි.

අද වනවිටත් අපේ රටේ විශාල ප්‍රමාණයෙන් කැලෑ එළි කිරීම් සහ වන විනාශ සිදුවෙනවා අපේ රටේ මේ අමිල සම්පත් මතුපරපුරවෙනුවෙන් අපි රැකගනිමු ඒක අපේ යුතුකමක් කරගමු.

**ඡායාරූප - මනිෂ් ගලප්පත්ති**



# කොටි ගැන නවමු කථා ගොන්නක්... සඟවා ගත් කුරුළු පාරාදීසය කුමන...

සදමල් රශ්මී. ශ්‍රී. බුද්ධික



කුමන නම ඇසූ පමණින් සිතේ ඇති වන්නේ කුරුල්ලන්ගෙන් පිරුණු කුමන විල්ලුවයි. නේක විද වූ ජලාශ්‍රිත පක්ෂි විවිධත්ත්වයකින් පිරිපුන් වූ කුමන පාරිසරික කලාපය ලෝපුරා ප්‍රචලිත වන්නේද පෙර සදහන් කළ කරුණ මුල් කර ගෙන බැව් නොරහසකි. නමුත් කුමන භූමිය කුරුල්ලන්ට ප්‍රකට පාරාදිසයක් වුවත්, කුමන වන බිම කොටින්ටත් හිතකර වූ පාරිසරික සාධක බොහෝමයකින් පොහොසත් භූමියක් බව බොහෝ දෙනා නොදන්නා සහ අවධානය යොමු නොකරන කාරණයක් බවද සදහන් කළ යුතුමය. සිරිලක් භූමියේ නැගෙනහිර වෙරළට සමීපව පිහිටා ඇති මෙම වනපෙත වර්ෂ 2006 සැප්තැම්බර් මස 05 වැනි දින ජාතික උද්‍යානයන් අතරට එක් වන්නේ සිරිලක් භූමිය තුළ පිහිටා ඇති 20 වැනි ජාතික උද්‍යානය ලෙසින්ය. කුමන වන පෙතේ විශාලත්ත්වය හෙක්ටයාර් 35664.74 කට ආසන්න අගයක් ගන්නා අතර විවිධත්ත්වයෙන් පොහොසත් වූ පාරිසරික කලාපයන් රැසක්ම මෙම වපසරිය තුළ පුළුල් වූ පරාසයක පැතිර පවති. එබැවින් කුමන ජාතික උද්‍යානය සතු ජෛව විවිධත්ත්වය වෙසෙස් අගයක් ගන්නා බැව් යළි යළිත් සදහන් කළ යුතුමද?. වනබිම මත ව්‍යාප්ත ශාක ප්‍රජාව රෝපණය වී ඇති බිම් ස්ථරය අනුව විවිධත්ත්වයක් ගන්නේ යම් සේද ඊට නොදෙවෙනි වූ විවිධත්ත්වයක් ඒ ඒ පාරිසරික සාධක වලින් අනූන පදෙස් ඇසුරේ පැවැත්ම තහවුරු කර ගෙන සිටින සත්ත්ව ප්‍රජාව තුළින්ද නිරීක්ෂණය කළ හැකිය. කුමන වනපෙතේ අනැගි වූ ජෛව විවිධත්ත්වය රසවිදිමින් වනපෙත තුළ පිහිටා ඇති තුම්මුල්ල සහ කිරිගල්ඕෙ නම් වූ සංචාරක බංගලා දෙක සහ ස්ථාපිත කර ඇති කදවුරු බිම් ඇසුරේ රැයක් ගත කිරීම තුළින් කාර්ය බහුල වූ මනසට වනපෙතක් තුළ රජයන නිහඬ බවේ සොබාඅරුත මනාව ප්‍රගුණ කළ හැකි වනු ඇත. ඉදින් සොබාදහමේ නිහඬ බස අසන්ට හුරුවන්නට නම් ඔබ යායුතුම සොබාදම් වනපියස කුමන බවත් සිහිපත් කළ යුතුමය.



කුමන ජාතික උද්‍යානය පිළිබදව පැති කිහිපයකින්ම අධ්‍යනය කළ හැකිය. එනම් ඓතිහාසික පසුබිම, පුරාවිද්‍යාත්මක පසුබිම, ජෛව විද්‍යාත්මක පසුබිම ආදි වශයෙන් වැදගත් වූ බෙදා වෙන්කර ගැනීම් හරහා විදිමත් වූ සාරබර අධ්‍යනයක් කුමන ආශ්‍රිතව සිදු කළ හැකිය. ඉදින් එවැනි වූ විවිධත්ත්වයෙන් පිරිපුන් කුමන ඇසුරේදී මේ සුදානම් වන්නේ කුමන කොටි සම්බන්ධයෙන් සිදු කළ අධ්‍යනයකදී දැන කියා ගන්න ලැබුණු අපූර්ව වූ කොටි හැසිරීමක් ගැන අත්දැකීමක් වාරණ පාඨක ඔබ වෙත සමීප කිරීමටය. එනම් බිළාල පවුලට අයත් ලොකුම සාමාජිකයාගේ හැසිරීම් ගැන මෙතුවක් සිතා නොවෙනස් වන්නේ යැයි නියතියක් ලෙස සිතා සිටි කරුණු කාරනාවන්ගේ වෙනස් වීම් කෙබදුදැයි මේ කථාව ඇසූකල වැටෙහෙනු ඇත. ඉන් ගම්‍ය වන්නේ කුමක්ද? සොබාදහම යනු අධ්‍යයනය කර නිම කළ නොහැකි මෙන්ම කුතුහලය අවුස්සන සුළු කරුණු රැසකින් පිරිපුන් වූ විෂය පථයක් බව නොවන්නේද?










කුමන උද්‍යාන මූලස්ථානයේ සිට ඉදිරියට ගමන් කරන විට හමු වන ඔකඳ වෙල ආශ්‍රිතව කොටි දෙනෙක් සහ මුවෙක් අතර සිදු වූ සිදු වීමක් නිරීක්ෂණය කිරීමේදී මෙතුවක් සිතා සිටි කොටින්ගේ වසමවල් අරඹයා සිදු වන ගැටුම් ගැන කිසි ලෙසකින් වත් නොසිතූ යමක් ඉගෙන ගැනීමට හැකි විය. මේ ඒ පිළිබඳ කථා පුවතයි. විවෘත එළිමහන් බිමක තිත් මුවන් දෙදෙනෙක්ගේ අං ගැටුමක් යනු වනපෙතට සුලභ වූ දසුනකි. ඒ ශක්තිවන්තයා කවරෙක්දැයි තිත් මුවැත්තියන්ට පෙන්වීම සඳහා සිදු කරනා මුව හටන් බැවින් මෙබඳු ගැටුම් කැලයට නන් අරුමයක් වන්නේ නැත. මෙබඳු අං ගැටුම් දුටු කල තිත් මුවැත්තියන්ද මග බලා සිටිනුයේ ශක්තිවන්තයා කව්රුන්දැයි තීරණය වනතෙක් නොයිවසිල්ලෙනි. මන්ද යත් මේ ප්‍රියංහිකාවියන්ට අවශ්‍ය වන්නේ තමනුත්, තම සිගිත්තනුත් වනේ ඇති අතුරු අන්තරාවන්ගෙන් රැකිය හැකි හයිකාර අත්දැකීම් බහුල රජෙකි. ඈතට දිස් වන පරිද්දෙන් ඔකඳ වෙල බිමේ සිටින්නේද එබඳුම ආකාරයේ හැඩි දැඩි මුව රජෙකි. නමුත් දුරට නිරීක්ෂණය වන සැටියෙන් මුව රජු සිටිනුයේ අංයුවළ බිම ඔබා ගත් වනමය. එසේ සිටිනා මුවා එක තැන කර කැවෙන්නේ මන්ද? දුර සිට බැලූ කල මුවා ගේ පිට විනා කකුල් හෝ හිස නොපෙනේ. එබැවින් ඒ දෙසට මදක් සමීප කර බැලිය යුතුමය. නෙත් මානයේ ඇති පදුරු ගොමුව ටිකක් එහාට මෙහාට්ට කර ගත් කල ඉදිරි දසුන කුමක් දැයි පැහැදිලි වනු ඇත.

හතර වටින්ම ඇසෙන්නේ මුවන්ගේ කෙටි බිරුම් හඬවල්ය. ඒ එලාම් කෝල් එකට අනුව නම් නොඅනුමානවම ළඟ පාතක මුවන්ගේ ගොදුරු කාරකයා රැඳී සිටිනු ඒකාන්තය. එබැවින් මේ නන් මුවන් දෙදෙනෙකුගේ අං ගැටුමක් නොවන බවට පෙර මග ලකුණු පහල කරයි. විවෘත තන පලස මත එක තැන් කැරකෙන මුවා ගේ කුර නිසාවෙන් පොළෙවේ දුහුවිලි ඇවිස්සෙන්නට පටන් ගෙන ඇත. මෙම සිදු වීම දෙස ඈත සිට බලා හිඳිනා මුවන්ගේ කෙටි බිරුම් හඬ එන්න එන්නම වැඩි වෙමින් හාත් පසම ගිල ගෙන ඇත. පිටිය මැද සිදු වන ගැටුම තීව්‍ර වන හැඩයි. තවත් පියවරක් දෙකක් පදුරු ගොමුව තුළට ගොස් ගස් කොළන් අතරින් එබී බැලූ කල මුවන්ගේ භීතියට මුල්වූ කරුණ කිමැයි සක් සුදක් සේ පැහැදිලි වේ. එය තහවුරු කරගනු වස් තව ටිකක් පදුරු ගොමුවේ කොළ ගොන්න අහක් කළ යුතුය.

ඇස් ඉදිරියේ සිදු වෙන්නේ කිසි ලෙසකින් හෝ නොසිතූ සිදු වීමකි. අමෝරා ගත් අවි දෙකක් බඳුවූ අං යුවළ පිහිටි ගෙල ඉහළට ඔසවා ගනු නොහී මුවා දගලන දැගලුම එන්න එන්නම තීව්‍ර වේ. මුවා අභියසින් එක වරම කොටි ගොරොද්දයක් නැග එයි. මේ තත්ත්වය මුවාගේ පාර්ශවයෙන් ගත් කල සුභ පෙරනිමිත්තක් නම් නොවේ. හුළන් හමන්නේ කොටියාගේ දෙස සිටය. එනිසාවෙන් කොටියා සිටින්නේ හුළන් මුහුණතෙහි වීම, මේ මොහොතෙහි නිරීක්ෂකයාට ගෙන දෙන්නේ වාසියකි. ඉදින් සුදුසු පසුබිම සකස්ව ඇත. කලබල නොකර හීන්තාලෙන් පදුරු ගොමුවේ හිඩැස්සකින් බැලීමට සුදුසුම කාලය එළැඹ ඇත.

හැඩි දැඩි මුවා දිගු අං තට්ටුව පැළඳි හිස ඔසවා ගනු නොහී බිමට පාත් කර ගෙන දගලනුයේ, කොටි නාම්බෙක් මුවාගේ සවිමත් ගෙලේ එල්ලිගත් වනම බිමට අදිමින් සිටින බැවින්ය. මුවාගේ ප්‍රාණය නිරුද්ද වන තුරු මේ ග්‍රහණය ලිහිල් නොවන බව

# කොටි ගැන නවමු කථා ගොන්නක්... සඟවා ගත් කුරුළු පාරාදීසය කුමන...

නම් ඒකාන්තය. ඒ මොහොත ළග ළගම පැමිණෙන බවට ඉගි මුවාගේ සිරුරෙන් විද්‍යාමාන කරයි. මෙම මුව දඩයමේ නිරතව සිටින්නේ කුමනට ප්‍රසිද්ධ ගිරි කුළා නම් වූ කොටියාය. කුමන ජාතික උද්‍යානයේ නාස් රෝසා සහ නාස් රෝසා පීතෘත්ත්වය දරන ගිරි කුළා නම් වූ කොටි පැටවා සම්බන්ධයෙන් කුමන ජාතික උද්‍යානයේ වනජීවී නිලධාරීන් අධ්‍යනයක් සිදු කර ඇත. එහිදී පොදුවේ කොටි පිරිමි සතුන් පිළිබඳ සිතා සිටි බොහෝ කරුණු බැහැර කිරීමට අවස්ථාව උදා විය. කොටින්ගේ හැසිරීම් අරඹයා සිදු කළ අධ්‍යයනයන් තුළින් සොයා ගත් දත්ත අතර තිබුණේ පිරිමි සත්ත්වයින් තමන්ගේ වසම ආරක්ෂා කර ගැනීම සඳහා නිරන්තර අරගලයක නිරත වන බවය. ඒ අතරේ එක් වරම අසන්නට ලැබුණු කුමන වනපෙතේ මේ පිරිමි කොටින් දෙදෙනා අතර ඇතිව තිබූ බැඳීම සැබැවින්ම නවමු වූ හෙළිදරව්වක්ද විය.

ඔකඳ ආශ්‍රිතවදී ගිරි කළා නම් වූ පිරිමි කොටි පැටවා විසින් නාස් රෝසා නම් වැඩුණු පිරිමි කොටියගේ වසම තුළදී සිදු කළ මුව දඩයම, අනතුරුව තම පියා වුණු නාස් රෝසා සමග හවුලේ බුක්ති විඳි ආකාරය සැබැවින්ම විශේෂිත වූ සිදු වීමක් බවට පත් වුයේ ඔවුන් අතරේ මෙහිදී දඩයම අරඹයා කිසිදු හෝ ගැටුමක් ඇති නොවුණු නිසාවෙන්ය.

ගිරි කුළා නම් මේ කොටි පැටවා අග මුවාගේ බෙල්ල සපා ගත් වනම, තම සිරුරේ මුළු ශක්තියම මුවා වෙත පටවමින් මුව නාම්බා බිමටම පෙරළ ගත්තේය. මුවාගේ සුසුම් පොද ශරීර කුඩුවෙන් නික්ම යන තුරුම උගුර දණ්ඩ සපා කෑවේ කරුණා විරහිතවය. මුවාද බිම වැතිර ගත් වනම කොටියාට හසුව තිබූ තමාගේ බෙල්ල කොටියගේ ග්‍රහණයෙන් බේරා ගැනීමට අත් පා සතර ගසමින් දඟලමින් උත්සාහ කළද එය ප්‍රතිපල රහිත ක්‍රියාවක් බවට පත් විය. මන්දයත් කොටියගේ ශක්තිය ඒ තරමටම ප්‍රබලය.

වනයේ හැටි ඔයාකාරය. ශක්ති වන්තයාට දුබලයා යටත්ය යන වනයේ නීතිය යළිත් පසක් කරමින් මුවා අවසන් හුස්ම හෙලුවේය. මුවා මිය ගිය බව වටහා ගත්ත ගිරි කුළා නම් කොටියා මෙතුවක් මුවාගේ බෙල්ල සපා ගත් ග්‍රහණය ලිහිල් කළේය. කොටියටද හොඳටම හතිය. එනිසා දඩයම පසෙකට වී හේ විඩා නිවා ගත්තේය. එලෙසින් ගත වුයේ මද වෙලාවකි. හිටි වනම වනය දෙස සිට ලොකු කොටියෙක් ගිරිකළා නම් වූ කොටියා ලැග සිටි තැනට පැමිණියේය. නමුත් දඩයක්කරු වූ ගිරි කුළාගෙන් තමන් සිටි දෙසට පැමිණි ලොකු කොටියට විරුද්ධ බවක් එල්ල වුයේ නැත. කුමන කොටි ගැන හුරු දෙනෙතකට දඩයක්කරු වුණු ගිරිකුළා සේම ගිරිකුළා සිටි දෙසට පැමිණි නාස් රෝසා නම් වූ ගිරිකුළාගේම පියා හඳුනා ගැනීම අපහසු නැත. තමන්ගේ පුතු තනිවම දඩයමක් කරන ආකාරය නාස් රෝසා විසින් වනයට වී නිහඬවම බලා හිඳින්නට ඇත. ගිරිකුළාගේ මව විසින් ක්‍රමානුකුලව ගිරිකුළා කියන කොටි පුතාව වනයේ තනිවම ජීවත් වෙන්න ගැළපෙන ආකාරයට හැඩ ගස්සවා ඇති බව, මුව දඩයමේ යෙදුණු ආකාරයෙන්ම නාස් රෝසා නම් වූ පියා විසින් වටහා ගත්තා නොඅනුමානය.

කොටි පැටවුන් උස් මහත් වන්නේ කොටි මවගේ පූර්ණ ආරක්ෂාව හා අධීක්ෂණය යටතේය. ඒ ආකාරයට ඇති දැඩි වන කොටි පැටවුන්ට කිසිදු හෝ ආකාරයේ ඉගැන්වීමක් කොටි පියවරුන් විසින් ලබා දෙන්නේ නැත. කොටි පිරිමි - පිරිමි සතුන් අතරේ තම තමන්ගේ වසමවල් වෙනුවෙන් ඉතාමත් බිහිසුණු වනසටන් ඇති වීම යනු සුලභ වූ සිදු වීමකි. කොටි පිරිමි සතෙක්ට හිමි වසම තුළ වෙනත් කොටි පිරිමි සතෙකුට වසන්නට අවසර හිමි වන්නේ නැත. කොටි පිරිමියෙකුට දාව තම වසම තුළ ජීවත් වන කොටි ගැහැණු සතෙක් පිරිමි කොටි පැටවෙක් වැදුවේ නන්, එම පැටවාට පිය පාර්ශවයෙන් එල්ල වන ජීවිත අවධානම වැඩි බව කොටි මව් වරුන් හොඳාකාරවම දන්නා බැවින් පැටවාගේ ආරක්ෂාව සම්බන්ධව අවධානයෙන් පසු වෙයි. කොටි අරඹයා සිදු කළ අධ්‍යනයන් තුළින් අනාවරණය වූ දත්ත මත මෙතුවක් සිතා සිටියේද ඒ ආකාරයටම වුවද, ගිරිකුළාත් - ඔහුගේ පියා නාස් රෝසාත් අතර සිදු වූ මේ සිදු වීමෙන් ඒ තත්ත්වය අහෝසි විය. එනම් නාස් රෝසාට අයත් වසම ඇතුළේ සියලු දඩයම් වල අයිතිය මෙතුවක් හිමිව තිබුණේ නාස් රෝසාට පමණකි යන න්‍යාය අහොසි වී, තවත් පිරිමි කොටියෙක් සමග දඩයම් අයිතිය සමව බෙදී ගිය මේ අවස්ථාව සුවිශේෂී වූ අවස්ථාවක් බවට පත් විය. නාස් රෝසා නම් වැඩුණු කොටියා විසින් තමන්ගේ වසම තුළම තවත් කොටි පිරිමි සතෙක් දඩයම් කරන තෙක් පසෙකට වී නිහඬවම බලා සිටියද, අනතුරුව දඩයම් කළ සතා හා දයක්කරු සමීපයට පැමිණියේ කුමක් අරමුණු කර ගෙන විය හැකිද?

මුවාගේ සිරුර සමීපයට පැමිණි නාස් රෝසා පළමුව කෙටි ගෙරවුමක් නැගුවේය. එයට පිළිතුරු ගෙරවුම ගිරිකුලාගෙන්ද ලැබුණි. නාස් රෝසා මුවාව ඉව කළේය. අනතුරුව මුවාගේ සිරුර සමීපයේ දිගා විය. දඩයම බුක්ති විඳීමට පටන් ගත්තේය. පසෙකට වී දඩයම බිම හෙළා ගන්න ගත්තු මහන්සිය පහ වන තුරු බිම ලැග හති අරිමින් සිටි ගිරි කුළාද නැගිට විත් නාස් රෝසා සමගම දඩයම බුක්ති විඳින්න පටන් ගත්තේය. වනයේ හැසිරීම මොහොතින් මොහොත වෙනස් වන සුළුවේ. දිනෙන් දින සිදු වන්නේ අලුත් වූ සිදු වීමකි. මෙතුවක් අප සිතා සිටි පිය - පුතු වේවා, වර්ධනය වූ කොටි - කොටි පිරිමි සතුන් අතරේ සිදු වන වසම් අයිතියේ, දඩයම් අයිතියේ, සහකාරියන් අයිතියේ හටන් මේ පිය - පුතු දෙදෙනා අතර නම් සිදු නොවන හැඩය. පියාත් - පුතාත් එකතුව හීන් හඬින් ගොරවමින් දඩයමේ රස බුක්ති විඳින අපූරුව කොටින්ගේ හැසිරීම් රටාවන්ට නවමුතාවයක් එකතු කර හමාරය. ඒ ගෙරවුම් අතරේ සුභ පැතුම්, අවවාදයන්, උපදෙස්, ස්තුති කිරීම් කොටි බසින් ගැබ්ව ඇතිවාට සැක නැත. එකී බස වටහා ගැනුමට නම් අවැසි වන්නේ වනයට ළබැඳිව සවන් පත් යොමු කිරීමට පුරුදු වීම පමණකි.

කුමන ජාතික උද්‍යානයේදී හමු වුණු ගිරි කුළ ගිරා කියන කොටි පැටියයි, ඒ පැටියගේ පියා ලෙස සැලකෙන රෝස පැහැ නාසයක් හිමි ෆින්ක් නෝස් (ඡසබන හදිැ) ලෙස ප්‍රකට වැඩිහිටි කොටියත් අතර සිදු වූ සිදු වීම සැබැවින්ම සුවිශේෂී වේ. පෙර සඳහන් කළ පිරිමි කොටින් අරඹයා ගොඩ නැගි තිබූ වසමවල් ආක්‍රමණයේදී සිදු වන සටන් වැදීමේ හැසිරීම මෙහිදී අහෝසි වී යයි. එනම් ගිරිකුළා කියන පිරිමි කොටි පුතත්, රෝස නාසා කියන කොටි තාත්තත් සමගියෙන් එකම වසමක් තුළ දිවි ගෙවයි. රෝස් නාසයා කියන කොටි පියා පීතෘත්වය දරන ගිරිකුළා පැටවාට තවත් නිවුන් සහෝදරයෙක්ද ඇත. ඒ පැටවා ගිරා ලෙස නම් කර ඇත. ඉදින් ගිරාත්, ගිරි කුළාත් නම් වූ කොටි පැටව් දෙන්නම මේ වන විට ස්වාධීනව වනයේ පැවැත්ම තහවුරු කර ගත හැකි සත්ත්වයින් ලෙස වර්ධනයවී සිටියි. තනිවම මුව නාම්බන් පවා දඩයම් කර ගනියි. එසේම රෝස නාසයා කියන කොටි තාත්තත් එක්ක මේ පැටව් දෙන්නා එකට ඉන්න ආකාරයත් කුමන ඔකඳ වෙල ආසන්නයේදී වාර්තාවී ඇත. ඔකඳ වෙල යනු රෝස නාසයාගේ වසමට අයත් ප්‍රදේශයකි. බාහිරින් පැමිණෙන වෙනත් පිරිමි කොටියෙක්ට රෝස නාසයා කියන කොටියගේ වසමට පිවිසෙන්න අවසර නැති උනාට, රෝස නාසයා පීතෘත්ත්වය දරන ගිරාට සහ ගිරි කුළාට නන් තවමත් රෝස නාසයා කියන තමන්ගේ පියාගේ වසම තුළ නිදහසේ සැරි සරන්න අවකාශ හිමියි. එය හෙට දින අහෝසි විය වේවිද?

**සේයා රූ සෂික ශ්‍රී සංජීව**

# බලි රූපවල අඹා ඇති සත්ත්වයින් සහ කල්පිත සතුන්

- ගයාන් මිත්‍ර විදිරිසිංහ -

දෙවියන්ට සහ යක්ෂයින්ට කරනු ලබන පූජාවක් යන අර්ථයෙන් "බලි" යන පදය යෙදී ඇත. පුරාතනයේ සිට ශ්‍රී ලංකාවේ පවතින බලි තොවිල් නාමයෙන් හැඳින්වෙන ශාන්තිකර්ම මෙහි මුල් බැස ගත් අයුරු පෙනේ. ඉපැරණි අතීතයෙ සිටි රජවරුන් පවා නව ග්‍රහ බලියාග ශාන්තිකර්ම පිළිබඳව පැහැදි සිටි බව බලි උපත් කවි වල සඳහන් වී ඇත. උදාහරණයක් ලෙස අසූ ගැබ මල් බලි උපත් කථාවක මහා සම්මත රජුගේ පුත් සුදර්ශන කුමාරයා නිදනවිට සිහිනෙන් ශරීරයේ පොළඟෙකු වෙලුන නිසා කැඳවන ලද බමුණා සිහිනය විස්තර කර දි ප්‍රතිරූප බලි යාග ශාන්තිකර්මයක් කිරීමට උපදෙස් ලැබිණ.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන ග්‍රහ බලියාග සම්ප්‍රදායන් 05 ක් වන උඩරට, සබරගමුව, පහතරට, ඌව සහ නුවර කලාවිය වශයෙන් හැඳින්විය හැක. බලි රූපකරණයට අයත් නව ග්‍රහයින්, රාශි දොළස, නැකත් විසි අට, දසා, දින, තිථි, (චන්ද්‍ර කලාව) සහ මාස ආදි වු දෙවිවරුන්ගේ ස්වරූප (සිතුවම්) විහාර හා දේවාල ආශ්‍රිත චිත්‍රකරණයේදි යොදා ගෙන තිබේ. ශාස්ත්‍රීය ග්‍රන්ථවල සඳහන් කර ඇති පරිදි ඇතුල් පන්තියේ සංඛ්‍යාව 7100 ද පිටත පන්තියේ බලි සංඛ්‍යාව 84000 කි. බලි ඇදුරන් අතර ප්‍රසිද්ධ බලි කවිවල බලි යාග 35ක් පමණ සඳහන් වී තිබේ. උපන් වේලාව ගැන බලවත් විශ්වාසයක් ඇති ගැමියන් තම හඳහන බලා දුක් කරදර හා ලෙඩ රෝග පැමිණෙන අවස්ථාවල බලි යාග කර ගත්හ. බලි යාග ශාන්තිකර්මවල දි අඹන ලද බලි ස්වරූප අතරට ලෝක ධාතුවේ විවිධ සතුන් ඇඳාගෙන ඇත. නමුත් කල්පිත සත්ත්වයින් ද මෙම බලි ස්වරූප අතර ඇඹීම සුවිශේෂී කාරණයකි. ඒ ඒ බලි ස්වරූපවලට අධිපති වන දෙවිවරුන්ගේ සිරස්වල (මුහුණුවල), දෑත්වල දරා සිටින සංකේත සහ වාහන වශයෙන් සත්ත්වයින් රාශියක් ආදේශ කර ගෙන තිබේ. සවිස්තරාත්මකව පහත ගෙන හැර දක්වා ඇත.

## නවග්‍රහයින්ගේ බලි ස්වරූප

ජ්‍යොතිෂයට අනුව ඉරු, සඳු, කුජ, බුද, ගුරු, කිවි, ශනි, රාහු සහ කේතු යනුවෙන් ග්‍රහයෝ නව දෙනෙකි. නවග්‍රහයින්ගේ බලි ස්වරූපවලට අධිපතිවරුන් වු දෙවිවරුන්ගේ වාහන ලෙස අශ්වයා, ඇතා, මී හරකා, ගොනා යන ක්ෂීරපායින් ද මොණරා, කපුටා යන පක්ෂීන් සහ නාගයෙකු ඇතුලත් කරගෙන තිබේ. බුධ ග්‍රහයාගේ බලියේ ස්වරූපයට අධිපතිවන දෙවිඳුගේ දකුණුතින් ශංඛයක් රැගෙන සිටින ආකාරය සංකේතවත් කර ඇත. රාහු ග්‍රහයාගේ බලියේ ස්වරූපයට අධිපතිවන දෙවියාගේ සිරස නාග පෙනයක් සහිත හිසකි. ඔහු දකුණතින් කුඩ මත්ස්‍යයෙකු (උඩ හඳයා) රැගෙන සිටින සේ සංකේවත් කර තිබේ.
















අ. නවග්‍රහයින්

ආ. නවග්‍රහ බලි යාග ශාන්තිය

ඇ. රාශි දොළොස

ඈ. නැකත් විසි අට

ඉ. නැකත් බලි ස්වරූප කිපයක්

# බලි රූපවල අඹා ඇති සත්ත්වයින් සහ කල්පිත සතුන්...

"ශ්‍රී ලංකාවේ ප්‍රධාන ග්‍රහ බලියාග සම්ප්‍රදායන් 05 ක් වන උඩරට, සබරගමුව, පහතරට, ඌව සහ නුවර කලාවිය වශයෙන් හැඳින්විය හැක. බලි රූපකරණයට අයත් නව ග්‍රහයින්, රාශී දොළස, නැකත් විසි අට, දසා, දින, තිථි, (චන්ද්‍ර කලාව) සහ මාස ආදි වූ දෙවිවරුන්ගේ ස්වරූප (සිතුවම්) විහාර හා දේවාල ආශ්‍රිත චිත්‍රකරණයේදි යොදා ගෙන තිබේ."

### රාශී දොළො සේ බලි ස්වරූප

රාශී දොළොසට අයත් වන්නේ මේෂ, වෘෂභ, මිථුන, කටක, සිංහ, කන්‍යා, මීන, වෘශ්චික, ධනු, මකර සහ කුම්භ යන ආදිය වේ. මෙම දොළොසේ බලි ස්වරූපවලට අධිපතිවරුන් වූ දෙවිවරුන්ගේ වාහන සඳහා සුදු වර්ණයෙන් යුත් එළුවෙකු, සිංහයා, කකුළුවා, මත්ස්‍යයා, ගෝනුස්සා සහ මකරා ගෙන තිබේ. වෘශ්චික රාශී බලියේ ස්වරූපයට අධිපතිවන දෙවියාගේ සිරස වෘශ්චික හිසකි. මකර රාශී බලියේ ස්වරූපයට අධිපතිවන දෙවියාගේ සිරස ඇත් හිසකි. කුම්භ රාශී බලියේ ස්වරූපයට අධිපතිවන දෙවියාගේ සිරස කකුළු හිසකි. වෘෂභ රාශී බලියේ ස්වරූපයට අධිපතිවන දෙවියාගේ සිරස ගව හිසකි. සිංහ රාශී බලියේ ස්වරූපයට අධිපතිවන දෙවියාගේ සිරස සිංහ හිසකි.

### නැකත් විසි අටේ බලි ස්වරූප

නැකත් විසි අට වශයෙන් අස්විද, බෙරණ, කැති, රෙහෙණ, මුව සිරස, අද, පුනාවස, පුස, අස්ලිස, මා, පුව පල්, උත්‍ර පල්, හත, සිත, සා, විසා, අනුර, දෙට, උත්‍රසල, සුවන, දෙනට, සියාවස, පුව පුටුප, උත්‍ර පුටුප, රේවති, පුවසල, මුල, අභිජිත් යන ආදිය වේ. මේ නැකත්වල බලි ස්වරූපවලට අධිපතිවරුන් වූ දෙවිවරුන්ගේ වාහන ලෙස දිවියා, එළුවා, මී හරකා, අශ්වයා, ඇතා, මීයා, වලසා, මොණරා, ලිහිණි, කපුටා, නාගයා, ඉබ්බා, මත්ස්‍යයන් යන සත්ත්වයන් ද මකරා, ගුරුළා සහ ගරුඬ යන කල්පිත සතුන්ද ඇඳාගෙන තිබේ. මෙම දෙවිවරුන්ගේ සිරස් සඳහා ආදේශ කරගත් සතුන් අතර ගොනා, ඇතා, එළුවා, අශ්වයා, සුනබයා, බළලා, මීයා, මී හරකා, දිවියා, මුවා, වඳුරා, සිංහයා යන ක්ෂීරපායින් සහ සර්පයින් දකින්නට ලැබේ. හත නැකතේ සහ විසා නැකතේ බලි ස්වරූපයන්ට අධිපතිවන දෙවිවරුන්ගේ අත්වල කුකුළන් රැගෙන සිටින අතර එය සංකේතයකි. සිත නැකතේ සහ පුව පුටුප නැකතේ බලි ස්වරූපයන්ට අධිපතිවන දෙවිවරුන්ගේ අත්වල ශංඛ සංකේතවත් කරයි. දෙනට නැකතේ සහ පුව පුටුප නැකතේ බලි ස්වරූපයන්ට අධිපතිවන දෙවිවරුන්ගේ සිරස්වල කිඳුරියෙකුගේ මුහුණුක් සේ අඹා ඇත.

### දසා බලි ස්වරූප

දසා ලෙස අයත් වන්නෙ ඉරු දසා, සඳු දසා, කුජ දසා, බුද දසා, ගුරු දසා, සිකුරු දසා, ශනි දසා, රාහු දසා සහ කේතු දසා යන ආදිය වේ. දසාවල බලි ස්වරූපවලට අධිපතිවරුන් වූ දෙවිවරුන්ගේ වාහන සඳහා මී හරකා, ඇතා, සුනබයා, නාගයා යන සත්ත්වයින් ද ගජ සිංහ සහ ගරුඬ යන කල්පිත සතුන් දැකුම්කළු ලෙස අඹා තිබේ. සඳු දසා බලියේ ස්වරූපයට අධිපතිවන දෙවියාගේ සිරසට ඉහළින් පෙන සහිත නාගයින් 05 කි. රාහු දසා බලියේ ස්වරූපයට අධිපතිවන දෙවියාගේ සිරසේ පෙන සහිත නාගයින් 05 ක් සිටි. ඔහුට අත් සතරකි. දකුණු පැත්තේ අත් දෙකෙන් පෙන සහිත නාගයෙකු හා මත්ස්‍යයෙකු රැගෙන සිටින අයුරු සංකේතවත් කරයි. කේතු දසා බලියේ ස්වරූපයට අධිපතිවන දෙවියාගේ සිරසේ පෙන සහිත නාගයින් 05 දෙනෙකු වෙලා සිටි. ඉරු දසා බලියේ ස්වරූපයට අධිපතිවන දෙවියා දකුණතින් ශංඛයක් රැගෙන සිටින අතර එය සංකේතයකි. සඳු දසා බලියේ ස්වරූපයට අධිපතිවන දෙවියා වමතින් ශංඛයක් රැගෙන සිටි; එය සංකේතයක් වේ.

### සත් දිනට බලි ස්වරූප

ඉරු, සඳු, කුජ, බුධ, ගුරු, සිකුරු සහ ශනි යන ආදිය සත් දින යනුවෙන් හැඳින්වේ. සත් දින බලි ස්වරූපවලට අධිපතිවරුන් වූ දෙවිවරුන්ගේ වාහන වශයෙන් අශ්වයා, ඇතා, මොණරා, මී හරකා සහ කපුටා යන ආදිය ආදේශ කර ගෙන ඇත. බුධ දින බලියේ ස්වරූපයට අධිපතිවන දෙවියා දකුණතින් ශංඛයක් රැගෙන සිටි; එය සංකේතයකි.

### තිථි බලි ස්වරූප

මාසයකින් දවස් 15ක් පුර පක්ෂයද පසළොස්වක පොහොයෙන් පසු දවස් 15ක් අව පක්ෂය වන අතර එයට චන්ද්‍ර කලාව නමින් ව්‍යවහාර කරේ. පුර පක්ෂයට අයත් වන තිථි ලෙස පෑලවිය, දියවක, තියවක, ජලවක, විසේනිය, සැටවක, සතවක, අටවක, නවවක, දස වක, එකොළොස්වක, දොළොස්වක තෙලෙස්වක, තුදුස්වක සහ පසළොස්වක යන නමින් හැඳින්වේ. පුර පක්ෂයේ තිථි බලි ස්වරූපවලට අධිපතිවරුන් වූ දෙවිවරුන්ගේ වාහන වන ඌරා, ඇතා, දිවියා, එළුවා, ගවයා සහ කුකුළා යන ආදිය වේ. මෙම බලි ස්වරූපවලට අධිපතිවරුන් වූ දෙවිවරුන්ගේ සිරස් සඳහා සිංහයා, ඌරා, ඇතා, දිවියා, එළුවා, ගවයා, ව්‍යාඝ්‍රයා සහ කුකුළා යන සත්ත්වයින් ආදේශ කරගෙන තිබේ. දියවක, සතවක සහ නවවක තිථි බලි ස්වරූපවලට අධිපතිවරුන් වූ දෙවිවරුන්ගේ දෑත් වලින් ශංඛ රැගෙන සිටි. එකොළොස්වක, තුදුස්වක සහ පසළොස්වක තිථි බලි ස්වරූපවලට අධිපතිවරුන් වූ දෙවිවරුන්ගේ දෑත් වලින් මත්ස්‍යයන් රැගෙන සිටින අයුරු සංකේතවත් කර ඇත.

### මාස බලි ස්වරූප

සිංහල මාස ක්‍රමයට අයත් වන බක්, වෙසක්, පොසොන්, ඇසළ, නිකිණි, බිනර, වප්, ඉල්, උඳුවප්, දුරුතු, නවම් සහ මැදින් යන ආදිය වේ. මෙම මාසවල බලි ස්වරූපවලට අධිපතිවරුන් වූ දෙවිවරුන්ගේ දෑත්වල දරා සිටින සත්ත්වයින් ලෙස සංඛ, මසුන් දෙදෙනා සහ නාගයා වන අතර මොවුන් සංකේත කිපයකි. වෙසක්, නිකිණි සහ වප් මාස වලට බලි ස්වරූපවලට අධිපතිවරුන් වූ දෙවිවරුන්ගේ සිරස් සඳහා ගවයා, මීහරකා සහ සිංහයා වැනි සත්ත්වයින්ගේ මුහුණු ආදේශ කර තිබේ.

# ශ්‍රී ලංකා වනසත්ව හා ස්වභාව ආරක්ෂක සංගමය

## වසරක මතක සටහන්

සංරක්ෂණය ක්ෂේත්‍රයේ කොතරම් අභියෝගය තිබුණ ද පසුගිය වසර පුරාවටම ශ්‍රී ලංකා වනසත්ව හා ස්වභාව ආරක්ශක සංගමය විසින් දීප ව්‍යාප්තව ව්‍යාපෘතීන් ගණනාවක් ක්‍රියාවට නංවන ලදී. පහත දැක්වෙන්නේ එම ව්‍යාපෘතී වල සංක්ෂිප්ත සටහණකි. මෙම ලිපියෙහි ප්‍රධාන අරමුණ වන්නේ සංරක්ෂණය උදෙසා අපගේ දායකත්වය පිළිබඳව ඔබ සැමව දැනුවත් කිරීම වන අතර මෙම ජාතික කර්තව්‍යය උදෙසා ඔබගේ දායකත්වය ද ලබා දෙන මෙන් වාරණ වාරණම් සඟරාවෙහි සංස්කාරක වරයා වශයෙන් මම ඔබ සැමගෙන් ඉල්ලා සිටිමි.

ශ්‍රී ලංකා කොටියන් සංරක්ෂණය සඳහා බහු කලාපිය අධීක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීමට වන සත්ව සහ ස්වභාව ආරක්ෂණ සංගමය (WNPS), එල්ඕඑල්සී (LOLC) සමාගම හා හවුල් වෙයි.

විද්‍යානුකූල සංරක්ෂණ ක්‍රමෝපායක් ආරම්භ කිරීමට සහ පවත්වා ගෙන යාම සඳහා ශ්‍රී ලංකා කොටි ගහනය සහ පරිසර පද්ධතින් පිළිබඳ වඩාත් නිවැරදි අවබෝධයක් තිබිය යුතු අතර විශේෂයෙන් රට පුරා අධ්‍යනයට ලක් නොවූ ප්‍රදේශ පිළිබඳ වැඩි අවධානයක් යොමු කළ යුතු වේ. මේ පිළීබඳ අවබෝධය ඇති කිරීමට, වන සත්ව සහ ස්වභාව ආරක්ෂණ සංගමය (WNPS), ශ්‍රී ලංකාව තුළ හඳුනාගත් භූගෝලීය වශයෙන් වැදගත් ප්‍රදේශයන්හි කොටියන් සංරක්ෂණ ස්ථාන සහ පර්යේෂණ මධ්‍යස්ථාන ජාලයක් පිහිටුවීම සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම සහ විශාලතම විවිධාංගීකරණය වූ සමූහ ව්‍යාපාරය වන LOLC Holdings PLC සමඟ හවුල් වේ. මෙම පර්යේෂණ මධ්‍යස්ථාන කලාපීය මට්ටමින් තනි කළමනාකරණ ඒකකවලට වඩා විශාල පරිමාණයෙන් පවතින ගහනයේ හෝ මෙටා-ගහනවල (Meta population) විශේෂ ක්‍රියාකාරිත්වය අවබෝධ කර ගැනීම කෙරෙහි අවධානය යොමු කරනු ඇත. මෙම මුලපිරීම මඟින්, පර්යේෂණ පදනම් වූ දීප ව්‍යාප්ත කොටියන් නිරීක්ෂණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය දැනුම සහ දත්ත හුවමාරු වේදිකාවක් නිර්මාණය කිරීමට වන සත්ව සහ ස්වභාව ආරක්ෂණ සංගමය (WNPS) බලාපොරොත්තු වේ. මෙම පර්යේෂණ මධ්‍යස්ථාන රටපුරා පිහිටුවීම මඟින් කොටියන් පිළිබඳ සිදුවන කුඩා අධීක්ෂණ ප්‍රයත්නයන්, විශාල වැඩසටහන් සහ දත්ත සමුදායන් පහසුවෙන් ඒකාබද්ධ කරනු ඇත. එය විද්‍යාඥයින්ට සහ සංරක්ෂකයන්ට කලාපීය සහ රටපුරා දේශීය කොටි ගහනය අවබෝධ කර ගැනීම සඳහා ගැඹුරු සහ පුළුල් දත්ත සමුදායකට ප්‍රවේශ වීමට ඉඩ සලසනු ඇත.

### වයිල්ඩ් කැට් (Wild Cat) මඟින් කොටියන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්

කොටියන් පිළිබඳ අධ්‍යාපනික සහ දැනුවත් කිරීමේ වැඩසටහන, Unilever අරමුදල යටතේ Rainforest Alliance මඟින් සංවිධානය කරනු ලබන අතර වන සත්ව සහ ස්වභාව ආරක්ෂණ සංගමය (WNPS) මඟින් පවත්වනු ලබයි. 2022 වර්ශයේ ජූනි මාසය තුළදී වතුකර ප්‍රදේශ 16 ක් ආවරණය කිරීමට මෙම හැකි වී ඇත.

### සමුද්‍ර වාසස්ථාන පිළිබඳ සැලකිලිමත් වීම

ජාතික කඩොලාන විශේෂඥ කමිටුවේ ප්‍රධානී සහ කඩොලාන පරිසර පද්ධති ප්‍රතිස්ථාපනය සඳහා වූ කාර්ය සාධක බලකායේ විශේෂඥ කමිටු සාමාජික මහාචාර්ය සෙව්වන්දි ජයකොඩි මහත්මියගේ මගපෙන්වීම යටතේ ආනවිලුන්දාව ප්‍රදේශයේ ස්වභාවික කඩොලාන පුනර්ජනන ව්‍යාපෘතියේ වැඩ කටයුතු අඛණ්ඩව සිදුවෙමින් පවතී. මෙම ව්‍යාපෘතිය සඳහා දැනට Hema’s Manufacturing PLC, Lanka Environment Find (LEF) සහ Hayley’s Advantis ආයතන විසින් අරමුදල් සපයනු ලබයි. භූමියේ බටහිර සීමාවේ පිහිටා ඇති ප්‍රධාන ජල මූලාශ්‍රය වන හැමිල්ටන් ඇලෙන් (Dutch Canal) එක් එක් බිම් කොටසට සරිලන ලෙස අවශ්‍ය ජල ප්‍රමාණය බෙදා හැරීම සහතික කිරීම සඳහා සැලසුම් කළ ජලාවර්තන චක්‍රයක අවශ්‍යතාව ඉතා වැදගත් වේ. ජල ප්‍රමාණය තීරණය කළ හැකි වන්නේ අදාළ බිම් කොටසේ ඇති කඩොලාන විශේෂය අනුව වේ. කපිතාන් බණ්ඩාරගේ නායකත්වයෙන් යුත් ශ්‍රී ලංකා නාවික හමුදාවේ ජල විද්‍යා ඒකකයේ කණ්ඩායම මසකට අධික කාලයක් බිම් මැනුම් කටයුතු වල මෙන්ම බිම් කොටස් වල සමෝච්ඡයන් සහ ජල මාර්ග වල ගැඹුර සිතියම් ගත කිරිමේ කටයුතු වල නිරත විය.

ප්‍රතිසංස්කරණ ප්‍රදේශය තුළ සියලුම වැදගත් පාංශු සහ ජල තත්ත්ව පරාමිතීන් පරීක්ෂා කිරීම සඳහා භාවිත කළ හැකි ඉතා වැදගත් උපකරණ වන බහුකාර්ය (මල්ටි) පැරාමීටර දෙකක් සහ පාංශු උෂ්ණත්වය පරීක්ෂා කිරීම සඳහා උෂ්ණත්වමාන දෙකක් ද මිලදී ගැනීමට Lanka Environmental Fund ආයතනය අනුග්‍රහය දක්වන ලදී.

### ‘The Gathering’ රැස්වීම

අලියන් පිලිබඳ වර්තමාන තත්ත්වය සාකච්ඡා කිරීම සඳහා මෙන්ම අලියන්ගේ වඳවීම වැළැක්වීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ තීරණය කිරීමට එක හා සමාන අදහස් දරණ පාර්ශ්ව රැ ස් කිරීමට "ගැදරින්" ලෙස නම් කරන ලද විශේෂ රැස්වීම් මාලාවක් සංවිධානය කිරීමට HEC අනුකමිටුව පහසුකම් සලසා දී ඇත. මෙහි ප්‍රථම රුැස්වීම අගෝස්තු 12 වන දින ජාත්‍යන්තර අලි සුරක්ෂිතතා දිනයට සමගාමීව පැවැත්වුණු අතර එහිදි මින්නේරිය ප්‍රදේශයේ පවතින තත්ත්වය පිළිබදව විශේෂයෙන් අවධානය යොමු විය. 25ට අධික සංවිධාන සංඛ්‍යාවක් මේ සදහා මාර්ගගතව (online) සම්බන්ධ වූ අතර ආචාර්ය සුමිත් පිලපිටිය, ආචාර්ය ප්‍රිතිවිරාජ් ප්‍රනාන්දු, ශ්‍රිලාල් මිත්තපාල මහතා, වාරිමාර්ග අධ්‍යක්ෂ ඩී. අබේසිරිවර්ධන මහතා සහ ජල කළමණාකරණ කමිටුවේ සභාපති ධනපාල මහතා විසින් වර්තමාන තත්ත්වය පිළිබඳව ඔවුන්ව දැනුවත් කරන ලදි.

### අලි-මිනිස් ගැටුම් (HEC) - ආලෝක විකර්ෂක පද්ධතිය (LRS) නවීකරණය

ආලෝක විකර්ෂක පද්ධතිය (LRS) ක්‍රියාත්මක කරන අවස්ථාවේ සහ එය ක්‍රියාත්මක විය යුතු අවස්ථාවන් හිදී, කඩාවැදීම් සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමකින් අඩු වී ඇති බව දැනට රැස්කර ගත් දත්ත මඟින් තහවුරු වන අතරම එහි ධනාත්මක පැතිකඩක් පෙන්නුම් කෙරේ. ප්‍රදේශයේ පාලක බිම් කොටස් මඟින් රැස්කර ගත් ප්‍රතිඵල සමඟ සංඛ්‍යා සංසන්ධනය කර ඇත. ධනාත්මක කරුණක්



# ශ්‍රී ලංකා වනසත්ව හා ස්වභාව ආරක්ෂක සංගමය - වසරක මතක සටහන්...












වන්නේ, මෙම කාලසීමාව තුළදී අපගේ ස්ථාන වල අලින් දැක ගැනීමට හැකි වී ඇති අතර ආලෝක විකර්ෂක පද්ධතිය (LRS) මගින් ආරක්ෂා කර ඇති දේපළ වලින් පිටත ඔවුන් රැඳී සිටින අයුරු දැක ගන්නට ලැබීමයි.

## අලි - මිනිස් සාමය: 'අලි පැංචා' - සුවිශේෂී ව්‍යාපෘතියක්

හම්බන්තොට ජාත්‍යන්තර වරාය සමූහයේ (HIPG) ප්‍රධාන විධායක නිලධාරි ජොන්සන් ලියු මහතා සහ වන සත්ව සහ ස්වභාව ආරක්ෂණ සංගමයේ (WNPS) සභාපති ජෙහාන් කනගරත්න මහතා 2022 ඔක්තෝම්බර් 14 වන දින "අලි පැංචා" ව්‍යාපෘතිය දියත් කිරීම සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කළ අතර මෙය අලි - මිනිස් ගැටුම මුල්බැස තිබූ ප්‍රජාවගේ ආකල්ප, අදහස් අලි - මිනිස් සාමය ලෙස පරිවර්තනය කිරීමට ගත් එක් ප්‍රයත්නයකි.

වන සත්වයින් හා කරන ගනුදෙනුව සම්බන්ධයෙන් මාධ්‍ය සමඟ සංවාදයක්

ශ්‍රී ලංකා වන සත්ව සහ ස්වභාව ආරක්ෂණ සංගමය ;උහෂී*, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව (DWC) සහ ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය විසින් නොවැම්බර් 09 වන දින කොළඹ 07 ජෙට්වින්ග් හෝටලයේදී මාධ්‍ය වැඩමුළුවක් සංවිධානය කර තිබුණි. මෙම වැඩමුළුව මගින් මිනිසා සහ වන සත්වයින් අතර ඇතිවන ගැටුම්වලදී වඩා හොඳ සමතුලිතතාවයක් නියෝජනය කරන, වන සත්ත්ව - මිනිස් ගැටුම් පිළිබඳ සදාචාරාත්මක වාර්තාකරණය පිළිබඳ අවබෝධයක් ලබා දුන්නේය. එය ලංකාවේ ප්‍රමුඛ පෙළේ මාධ්‍ය ආයතන රැසක පාරිසරික මාධ්‍යවේදීන් 80ට අධික සංඛ්‍යාවකගේ ප්‍රශංසාවට ලක් වූ ඉතා ඵලදායි දිනයක් විය. වෘත්තීය සම්පත් දායකත්වය ලබා දුන් කණ්ඩායම වෙත ඔවුන්ගේ දැනුම අප සමඟ බෙදා ගැනීම සම්බන්ධයෙන් අපගේ කෘතවේදිතාවය පළකර සිටින්නෙමු.

## ආචාර්ය ටෙම්පේ ඇඩම්ස්ගේ සංචාරය

බොස්ට්වානා හි "Elephants without Borders" නම් සංගමයේ ආචාර්ය ටෙම්පේ ඇඩම්ස් "ලෝකයේ විශාලතම අලි ගහනය සමඟ ජීවත් වීම" සහ ඔහුගේ අත්දැකීම් බෙදාහදා ගැනීමට මෙන්ම ශ්‍රී ලංකානු රජය සහ අනෙකුත් සංරක්ෂණ පාර්ශ්වයන් ලංකාවේ පවතින අලි - මිනිස් ගැටුම් වලදී ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳව ආරාධිත දේශනයක් සිදු කිරීම සඳහා සතියක කාලයක් ශ්‍රී ලංකාවේ රැඳී සිටියේය. වන සත්ව සහ ස්වභාව ආරක්ෂණ සංගමය (WNPS) සහ Elephants without Borders (EWB) විසින් ආලෝක විකර්ෂක පද්ධතිය (LRS) අත්හදා බලමින් සිටියි. වන සත්ව සහ ස්වභාව ආරක්ෂණ සංගමය (WNPS) පසුගිය වසර කිහිපය තුළ ලංකාවේ දිස්ත්‍රික්ක 9ක ස්ථාන 21 දී ආලෝක විකර්ෂක පද්ධතිය (LRS) අත්හදා බලමින් සිටියි. මෙම පර්යේෂණාත්මක අධ්‍යයනය අලි-මිනිස් ගැටුම් (HEC) අවම කිරීම සඳහා ඉහළ කාර්යක්ෂමතාවයක් පෙන්නුම් කරයි.

## Wild Kids: ස්වභාව ධර්මය සමඟ ප්‍රායෝගික අත්දැකීම් ලබාදීම

ශාක හා සතුන් සමඟ අන්තර් ක්‍රියා කිරීම දරුවන්ගේ සෞඛ්‍ය සහ යහපැවැත්ම සඳහා මූලික වන බව සොයාගෙන ඇත. වයිල්ඩ් කිඩ්ස් කණ්ඩායම අපගේ වැඩ කටයුතු තුළින් ස්වභාවධර්මයට ආදරය කරන නව පරපුරක් පෝෂණය කිරීම සහතික කිරීම සඳහා විවිධ මාර්ග රැසක් අනුගමනය කරයි. අත්දැකීම් තුළින් ලබන ඉගෙනුමෙහි ඇති ශක්තීන් හඳුනා ගත් වයිල්ඩ් කිඩ්ස් කණ්ඩායම එහි සාමාජිකයින් සඳහා වියළි පත්‍ර යොදාගෙන තම නිර්මාණශීලීත්වය ඉදිරිපත් කිරීම සඳහා "ෆන් විත් ඩ්‍රයිඩ් ලීව්ස්" නමින් තරඟ අවස්ථාවක් පැවැත්වූයේය.

වයිල්ඩ් කිඩ්ස් කණ්ඩායම සමනලයින් සම්බන්ධයෙන් සිදු කළ ප්‍රායෝගික අධ්‍යනයක් මගින් නොවැම්බර් මාසයේදී ක්ෂේත්‍රයට පිවිසුණේය. එය ස්වභාවික විද්‍යාව පිළිබඳ ප්‍රවීණයෙකු මෙන්ම කතුවරයෙකු වන රජික ගමගේ මහතා විසින් මෙහෙයවනු ලැබූ අතර මොරටුව MJF මධ්‍යස්ථානයේදී පැවැත්විණි.

### යෞවනයේ විවිධ පරාසයන් සඳහා විවිධ මුලපිරීම් යූත් වින්ග් (Youth Wing) විසින් ක්‍රියාත්මක කරයි.

ලෝක පරිසර දිනය හා ලෝක සාගර දිනය සැමරීම සඳහා ජූනි 6 වන දින සිට 10 වන දින දක්වා පුරා සතියක කාලයක් අපි පාසැල් දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් ආනවිලුන්දාවේදී පැවැත්වූයේමු. මෙම වැඩසටහන් මාලාව සඳහා අපි ආනවිලුන්දාව ජාත්‍යන්තර රැම්සා තෙත්බිම් අභයභූමිය අසල පාසැල් 10 තෝරා ගත්තෙමු. 2022 වර්ශයේ මේ දක්වා, දිවයින පුරා ශිෂ්‍යයින් 2000ට අධික පිරිසකට අපගේ පරිසර පද්ධති, සත්ත්වයින් සහ ශාක රැක ගැනීමේ ඇති වැදගත්කම ගැන අපි දැනුවත් කර ඇත්තෙමු. මෙම කාර්යය සඳහා අපට නිරන්තරයෙන් සහය ලබා දෙන ජාතික සංවර්ධන බැංකුව (NDB) වෙත අපගේ ස්තූතිය පුද කරමු.

### දේශගුණික විපර්යාසයන්ට එරෙහි අරගලයේදී බ්‍රිටිෂ් කවුන්සිලය හා හවුල් වේ

බ්‍රිටිෂ් කවුන්සිලයේ "දේශගුණික ක්‍රියාකාරකම් සඳහා තරුණ නායකත්වය" ('Youth Leadership for Climate Action' (YLCA)) යන වැඩසටහන සඳහා නුවර සහ ගම්පහ යන දිස්ත්‍රික්ක වල පැවැත්වූ අතර සම්පත්දායකයෙකු ලෙස යූත් වින්ග් තෝරා පත් කර ගැනුණි. මෙහි පළමු අදියර සහභාගිවන්නන් 52කු සමඟ නොවැම්බර් මස සාර්ථකව නිම කිරීමට අපට හැකියාව ලැබුණි.

### අපගේ විද්‍යා කණ්ඩායම තව තවත් සංරක්ෂණ කටයුතු සඳහා වඩාත් එලදායි වෙමින් අඛණ්ඩ සටනක

විද්‍යාත්මක පසුබිම් සහිත නව සාමාජිකයින් මෑතකදී පිහිටුවන ලද සංරක්ෂණ කණ්ඩායමට සම්බන්ධ වී ඇති අතර, ඔවුහු විවිධ සංරක්ෂණ අංශවලට අදාළ විවිධ ක්ෂේත්‍රවල විවිධ කාර්යයන් වල නිරත වෙමින් සිටිති. මෙම සංරක්ෂණ කණ්ඩායම පේරාදෙණිය විශ්ව විද්‍යාලය සමඟ එක්ව පොම්පකැලේ වනෝද්‍යානය තුළ ජෛව විවිධත්ව සමීක්ෂණයක් ආරම්භ කිරීමටත් පොම්පකැලේ වනෝද්‍යානය මිනිස් ක්‍රියාකාරකම් වලින් හා සංවර්ධනමය අරමුණු වලින් ආරක්ෂා කර එය වැදගත් ආරක්ෂිත කලාපයක් ලෙස නම් කර සිතියම් ගත කිරීමට සැලසුම් කරමින් සිටියි.

MV-X Press Pearl සිද්ධිය හේතුවෙන් ශ්‍රී ලංකාවේ වෙරළ තීරය ආශ්‍රිත නර්ඩිල් සනත්වය විශ්ලේෂණය කරමින් අප විසින් සිදු කරන ලද පුරවැසි විද්‍යා ව්‍යාපෘතියේ සොයාගැනීම් සහිත සංක්ෂේපයක් අපගේ කණ්ඩායම 7 වැනි ජාත්‍යන්තර සමුද්‍ර සුන්බුන් සමුළුවේදී ප්‍රකාශයට පත් කළේය.

### ග්‍රීන් අයිල් සැබෑ ප්‍රගතිය පෙන්වයි!

වරක් වඳ වී ගොස් වඳවීමේ තර්ජනයට ලක්ව ඇතැයි සිතූ, *Crudia zeylanica* ශාක වන සත්ව සහ ස්වභාව ආරක්ෂණ සංගමයේ (WNPS) ග්‍රීන් අයිල් (Green Isle) හි රෝපණය කරන ලදී. ඊට අමතරව, මෙම භූමි ප්‍රදේශය බොහෝ පලතුරු පැල වලින් සමන්විත වන අතර වඳවී යාමේ තර්ජනයට ලක්ව ඇති කළු වඳුරන් සහ අනෙකුත් සත්ත්ව විශේෂ සඳහා සුදුසු වාසස්ථාන සැපයීමට අරමුණු කර ගත්තකි. මෙම තීරණාත්මක පරිසර පද්ධතියේ වඩා හොඳ සමතුලිතතාවය යථා තත්ත්වයට පත් කිරීම සඳහා වන සත්ව සහ ස්වභාව ආරක්ෂණ සංගමය (WNPS) වසර කිහිපයකට පෙර මෙම ව්‍යාපෘතිය භාර ගත්තේය. එතැන් පටන් ග්‍රීන් අයිල්, විශ්ව විද්‍යාල ශිෂ්‍යයින් සඳහා මෙන්ම පාසැල් ශිෂ්‍යයින් සඳහාද ක්ෂේත්‍ර අධ්‍යන, පර්යේෂණ සහ තෙත්බිම් චාරිකා සඳහා අපූරු තෝතැන්නක් විය. මෙම ග්‍රීන් අයිල් ව්‍යාපෘතිය සඳහා අබාන්ස් සහ එල්ජී යන ආයතන වල සහයෝගය ලැබෙයි.

### රැපිඩ් රෙස්පොන්ස් කණ්ඩායම හරහා නව මුලපිරීමක්

රැපිඩ් රෙස්පොන්ස් අනුකම්පුව සිරසි ටීවී සමඟ එක්ව පරිසරයට අදාළ විවිධ මාතෘකා යටතේ ළමා රූපවාහිනී වැඩසටහන් සඳහා පහසුකම් සලසයි. "නොදුටු ජීවය" නමින් මෙම රූපවාහිනී කතාමාලාව විකාශය වන්නේ Kids First වැඩසටහනෙනි.

මුලින් විකාශය වූ වැඩසටහන් මෙම සබැඳිය ඔස්සේ (https://www.youtube.com/c/KIDS1stsrilanka) නැරඹීමට හැකියාව ඇති අතර නව වැඩසටහන් සිරස ටීවී නාලිකාවේ සෑම සෙනසුරාදා දිනකම උදේ 7.00ට නැරඹිය හැක.

### අපේ වනාන්තර ජීවය ලබයි - නව ආගන්තුකයින් ROAR සමඟ එක්වෙයි!

ROAR (Reforestation Of A Rainforest), අපගේ පැරණිතම වන වගා ව්‍යාපෘතිවලින් එකක් වන අතර අඩි 10-15 වියනෙහි සාර්ථක වර්ධනයෙන් පසුව, මේවන විට විශ්මයජනක සොයාගැනීම් කිහිපයක් පෙන්වයි. අවට වනාන්තරයේ දක්නට ලැබෙන සමාන වෘක්ෂලතා සහිත මෙම ඛණ්ඩනය වූ විනාශ වූ වැසි වනාන්තර ප්‍රදේශය ප්‍රතිසංස්කරණය කිරීම අපගේ ව්‍යාපෘතියේ අරමුණ විය. ROAR කණ්ඩායම මේ වන විට එම භූමි භාගය තුළම ආවේණික සහ සුවිශේෂ විශේෂ බොහොමයක් සොයාගෙන ඇත. ඒ අතර ටොක් මැකාකියු, ශ්‍රී ලංකා වලිකුකුලා, ශ්‍රී ලංකා කොළ පරෙවියා, බට ඇටිකුකුලා, ශ්‍රී ලංකා අළු කෑදැත්තා, ශ්‍රී ලංකා රත් මූණත් කොට්ටෝරුවා, රන් නළල් කොට්ටෝරුවා, පිටරත් කෑරලා, ගිනිපිට පිළි කෑරලා, අලු ගිරවා, ශ්‍රී ලංකා වැහිලිහිණියා, හිස කලු කොණ්ඩයා වැනි සත්ත්ව විශේෂ අන්තර්ගත වේ.

සිවුරුහඹලන කටුස්සා, අං කටුස්සා, පිනුම් කටුස්සා, ඇහැටුල්ලා, නිදි මාපිලා, දාර රදනකයා සහ පහතරට මූකලන් තෙලිස්සා වැනි කටුසු සහ සර්ප විශේෂ මේ වන විට එම භූමිය ඔවුන්ගේ වාසස්ථානය බවට පත් කර ගෙන ඇත. සුලබ පඳුරු මැඩියා සහ සුලබ පහිඹු ගස් මැඩියන් වැනි උභයජීවින්ද මේ භූමියේ වාසය කරයි. මෙම සත්ත්ව විශේෂ සියල්ල ශ්‍රී ලංකාවට ආවේණික වන අතර ශ්‍රී ලංකා මහ කුරුලු පිය පැපිලියා (අපගේ විශාලතම සමනල විශේෂය) ඔහුගේ දීප්තිමත් කහ පැහැයෙන් අවට පරිසරය වඩාත් අලංකාර කරයි. තවත් බොහෝ සත්ත්ව විශේෂයන් ද වාර්තා වී ඇති අතර, එය නැවත වන වගාව සම්බන්ධයෙන් ව්‍යාපෘතියේ සාර්ථකත්වය ප්‍රබල ලෙස පෙන්නුම් කෙරෙනුයේ සම්පූර්ණ භූමියම කැකිල්ල ශාක වලින් ආවරණය වී පැවතී නිසාවෙනි. අනාගතයේදී මෙම භූමි භාගය









# ශ්‍රී ලංකා වනසත්ව හා ස්වභාව ආරක්ෂක සංගමය - වසරක මතක සටහන්...

තුළ ඇති ශාක හා සත්ත්ව විවිධත්වය තක්සේරු කිරීමට පර්යේෂණ ව්‍යාපෘති කිහිපයක් සැලසුම් කර ඇත.

### හේමාස් සමාගම සිය 2030 සමූහ පාරිසරික න්‍යාය පත්‍රය එළි දක්වයි: ශ්‍රී ලංකාවට ආවේණික සත්ත්ව විශේෂ ආරක්ෂා කිරීමට මෙයින් ප්‍රයත්න දරයි.

ඔවුන්ගේ පාරිසරික න්‍යාය පත්‍රයේ ප්‍රධාන මුලපිරීමක් ලෙස, හේමාස් හෝල්ඩිංග්ස් ශ්‍රී ලංකාවේ වඳවී යාමේ තර්ජනයට ලක්ව ඇති විශේෂ 50 කට අධික සංඛ්‍යාවක් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය මැදිහත්වීම් අවබෝධ කර ගැනීමට සහ ක්‍රියාත්මක කිරීමට වන සත්ව සහ ස්වභාව ආරක්ෂණ සංගමය (WNPS) සමඟ හවුල් වී ඇත. වගකිව යුතු ශ්‍රී ලාංකික සමාග මක් ලෙස ශ්‍රී ලංකාවට ආවේණික සම්පත් රැකගැනීම සහ ඒවා පිළිබඳ සැලකිලිමත් වීම ඔවුන්ගේ වගකීමක් බව දැඩි ලෙස විශ්වාස කරන හේමාස් සමූහය 'හරිත මෙහෙවර' නම් සිය 2030 සමූහ පාරිසරික න්‍යාය පත්‍රය මඟින් ලංකාවේ දැඩි ලෙස වඳවී යාමේ තර්ජනයට ලක්ව ඇති ආවේණික විශේෂයන් අවශ්‍ය පරිදි ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග සහ මැදිහත්වීම් සිදුකිරීමට සූදානම් දිගුකාලීන කැපවීමකි.

### හේමාස් ආවේණික විශේෂ ව්‍යාපෘතිය (Hemas Endemism Project)

ඔවුන්ගේ ප්‍රධාන උපායමාර්ගික මුලපිරීම් වලින් එක් උපායමාර්ගයක් ලෙස, 2022 මුල් භාගයේදී, හේමාස් සමූහය විසින් රට පුරා ආවේණික ශාක හා සත්ත්ව විශේෂ සංරක්ෂණය කිරීම සඳහා කුඩා ව්‍යාපෘති 25 කට අනුග්‍රහය දැක්වීය. ව්‍යාපෘති කිහිපයක යාවත්කාලීන තොරතුරු පහතින් දැක්වේ.

### බුලත් හපයා *(Pethia nigrofasciata)*

මෙම ව්‍යාපෘතිය මඟින් මූලික වශයෙන් අවධානය යොමු වූයේ බුලත් හපයා සංරක්ෂණය කිරීම සහ රුවන්පුර අධිවේගී මාර්ගය ඉදිකිරීම හේතුවෙන් තර්ජනයට ලක්ව ඇති මිරිදිය ආවේණික මත්ස්‍ය විශේෂ කිහිපයක් පරවිතොට ඉංගිරිය ප්‍රදේශයේ ආරක්ෂිත ඇළ මාර්ගයක් වෙත ගෙන යාමයි. මෙය තරුණ සත්වවේදීන්ගේ සංගමයේ (YZA) සහාය ඇතිව අවසන් කරන ලදී.

### විද්‍යා වැඩමුළුවකින් අනතුරුව ආවේණික ශාක හා සත්ව විශේෂ පිළිබඳ බිතු සිතුවමක් නිර්මාණය කිරීම

දික්හේන කනිෂ්ඨ විද්‍යාලය සිංහරාජ වැසි වනාන්තර රක්ෂිතයේ රූනකන්ද වනාන්තරය අසල පිහිටි ග්‍රාමීය පාසල්වලින් එකක් වන අතර වන සත්ව සහ ස්වභාව ආරක්ෂණ සංගමයේ (WNPS) ROAR වැඩසටහන සඳහා කේන්ද්‍රගත පාසලක් ද වේ. පහසුකම් අඩු වුවද පාසල් පරිශ්‍රය නිර්මාණය කර ඇත්තේ ස්වභාවධර්මය සමඟ සම්බන්ධ වීමටය. දැනුවත්භාවය වැඩි කිරීමට සහ ප්‍රදේශයේ වැදගත් ආවේණික ශාක හා සත්ත්ව විශේෂ විනාශ කිරීම අවම කිරීමට ගත් තවත් පියවරක් ලෙස, මහාචාර්ය සම්පත් සෙනෙවිරත්න ප්‍රමුඛ වන සත්ව සහ ස්වභාව ආරක්ෂණ සංගමයේ (WNPS) කණ්ඩායම පාසල් පුස්තකාලයේ එක් බිත්තියක ආවේණික ශාක හා සත්ත්ව විශේෂවල බිතු සිතුවමක් නිර්මාණය කිරීමට පහසුකම් සැලසීය.

තවද, කොළඹ විශ්වවිද්‍යාලයේ සිසුන් විසින් ආවේණික විශේෂවල වැදගත්කම පිළිබඳව වැඩමුළුවක් පවත්වනු ලැබිණි.

### වෙඩිඩතලතිව් වෙනුවෙන් කළ සටන: ඒකාබද්ධ මාධ්‍ය සමුළුව

**වෙඩිඩතලතිව්: ජලජීවී වගාව සඳහා ගැසට් නිවේදනයෙන් අවලංගු කිරීමට අවසර ලැබූ හා විනාශයට ගොදුරු වූ විශාලතම කඩොලාන තෙත්බිම**

සීමාසහිත පරිසර පදනම, පරිසර සංවිධාන සම්මේලනය, ලංකා එන්වයරමන්ට් ෆන්ඩ්, ලංකා නේචර් කන්සර්වේෂනිස්ට්ස් (ලංකා සොබාදහම් සංරක්ෂකයින්), ද පැරට්ෆිෂ් කලෙක්ටිව් සහ පර්ල් ප්‍රොටෙක්ටර්ස් යන සංවිධාන හතක සහයෝගීතාවයෙන් වන සත්ව සහ ස්වභාව ආරක්ෂණ සංගමය (WNPS) එක්ව දෙසැම්බර් 06 වන දින මෙම ගැසට් නිවේදන අවලංගු කිරීමේ ගැටලුව පිළිබඳ බණ්ඩාරණායක සම්මන්ත්‍රණ ශාලාවේදී ප්‍රධාන මාධ්‍ය සමුළුවක් සංවිධානය කළහ.

### වන සත්ව සහ ස්වභාව ආරක්ෂණ සංගමය (WNPS) විසින් ඉදිරිපත් කරන නීති සංක්ෂේපය

වන සත්ව සහ ස්වභාව ආරක්ෂණ සංගම් (WNPS) නීති කණ්ඩායම ස්වභාවික සම්පත් තවදුරටත් ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීම සඳහා උපකාරී වීමට ඔවුන්ගේ පළමු නීති සංක්ෂිප්තය සංවිධානය කළ අතර කථිකයා වූයේ ආචාර්ය ජගත් ගුණවර්ධන මහතාය. මෙම අවස්ථාව නීතිඥයින් සහ නීති සිසුන් සඳහා පමණක්ම වූ අතර, සංරක්ෂණයට පක්ෂපාතී නීතිමය පාර්ශ්වයන් මෙම සටනට එක්කර ගැනීම කණ්ඩායමේ අභිලාෂයන්හි කොටසක් විය.

### PLANT (භූමිය සහ සොබාදහම ආරක්ෂා කිරීම) වඩාත් ඵලදායි වෙමින් ප්‍රජාව අතරට

2020 අග භාගයේදී, වන සත්ව සහ ස්වභාව ආරක්ෂණ සංගමය (WNPS) විසින් සංරක්ෂණය සඳහා පුද්ගලිකව අයිති ඉඩම් අත්පත් කර ගැනීමට (සම්පූර්ණයෙන්ම හෝ දිගුකාලීන බදු පදනම මත) සහ ආයතනය හරහා අරමුදල් රැස් කිරීම සඳහා ලාභ නොලබන සමාගමක් ස්ථාපිත කරන ලදී. මෙම මුලපිරීම මේ වන විට විශාල ප්‍රගතියක් ලබා ඇති අතර සැප්තැම්බර් වන විට PLANT විසින් විවිධ ප්‍රදේශ වල අක්කර 200 කට අධික ප්‍රමාණයක් ආවරණය කර ඇත.









©Emerald Trails Map developed by WNPS and PLANT

PLANT යටතේ එමරල්ඩ් ට්‍රෙල්ස් මුලපිරීම (Emerald Trails Initiative) යනු ශ්‍රී ලංකාවේ සංරක්ෂිත බිම් කොටස්වල විවිධ භූගෝලීය පිහිටීම් ඇති සතුන් සඳහා අඛණ්ඩ සංචරනය සහ සම්බන්ධතා සහතික කිරීම සඳහා ආරක්ෂිත ස්වභාවික අවකාශයන් සහ වන පරිසර පද්ධතිවල බාධාවකින් තොර කොරිඩෝවක් නිර්මාණය කිරීමේ අපේක්ෂාවක් සහිත සැලැස්මකි. නුදුරු අනාගතයේ මෙම ගමනේදී නව ඉඩම් කිහිපයක් ගෙන ඒමට සහ නව හවුල්කරුවන් සම්බන්ධ කර ගැනීමට PLANT බලාපොරොත්තු වේ. ශක්තිමත් කලාපීය ව්‍යුහයක් මේවන විට ක්‍රියාත්මක වන අතර කණ්ඩායම් බොහෝ අංශ සම්බන්ධයෙන් වෙහෙස මහන්සි වී වැඩ කරති.



*Species - Polypedates cruciger*

This is an endemic species to Sri lanka belonging to the family of Rhacophoridae. It's mainly a insectivorous species which can be found in most parts of the island. It's known as Sri Lanka hourglass frog which is derived for the presence of Hourglass like markings on its dorsal side.

Image courtesy - Vimukthi R. Gunasekara

